# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2166/12 - 2020 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2020.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත**

42 (ඇ) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා මේ සමග පළකර ඇති ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වල වෙනස්වීම්, ආයතනය විසින් සම්මත කර ඇත. මෙම සංශෝධන වර්ෂ දෙදහස් දහනමයේ දෙසැම්බර් පහළොස් වන දින හෝ ඊට පසු ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක කළයුතුයි.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි;

**ප්‍රසන්න ලියනගේ,**
ලේකම්.

2020 මාර්තු 11 දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 A,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේදී.


1A - PG 5001 — 00 (2020/03)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2019 දෙසැම්බර් 15 වන දින හෝ ඉන් පසුව අවසන්වන මූල්‍ය කාලපරිච්ඡේද සඳහා බලපැවැත්වෙන ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වල වෙනස්වීම්**

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| **පාරිභාෂික ශබ්ද මාලාව** | | |
| *ගිණුම්කරණ ඇස්තමේන්තු* | නිරවද්‍ය මැනීමේ ක්‍රමයක් නොමැති විටක මූල්‍ය වටිනාකමක් ආසන්න වශයෙන් දැක්වීම. ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක් ඇතිවිට මෙන්ම ඇස්තමේන්තුව කිරීමක් අවශ්‍යකරන වෙනත් වටිනාකම් සඳහා සාධාරණ අගය මනින වටිනාකමක් සඳහා මෙම පදය භාවිතා කෙරේ. සාධාරණ අගයට මැනීම සම්බන්ධ ගිණුම්කරණ ඇස්තමේන්තු පමණක් ශ්‍රීලවිප්‍ර 540* අමතන අවස්ථාවලදී, "සාධාරන අගය ගිණුම්කරණ ඇස්තමේන්තු" යන පදය භාවිත කෙරේ.<br><br>* ශ්‍රීලවිප්‍ර 540, ~~සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු~~ *සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්* ~~*ඇතුළුව*~~ *ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය.* | නිරවද්‍ය මැනීමේ ක්‍රමයක් නොමැති විටක මූල්‍ය වටිනාකමක් ආසන්න වශයෙන් දැක්වීම. ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක් ඇතිවිට මෙන්ම ඇස්තමේන්තුව කිරීමක් අවශ්‍යකරන වෙනත් වටිනාකම් සඳහා සාධාරණ අගය මනින වටිනාකමක් සඳහා මෙම පදය භාවිතා කෙරේ. සාධාරණ අගයට මැනීම සම්බන්ධ ගිණුම්කරණ ඇස්තමේන්තු පමණක් ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත)* අමතන අවස්ථාවලදී, " සාධාරන අගය ගිණුම්කරණ ඇස්තමේන්තු" යන පදය භාවිත කෙරේ.<br><br>* ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත), *ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය.* |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 200 (ශ්‍රීලවිප්‍ර 200 - ස්වාධීන විගණනයේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත අනුකූලව විගණනයක් පවත්වාගෙන යාම)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දින හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| අ42 | ශ්‍රීලවිප්‍රයන් සාමාන්‍යයෙන් ආවේණික අවදානම සහ පාලන අවදානම ලෙස වෙන් වෙන්ව හඳුන්වන්නේ නැත. එහෙත් ඒ වෙනුවට හඳුන්වන්නේ " ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම්" හි සංයෝජිත තක්සේරුවක් ලෙසටය. කෙසේ වෙතත් වැඩි මනාපයක් ඇති විගණන ශිල්ප ක්‍රම හෝ ක්‍රමවේදයන් සහ ප්‍රායෝගික සැළකිල්ලට ගැනීම් මත රඳා පවතිමින් ආවේණික හා පාලන අවදානමෙහි තක්සේරු වෙන් වෙන්ව හෝ සංයෝජිතව විගණක සිදුකළ හැකිය. ~~ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් තක්සේරු කිරීම, ප්‍රතිශතයක් වැනි ලෙස ප්‍රමාණාත්මක භාෂිතයෙන් හෝ ප්‍රමාණාත්මක නොවන භාෂිතයෙන් ප්‍රකාශ කළ හැකිය.~~ ඒ කෙසේවෙතත්, ඔවුන් එය කුමන වෙනස් මාර්ග මගින් කළත් විගණකට ඊට වඩා වැදගත් වන්නේ උචිත අවදානම් තක්සේරු කිරීම සඳහා වන අවශ්‍යතාවය ය. | ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් තක්සේරු කිරීම, ප්‍රතිශතයක් වැනි ලෙස ප්‍රමාණාත්මක භාෂිතයෙන් හෝ ප්‍රමාණාත්මක නොවන භාෂිතයෙන් ප්‍රකාශ කළ හැකිය. ඒ කෙසේවෙතත්, ඔවුන් එය කුමන වෙනස් මාර්ග මගින් කළත් විගණකට ඊට වඩා වැදගත් වන්නේ උචිත අවදානම් තක්සේරු කිරීම සඳහා වන අවශ්‍යතාවය ය. ශ්‍රීලවිප්‍රයන් සාමාන්‍යයෙන් ආවේණික අවදානම සහ පාලන අවදානම ලෙස වෙන් වෙන්ව හඳුන්වන්නේ නැත. එහෙත් ඒ වෙනුවට හඳුන්වන්නේ " ප්‍රමාණාත්මක අවප්‍රකාශ-යක අවදානම්" හි සංයෝජිත තක්සේරුවක් ලෙසටය.<br><br>කෙසේ වෙතත් ශ්‍රීලවිප්‍ර 330** සමග අනුකූලව සැළසුම් මට්ටම් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා, සැලකිය යුතු අවදානම් ඇතුළුව ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් වලට ප්‍රතිචාර දැක්වීමට තවදුරටත් වන විගණන පටිපාටි |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | | සැළසුම් කිරීමට හා ඉටු කිරීමට පදනමක් ලබාගැනීමට ආවේණික අවදානම සහ පාලන අවදානමෙහි වෙන් වෙන්ව තක්සේරුවක් ශ්‍රීලවිප්‍ර 540* (සංශෝධිත) මගින් අවශ්‍ය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු හැර වැදගත් පන්තිවල ගනුදෙනුවල ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම සඳහා ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් තක්සේරු කිරීම සහ හඳුනාගැනීම තුළ, වැඩි මනාපයක් ඇති විගණන ශිල්පක්‍රම හෝ ක්‍රමවේදයන් සහ ප්‍රායෝගික සැළකිල්ලට ගැනීම් මත රඳා පවතිමින් ආවේණික හා පාලන අවදානම්හි තක්සේරු වෙන් වෙන්ව හෝ සංයෝජිතව විගණක සිදුකළ හැකිය.<br>*ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) *ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය,* 16 වන ඡේදය<br>**ශ්‍රීලවිප්‍ර 330, 7 (ආ) ඡේදය |
| අ48 පාද සටහන | ශ්‍රීලවිප්‍ර 540, ~~*සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු*~~ *සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්* ~~*ඇතුළුව*~~ *ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය* සහ ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත), *මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරීම සහ වාර්තාකරණය,* 12 වන ඡේදය | ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) *ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය* සහ ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත) *මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරීම සහ වාර්තාකරණය,* 12 වන ඡේදය |
| අ71 | ...<br>විගණනයක නිශ්චිත අංග සමග කටයුතු කරන ශ්‍රීලවිප්‍රයක් (උදාහරණ ලෙස, ශ්‍රීලවිප්‍ර 540) එම ශ්‍රීලවිප්‍රයේ විෂයයට සම්බන්ධව එහෙත් ඒවා නැවත, නැවත සිදු නොකර ශ්‍රීලවිප්‍ර 330 ට ව්‍යවහාර කිරීමට සහ ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) ලෙස, එවැනි ශ්‍රීලවිප්‍රයන්හි අවශ්‍යතාව-යන්ට සහ අරමුණු කෙසේ පුළුල් කළ හැකිද, ඒ අනුව, ශ්‍රීලවිප්‍ර 540 තුළ සඳහන් වන අරමුණු ඉෂ්ඨ කර ගැනීමේදී වෙනත් අදාළ ශ්‍රීලවිප්‍රයන්හි අරමුණු සහ අවශ්‍යතාවයන් විගණක සැළකිල්ලට ගෙන ඇත. | ...<br>විගණනයක නිශ්චිත අංග සමග කටයුතු කරන ශ්‍රීලවිප්‍රයක් (උදාහරණ ලෙස, ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) එම ශ්‍රීලවිප්‍රයේ විෂයට සම්බන්ධිත එහෙත් ඒවා නැවත, නැවත සිදු නොකර ශ්‍රීලවිප්‍ර 330 ට ව්‍යවහාර කිරීමට සහ ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) ලෙස, එවැනි ශ්‍රීලවිප්‍රයන්හි අවශ්‍යතාවයන්ට සහ අරමුණු කෙසේ පුළුල් කළ හැකිද, ඒ අනුව, ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) තුළ සඳහන් වන අරමුණු ඉෂ්ඨ කර ගැනීමේදී වෙනත් අදාළ ශ්‍රීලවිප්‍රයන්හි අරමුණු සහ අවශ්‍යතාවයන් විගණක සැළකිල්ලට ගෙන ඇත. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 210 (ශ්‍රීලවිප්‍ර 210 - විගණන කාර්යභාරවල කොන්දේසි සමග එකඟවීම)** | | |
| *පාද සටහන | ~~මෙම ප්‍රමිතියේ පිටු 1280 සිට 1361 දක්වා හඳුනාගත් සංශෝධනවලට අනුකූලව 2018 මාර්තු 31 දින හෝ ඉන් පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බලපැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 220 (ශ්‍රීලවිප්‍ර 220 - මූල්‍ය ප්‍රකාශ විගණනයක් සඳහා තත්ත්ව පාලනය)** | | |
| *පාද සටහන | ~~මෙම ප්‍රමිතියේ පිටු 1280 සිට 1361 දක්වා හඳුනාගත් සංශෝධනවලට අනුකූලව 2018 මාර්තු 31 දින හෝ ඉන් පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බලපැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 230 (ශ්‍රීලවිප්‍ර 230 - විගණන ලේඛනගත කිරීම)** | | |
| *පාද සටහන | ~~මෙම ප්‍රමිතියේ පිටු 1280 සිට 1361 දක්වා හඳුනාගත් සංශෝධනවලට අනුකූලව 2018 මාර්තු 31 දින හෝ ඉන් පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බලපැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| අ7 | • ...<br>• ...<br>o උදාහරණ ලෙස විගණකගේ වෘත්තීය සංශය දෘෂ්ඨිය ලේඛනගත කිරීමේ තනි ක්‍රමයක් නොතිබිය හැකිය. කෙසේ වෙතත් ශ්‍රීලවිප්‍ර සමග අනුකූලව, වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිතය පිළිබඳව විගණන ලේඛනගත කිරීමට විගණන සාක්ෂි ලබාදිය හැකිය. ~~එවැනි සාක්ෂිවලට ඇතුළත් විය හැක්කේ විගණකගේ විමසීම්වලට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර තහවුරු කෙරෙන නිශ්චිත ක්‍රියාපටිපාටි වේ.~~ | • ...<br>• ...<br>o උදාහරණ ලෙස විගණකගේ වෘත්තීය සංශය දෘෂ්ඨිය ලේඛනගත කිරීමේ තනි ක්‍රමයක් නොතිබිය හැකිය. කෙසේ වෙතත් ශ්‍රීලවිප්‍ර සමග අනුකූලව, වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිතය පිළිබඳව විගණන ලේඛනගත කිරීමට විගණක සාක්ෂි ලබාදිය හැකිය. උදාහරණ ලෙස, ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධිතව ලබාගත් විගණන සාක්ෂිවල කළමනාකාරිත්වයේ සැදහුම් තහවුරු කෙරෙන සහ පරස්පරවන යන දෙකම ඇතුළත් වනවිට, ලබාගත් විගණන සාක්ෂිවල ප්‍රමාණවත්භාවය සහ යෝග්‍යභාවය පිළිබඳ නිගමනයක් සකස් කිරීමේදී ගත් වෘත්තීය විනිශ්චය ඇතුළුව, එම සාක්ෂි විගණක අගය කළේ කෙසේද යන්න ලේඛනගත කිරීම. |
| අ10 | • ...<br>• ...<br>• පුද්ගලගත විනිශ්චය එහි ක්ෂේත්‍රවල සාධාරණත්වය මත විගණකගේ නිගමනය සඳහා පදනම ~~(උදාහරණ ලෙස සැලකිය යුතු අන්දමේ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය)~~ | • ...<br>• ...<br>• කළමනාකාරිත්වය විසින් ගත් පුද්ගලගත විනිශ්චය එහි ක්ෂේත්‍රවල සාධාරණත්වය මත විගණකගේ නිගමනය සඳහා පදනම<br>• අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක සම්බන්ධය තුළ, ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සාධාරණ ද හෝ අවප්‍රකාශ වී ඇත්ද යන්න පිළිබඳව විගණකගේ ඇගයීම සඳහා පදනම. |

| **විස්තරය** | **2017** | **2020** |
|---|---|---|
| **පරිශිෂ්ඨය** | • ශ්‍රීලවිප්‍ර 540 ~~සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු~~ සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය ~~23~~ ඡේදය | • ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය 39 ඡේදය |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 240 (ශ්‍රීලවිප්‍ර 240 - මූල්‍ය ප්‍රකාශ විගණනයකදී වංචා සලකා බැලීමට විගණකගේ වගකීම්)** | | |
| *පාද සටහන | ~~මෙම ප්‍රමිතියේ පිටු 1280 සිට 1361 දක්වා හඳුනාගත් සංශෝධනවලට අනුකූලව 2018 මාර්තු 31 දින හෝ ඉන් පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බලපැවැත් වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| අ47 | ශ්‍රීලවිප්‍ර 540~~*~~ මගින් එසේම අතීතයට බලපාන සමාලෝචනයක් අවශ්‍ය කෙරේ. එම සමාලෝචනය අවදානම තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටියක් ලෙස මෙහෙයවන්නේ ප්‍රතිඵලය පිළිබඳව විගණන සාක්ෂිවල ~~පූර්ව කාලපරිච්ඡේදවලට අදාළ ඇස්තමේන්තු ක්‍රියාවලිය~~ කළමනාකාරිත්වයේ සඵලදායකත්වය හෝ අදාළ වන අවස්ථාවල දී ප්‍රවර්තන කාලපරිච්ඡේදයෙන් පසුව සිදුවන යළි ඇස්තමේන්තු කිරීමේ ~~පූර්ව කාලපරිච්ඡේදවල ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම් වලට අදාළ සිදුකිරීම~~ සහ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම අවශ්‍ය විය හැකි ඇස්තමේන්තු කිරීමේ අනියතතා වැනි කරුණුවල විගණන සාක්ෂි සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමටය. ප්‍රායෝගික කරුණක් ලෙස කළමනාකාරිත්වයේ විනිශ්චයන්ගේ විගණකගේ සමාලෝචනය සහ මෙම ශ්‍රීලවිප්‍රය සමග අනුකූලව වංචාවක් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම නියෝජනය කළහැකි පක්ෂපාතීභාවයන් සඳහා වන උපකල්පන ශ්‍රීලවිප්‍ර 540 මගින් අවශ්‍යකරන සමාලෝචනය සමග සම්බන්ධව ක්‍රියාවට නැංවේ.<br><br>~~* ශ්‍රීලවිප්‍ර 540, සාධාරන අගය ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය 9 වන ඡේදය.~~ | ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) මගින් එසේම අතීතයට බලපාන සමාලෝචනයක් අවශ්‍ය කෙරේ. එම සමාලෝචනය අවදානම තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටියක් ලෙස මෙහෙයවන්නේ ප්‍රතිඵලය පිළිබඳ විගණන සාක්ෂිවල පෙර වූ ගිණුම්කරණ ඇස්තමේන්තු, වල කළමනාකාරිත්වයේ සඵලදායකත්වය හෝ අදාළ වන අවස්ථාවල දී ඒවායේ පසුව සිදුවන යළි ඇස්තමේන්තු කිරීම් ප්‍රවර්තන කාලපරිච්ඡේදය තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීමට සහාය වීමට සහ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීමට අවශ්‍ය විය හැකි ඇස්තමේන්තු කිරීම් අනියතතා වැනි කරුණුවල විගණන සාක්ෂි සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමටය. ප්‍රායෝගික කරුණක් ලෙස කළමනාකාරිත්වයේ විනිශ්චයන්ගේ විගණකගේ සමාලෝචනය සහ මෙම ශ්‍රීලවිප්‍රය සමග අනුකූලව වංචාවක් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම නියෝජනය කළහැකි පක්ෂපාතීභාවයන් සඳහා වන උපකල්පන ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) මගින් අවශ්‍යකරන සමාලෝචනය සමග සම්බන්ධව ක්‍රියාවට නැංවේ. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 250 (ශ්‍රීලවිප්‍ර 250 - මූල්‍ය ප්‍රකාශ විගණනයේ දී නීති සහ රෙගුලාසි සැළකිල්ලට ගැනීම)** | | |
| වෙනස්වීම් නැත. | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 260 (සංශෝධිත) (ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) - පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය)** | | |
| 7 | ~~සමහර අධිකරණ බලප්‍රදේශවල නීතිය~~ හෝ රෙගුලාසි, පාලනය පිළිබඳ වගකිව | නීතිය හෝ රෙගුලාසි පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සමහර කරුණු |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | යුතු අය සමග සමහර කරුණු විගණකගේ සන්නිවේදනය කිරීම සීමා කළ හැකිය. නීතිය හෝ රෙගුලාසි නිශ්චිතව සන්නිවේදනය තහනම් කළ හැකිය හෝ සත්‍ය හෝ සැකකරන නීතිවිරෝධී ක්‍රියාවට යෝග්‍ය අධිකාරියක් විසින් කරනු ලබන විමර්ශනයකට එය අගතියක් විය හැකි, වෙනත් ක්‍රියාමාර්ග හෝ අස්තිත්ත්වය සොදිසියෙන් නැබීම ඇතුළුව උදාහරණ ලෙස මුදල් විශුද්ධිකරණයට එරෙහිව වන නීති පැනවීමකට අනුව කෙරෙන යෝග්‍ය අධිකාරියක නීති හෝ රෙගුලාසි සමග හඳුනාගත් හෝ සැකකරන අනුකූල නොවීම් විගණක වාර්තා කිරීම අවශ්‍ය කරවීම. මෙම තත්ත්වයන් තුළ විගණක විසින් සැළකිල්ලට ගනු ලබන විනිශ්චයට පාදකවන කරුණු සංකීර්ණ විය හැකිය සහ විගණක නීති උපදෙස් එය ලබාගැනීම උචිතදැයි සලකා බැලිය හැක. | විගණකගේ සන්නිවේදනය සීමා කළ හැකිය. උදාහරණ ලෙස නීති හෝ රෙගුලාසි නිශ්චිතව සන්නිවේදනය තහනම් කළ හැකිය හෝ සත්‍ය හෝ සැකකරන නීතිවිරෝධී ක්‍රියාවකට යෝග්‍ය අධිකාරියක් විසින් කරනු ලබන විමර්ශනයකට අගතියක් විය හැකි වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීම තහනම් කළ හැකිය. සමහර තත්ත්වයන් තුළ විගණකගේ රහස්‍යභාවය පිළිබඳ බැඳීම් සහ සන්නිවේදනය කිරීමට වන බැඳියාවන් අතර විය හැකි ගැටීම් සංකීර්ණ විය හැකිය. එවැනි අවස්ථාවන්හිදී නීති උපදෙස් ලබාගැනීම විගණක සලකා බැලිය හැකි ය. |
| අ19 | මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු සාමාන්‍යයෙන් අස්තිත්ත්වය සඳහා ගිණුම්කරණ ඇස්තමේන්තු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම පිළිබඳ විනිශ්චයන් ගැනීමට ඉඩ දේ. උදාහරණ ලෙස සැලකිය යුතු අන්දමේ මැනීමේ අනියතතා සඳහා ඇති ගිණුම්කරණ ඇස්තමේන්තුවල අලුතෙන් මතුවන තත්ත්වයන් තුළ ප්‍රධාන උපකල්පන භාවිතා කිරීමට සම්බන්ධව මෙයට අමතරව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම තුළදී කළමනාකාරිත්වය විසින් ගත් වඩාත් අසීරු, පුද්ගලගත හෝ සංකීර්ණ විනිශ්චයන් පිළිබඳ පරිශීලකයන්ට අමතර තොරතුරු ලබාදීමට සහ "ඉතා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු" හෝ "වඩා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්" හඳුනාගැනීමට සහ යොමු කිරීමක් කිරීමට හෝ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හෙළිදරව් කිරීම්, නීතිය, රෙගුලාසි හෝ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවලින් අවශ්‍ය විය හැකි ය. | මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු සාමාන්‍යයෙන් අස්තිත්ත්වය සඳහා ගිණුම්කරණ ඇස්තමේන්තු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම පිළිබඳ විනිශ්චයන් ගැනීමට ඉඩ දේ. උදාහරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තුවල අලුතෙන් මතුවන තත්ත්වයන් තුළ උපකල්පන භාවිතා කිරීමට සම්බන්ධව මෙයට අමතරව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම තුළදී කළමනාකාරිත්වය විසින් ගත් වඩාත් අසීරු, පුද්ගලගත හෝ සංකීර්ණ විනිශ්චයන් පිළිබඳ පරිශීලකයන්ට අමතර තොරතුරු ලබාදීමට සහ "ඉතා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු" හෝ "වඩා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්" හඳුනාගැනීමට සහ යොමු කිරීමක් කිරීමට හෝ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හෙළිදරව් කිරීම්, නීතිය, රෙගුලාසි හෝ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවලින් අවශ්‍ය විය හැකි ය. |
| අ20 | ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශවල පුද්ගලගත අංග මත විගණකගේ දෘෂ්ඨිය විශේෂයෙන් අදාළ විය හැක්කේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා ඔවුන්ගේ වගකීම් ඉෂ්ඨ කිරීමේදී පාලනය පිළිබඳ වගකිව යුතු අය හටය. උදාහරණ ලෙස, අ19 ඡේදය තුළ විස්තර කළ කරුණු වලට සම්බන්ධිතව, පාලනය පිළිබඳව | ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශවල පුද්ගලගත අංග මත විගණකගේ දෘෂ්ඨිය විශේෂයෙන් අදාළ විය හැක්කේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා ඔවුන්ගේ වගකීම් ඉෂ්ඨ කිරීමේ දී පාලනය පිළිබඳ වගකිව යුතු අය හටය. උදාහරණ ලෙස, අ19 ඡේදය තුළ විස්තර කළ කරුණු වලට සම්බන්ධිතව, පාලනය පිළිබඳව |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | වගකිවයුතු අය උනන්දු විය හැක්කේ, ~~සැලකිය යුතු අන්දමේ අවදානම් වලට හේතු විය හැකි ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත අනියත-තාවයකට ඇස්තමේන්තුවේ~~ විගණකගේ ~~අගය කිරීමේ හෙළිදරව් කිරීමේ ප්‍රමාණ-වත්භාවය පිළිබඳවය~~. අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයන්හි සැලකිය යුතු අන්දමේ ගුණාත්මක අංග පිළිබඳ විවෘත සහ නිර්මාණාත්මක සන්නිවේදනය, සැලකිය යුතු ගිණුම්කරණ පරිචයන් සහ ~~හෙළිදරව් කිරීම් වල ගුණත්වය~~ පිළිගැනීම මත, මත පැවසීම ද එලෙසම ඇතුළත්විය හැකිය. මෙම සන්නිවේදනය තුළ ඇතුළත්විය හැකි කරුණු 2 වන පරිශිෂ්ඨය හඳුනාගනී. | වගකිවයුතු අය උනන්දු විය හැක්කේ, අදාළ මූල්‍ය ආකෘතිමය රාමුව සම්බන්ධය තුළ මූල්‍ය ප්‍රකාශවල කරුණු කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සාධාරණ ද යන්න පිළිබඳව විගණකගේ අගය කිරීම මෙන්ම සැලකිය යුතු අන්දමේ ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ දී භාවිත කළ උපකල්පන සහ දත්ත, ක්‍රම තෝරාගැනීමේ දී සහ ව්‍යවහාර කිරීමේ දී බලපෑ පුද්ගලගත හෝ වෙනත් ආවේණික අවදානම් සාධකයන්හි සංකීර්ණතාවයේ ප්‍රමාණය මත විගණකගේ දෘෂ්ඨිය අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයන්හි සැලකිය යුතු අන්දමේ ගුණාත්මක අංග පිළිබඳ විවෘත සහ නිර්මාණාත්මක සන්නිවේදනය, සැලකිය යුතු ගිණුම්කරණ පරිචයන් සහ හෙළිදරව් කිරීම්වල ගුණත්වය පිළිගැනීම මත, මත පැවසීම ද එලෙසම ඇතුළත්විය හැකිය. අදාළ වනවිට ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධ අස්ති-ත්ත්වයේ වැදගත් ගිණුම්කරණ පරිචයක්, අස්තිත්ත්වයේ විශේෂ අවස්ථාවකට, එය වඩාත්ම උචිත නොවිය හැකි බව විගණක විසින් සලකන විට මෙය ඇතුළත් විය යුතුද. උදාහරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී පිළිගත හැකි විකල්ප ක්‍රමයක් ඇතිවිට එය වඩා උචිත යයි විගණකගේ විනිශ්චය වනවිට මෙම සන්නිවේදනය තුළ ඇතුළත්විය හැකි කරුණු 2 වන පරිශිෂ්ඨය හඳුනා ගනී. |
| 1වන පරිශිෂ්ඨය | [අනුරූපී නැත] | • ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) *ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය* - 38 ඡේදය |
| 1වන පරිශිෂ්ඨය | ~~• ශ්‍රීලවිප්‍ර 610 (සංශෝධිත) *අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජ-නයට ගැනීම* 18 ඡේදය;~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| 2වන පරිශිෂ්ඨයේ ශීර්ෂය | **ගිණුම්කරණ ඇස්තමේන්තු**<br>~~• අයිතම සඳහා ඇස්තමේන්තු වැදගත්වන දෑ සඳහා ශ්‍රීලවිප්‍ර 540*, සාකච්ඡා කළ කරුණුවලට ඇතුළත්වනුයේ, උදාහරණ ලෙස,~~<br>~~o ගිණුම්කරණ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශතුළ හඳුනා-ගැනීමට හෝ හෙළිදරව් කිරීම සඳහා වන අවශ්‍යතාවයට ම හේතුවිය හැකි එම ගනුදෙනු, සිද්ධීන් සහ තත්ත්වයන්~~ | **ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්**<br>අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයන්ට සම්බන්ධ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධ හෙළිදරව් කිරීම්හි වැදගත් ගුණාත්මක අංගවලට සම්බන්ධයෙන් සන්නිවේදනයේදී විගණක සැළකිල්ලට ගත හැකි එම කරුණු ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ඨයේ ඇතුළත් වේ. |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | ~~කළමනාකාරිත්වය හඳුනා ගන්නේ කෙසේද?~~<br><br>~~o නව හෝ පවත්නා ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනය කිරීමට අවශ්‍ය වීමට හේතුවිය හැකි තත්ත්වයන් තුළ වෙනස්වීම්~~<br><br>~~o මූල්‍ය ප්‍රකාශ තුළ ඇති ගිණුම්කරණ ඇස්තමේන්තු පිළිගත යුතුද හෝ පිළිනොගත යුතුද යන්න පිළිබඳ කළමනාකාරිත්වය තීරණය අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලද~~<br><br>~~o ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා ක්‍රමයන් තුළ පූර්ව කාලපරිච්ඡේදයේ සිට වෙනස්වීමක් තිබුණේද හෝ වෙනසක් කළ යුතුව තිබුණේද සහ එසේනම් මක්නිසාද, එමෙන්ම පූර්වකාල පරිච්ඡේදවල ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිඵලය~~<br><br>~~o ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා තෝරාගත් මැනීමේ පදනම අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමග අනුකූලද යන්න ඇතුළුව. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකාරිත්වයේ ක්‍රියාවලිය (උදා: කළමනාකාරිත්වය ආකෘතියක් භාවිතාකර ඇති අවස්ථාවක).~~<br><br>~~o ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සංවර්ධනය කිරීමේදී කළමනාකාරිත්වය භාවිත කළ සැලකිය යුතු අන්දමේ උපකල්පන සාධාරණද,~~<br><br>~~o කළමනාකාරිත්වය විසින් භාවිත කළ සැලකිය යුතු අන්දමේ උපකල්පිතයන්හි සාධාරණත්වය අදාළ වන අවස්ථාවකදී හෝ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව යෝග්‍ය ව්‍යවහාර-කරණයේදී නිශ්චිත ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට කළමනා-කාරිත්වයේ අභිප්‍රාය සහ එසේ කිරීමට එහි හැකියාව.~~<br><br>~~o ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම්~~<br><br>~~o කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂපාතිභාවයේ හැඟවීම්.~~ | |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | ~~0 කළමනාකාරිත්වය විකල්ප උපකල්පන හෝ ප්‍රතිඵල සැළකිල්ලට ගන්නේ කෙසේද සහ එය ඒවා ප්‍රතික්ෂේප කරන්නේ කුමක් නිසාද කළමනාකාරිත්වය අන් වශයෙන් ඇස්තමේන්තු කිරීමේ අනියතතා ගිණුම්-කරණ ඇස්තමේන්තු කිරීමේදී අමතන්නේ කෙසේද.~~<br>~~0 මූල්‍ය ප්‍රකාශ තුළ ඇස්තමේන්තු කිරීමේ අනියතතා හෙළිදරව් කිරීමේ ප්‍රමාණවත් බව~~<br>~~* ශ්‍රීලවිප්‍ර~~ 540, ~~සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය~~ | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 265 (ශ්‍රීලවිප්‍ර 265 - අභ්‍යන්තර පාලනයේ ඌණතාවයන් පාලනය පිළිබඳ වගකිව යුතු අයට සහ කළමනාකාරිත්වයට සන්නිවේදනය කිරීම)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 300 (ශ්‍රීලවිප්‍ර 300 - මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැලසුම් කිරීම)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දින හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 315 (සංශෝධිත) (ශ්‍රීලවිප්‍ර 315) (සංශෝධිත) - අස්තිත්ත්වය සහ එහි පරිසරය අවබෝධකර ගැනීම මගින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දිනයෙන් හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 320 (ශ්‍රීලවිප්‍ර 320 - විගණනයක් සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී ප්‍රමාණාත්මකභාවය)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දිනයෙන් හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 330 (ශ්‍රීලවිප්‍ර 330 - තක්සේරු කළ අවදානම් වලට විගණකගේ ප්‍රතිචාර)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දිනයෙන් හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 402 (ශ්‍රීලවිප්‍ර 402 - සේවා ආයතනයක් භාවිත කරන අස්තිත්ත්වයකට සම්බන්ධ විගණන සැළකිල්ලට ගැනීම්)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 450 (ශ්‍රීලවිප්‍ර 450 - විගණනය තුළදී හඳුනාගත් අවප්‍රකාශ අගය කිරීම)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දිනයෙන් හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 500 (ශ්‍රීලවිප්‍ර 500 - විගණන සාක්ෂි)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දින හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| 5 (ඇ අ) | [අනුරූප නැත] | බාහිර තොරතුරු ප්‍රභව - මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම තුළ අස්තිත්වයන් විසින් බාහිර පුද්ගලයෙක් හෝ සංවිධානයන් ලබාදෙන එම තොරතුරු භාවිත කිරීම, හෝ එවැනි තොරතුරු පුළුල් පරාසයක පරිශීලකයන් විසින් භාවිත කිරීම සඳහා සුදුසු වනවිට, විගණක විසින් එය විගණන සාක්ෂි ලෙස එය ලබාගැනීම්. කළමනාකාරිත්වයේ විශේෂඥයෙකුගේ සේවා ආයතනයක්* හෝ විගණකගේ විශේෂඥයෙක්** ගේ තත්ත්වය වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයෙක් හෝ සංවිධානයක් තොරතුරු ලබා දුන්විට, එම පුද්ගලයා හෝ සංවිධානය එම විශේෂ තොරතුරු සම්බන්ධයෙන් බාහිර තොරතුරු ප්‍රභවයක් ලෙස නොසැලකේ. (යොමුව : අ1අ - අ1ඇ ඡේද)<br><br>* ශ්‍රීලවිප්‍ර 402, සේවා සංවිධානයක් භාවිතා කරන අස්තිත්ත්වයකට සම්බන්ධ විගණන සැළකිල්ලට ගැනීම 8 වන ඡේදය.<br><br>** *ශ්‍රීලවිප්‍ර 620 විගණකගේ විශේෂඥයාගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම,* 6 වන ඡේදය |
| 7 | විගණන ක්‍රියාපටිපාටි සැලසුම්කරණය සහ ඉටු කිරීමේදී, විගණන සාක්ෂි ලෙස භාවිත කිරීමට අදහස් කරන තොරතුරුවල අදාලත්වය සහ විශ්වසනීයත්වය විගණක සැළකිල්ලට ගත යුතුය. (යොමුව : අ26 ~~– අ33~~ ඡේද) | විගණන ක්‍රියාපටිපාටි සැලසුම්කරණය සහ ඉටු කිරීමේදී විගණන සාක්ෂි ලෙස භාවිත කිරීමට, බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරු ඇතුළත් තොරතුරුවල අදාළත්වය සහ විශ්වසනීයත්වය සැළකිල්ලට ගත යුතුය. (යොමුව : අ26 - අ33ඊ ඡේද) |
| අ1අ - අ1ඇ | [අනුරූපී නැත] | බාහිර තොරතුරු මූලාශ්‍ර (යොමුව : 5ඃඇඅ) ඡේදය |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | | අ1අ. බාහිර තොරතුරු මූලාශ්‍ර වලට ඇතුළත්විය හැක්කේ මිල නියම කිරීමේ සේවා, රාජ්‍ය සංවිධාන, මහ බැංකු, හෝ පිළිගත් කොටස් හුවමාරු. බාහිර තොරතුරු මූලාශ්‍ර වලින් ලබාගත හැකි වන තොරතුරු වල උදාහරණවලට ඇතුළත් වන්නේ:<br>• මිල ගණන් සහ මිල නියම කිරීම සම්බන්ධ දත්ත<br>• සාර්ව - ආර්ථික දත්ත ඓතිහාසික සහ පුරෝකථනය කළ සේවා වියුක්ති අනුපාතික සහ ආර්ථික වර්ධන අනුපාතිකයන් සංගණන දත්ත වැනි දෑ;<br>• ඓතිහාසික ණය වාර්තා<br>• කර්මාන්තය විශේෂිත දත්ත සමහර නිස්සාරණ කර්මාන්තවල ප්‍රතිසංස්කරණ පිරිවැය දර්ශකයක් ලෙස හෝ, විනෝදජනක කර්මාන්තවල ප්‍රචාරන අයභාරය නිර්ණය කිරීමට භාවිත කරන ශ්‍රේණිගත කිරීම් හෝ ප්‍රේක්ෂක සංඛ්‍යා තොරතුරු වැනි දේ සහ;<br>• ජීවිත රක්ෂණ සහ විශ්‍රාම අංශවල වගකීම් නිර්ණය කිරීමට මරණ අනුපාතික වගු.<br><br>අ1ආ විශේෂ තොරතුරු කට්ටලයක් පුළුල් පරාසයක පරිශීලකයන් විසින් භාවිත කිරීම සුදුසුවීම වඩා වැඩි විය හැකි නම්, එම තොරතුරු බාහිර පුද්ගලයෙක් හෝ සංවිධානයක් ප්‍රජාවට නොමිලේ ලබා දෙන්නේ නම් හෝ ගාස්තුවක් ගෙවීමෙන් පසු පුළුල් පරාසයක පරිශීලකයන් සඳහා ලබාගැනීම ඉඩ සලස්වන්නේ නම් ඕනෑම විශේෂ පරිශීලකයෙකුට එම තොරතුරු වලට කළ හැකි බලපෑම ඉතා අඩුවිය හැකිය. බාහිර තොරතුරු ප්‍රභවවලට බලපෑම් කිරීමට අස්තිත්ත්වයේ හැකියාව සැල-කිල්ලට ගෙන. තොරතුරු පුළුල් පරාසයක භාවිතකිරීම පරිශීලකයන් විසින් සඳහා සුදුසු ද යන්න නිර්ණය කිරීමට වෘත්තිය විනිශ්චය අවශ්‍ය විය හැකිය.<br><br>අ1ඇ යම් විශේෂ තොරතුරු කට්ටලයක් සම්බන්ධයෙන් බාහිර පුද්ගලයෙකුට හෝ සංවිධානයකට බාහිර තොරතුරු |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | | මූලාශ්‍රයක් ලෙස මෙන්ම සහ කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් හෝ සේවා සංවිධානයේ හෝ විගණකගේ විශේෂඥයෙක් යන කාර්ය දෙකම කළ නොහැකිය.<br><br>අ1ඇ කෙසේ වෙතත් බාහිර පුද්ගලයෙක් සංවිධානයක් උදාහරණ ලෙස, විශේෂ තොරතුරු කට්ටලයක් ලබාදෙනවිට කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් ලෙස කටයුතු කළ හැකිය. එහෙත් වෙනස් තොරතුරු කට්ටලයක් ලබාදෙන විට බාහිර තොරතුරු මූලාශ්‍රයක් ලෙස කටයුතු කළ හැකිය. සමහර තත්ත්වයන්හිදී, විශේෂ තොරතුරු කට්ටලයකට සම්බන්ධයෙන් බාහිර පුද්ගලයෙක් හෝ සංවිධානයක් කටයුතු කරන්නේ බාහිර තොරතුරු මූලාශ්‍රයක් ලෙස ද හෝ කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් ලෙස ද යන්න නිර්ණය කිරීමට වෘත්තිය විනිශ්චය අවශ්‍ය විය හැකිය. වෙනත් තත්ත්වයන් තුළදී වෙන්කොට හඳුනාගැනීම පැහැදිලිය. උදාහරණ ලෙසඃ<br><br>• පුළුල් පරාසයක පරිශීලකයන්ගේ භාවිතය සඳහා සුදුසු නිශ්චල දේපළ මිළ ගණන් පිළිබඳ තොරතුරු බාහිර පුද්ගලයෙක් හෝ සංවිධානයක් ලබාදිය හැකිය; උදාහරණ ලෙස, ලබාදී ඇති තොරතුරු සාමාන්‍යයෙන් අදාළ වන්නේ භූගෝලීය ප්‍රදේශයකට සහ එම තොරතුරු කට්ටලය සම්බන්ධ මිළ ගණන් නිර්ණය කරනු ලැබිය හැක්කේ බාහිර තොරතුරු මූලාශ්‍රයක් වේ. එම බාහිර සංවිධානය විසින් කළමනාකාරිත්වයේ හෝ විගණකගේ විශේෂඥයා ලෙසටත් කටයුතු කරමින් අස්තිත්ත්වයේ කරුණු සහ තත්ත්වයනට විශේෂිතවන සුදුසු පරිදි සකස් කළ අස්තිත්ත්වයේ නිශ්චල, දේපළ කළඹ සම්බන්ධයෙන් බලයලත් තක්සේරු වාර්තා ලබාදීමේ කටයුත්ත ද කළ හැකිය.<br><br>• සමහර ආයු ගණක සංවිධාන මරණ අනුපාතික වක්‍ර පොදු භාවිතය සඳහා ප්‍රකාශයට පත් කරනු ලබන අතර, එම වක්‍ර අස්තිත්ත්වයන් විසින් භාවිත කරනවිට |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | | එය සාමාන්‍යයෙන් බාහිර තොරතුරු මූලාශ්‍රයකින් වූ තොරතුරක් සේ සලකනු ලැබිය හැකිය. අස්තිත්ත්වයේ විශ්‍රාම වැටුප් සැලසුම් ගණනාවක විශ්‍රාම වැටුප් වගකීම නිර්ණය කිරීමට අස්තිත්ත්වයේ කළමනාකාරිත්වයට උපකාරීවීමට විශේෂිත තත්ත්වයන්ට සුදුසු පරිදි වෙනස් තොරතුරු සම්බන්ධයෙන් එම ආයුගණක සංවිධානයම කළමනාකාරිත්වයේ විශේෂඥයා විය හැකිය.<br><br>• නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළක් නොමැති සුරැකුම්පත් සඳහා සාධාරණ අගය ඇස්තමේන්තු කිරීමට බාහිර පුද්ගලයෙක් හෝ සංවිධානයකට ආදර්ශ යෙදුම් කළ හැකි විශේෂඥ ඥාණය සතු විය හැකිය. විශේෂිතව අස්තිත්ත්වයක් සඳහා ඇස්තමේ-න්තුවක් කිරීම සඳහා එම බාහිර පුද්ගලයාගේ හෝ සංවිධානයේ විශේෂඥ ඥාණය අස්තිත්ත්වය යොදවා ගන්නේ නම් එසේ ලබාගත් තොරතුරු එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සඳහා කළමනාකාරිත්වය භාවිත කරන විට එම තොරතුරු සම්බන්ධයෙන් එම පුද්ගලයා හෝ සංවිධානයේ කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් විය හැකිය. අනෙක් අතට එම බාහිර පුද්ගලයා හෝ ආයතනය, පුද්ගලික ගනුදෙනු සම්බන්ධයෙන් මිල ගණන් හෝ මිල නියම කිරීම සම්බන්ධිත දත්ත පොදු ප්‍රජාව සඳහා යන්තමින් ලබා දෙන්නේ නම්, සහ අස්තිත්ත්වය ඔවුන්ගේ ස්වකීය ඇස්තමේන්තු කරන ක්‍රම සඳහා එම තොරතුරු භාවිත කරනවිට එවැනි තොරතුරුවලට සම්බන්ධයෙන් බාහිර පුද්ගලයා හෝ ආයතනය, බාහිර තොරතුරු මූලාශ්‍රයක් විය හැකිය.<br><br>• කර්මාන්තයක් තුළ පවත්නා තත්ත්වයන් හෝ අවදානම් පිළිබඳ, පුළුල් පරාසයක පරිශීලකයන් සඳහා සුදුසු තොරතුරු බාහිර පුද්ගලයෙක් හෝ ආයතනයක් ප්‍රකාශයට පත් කළ හැකිය. අස්තිත්ත්වයක් එහි අවදානම් හෙළිදරව් කිරීම් (උදාහරණ |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | | ලෙස ශ්‍රීලගිප්‍ර 7* සමග අනුකූලව) එම තොරතුරු භාවිත කළහොත්, එවැනි තොරතුරු සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලැබූ තොරතුරු ලෙසය. කෙසේ වෙතත් ඒ හා සමාන වර්ගයේ තොරතුරු, විශේෂිතව අස්තිත්ත්වයේ තත්ත්වයට සුදුසු පරිදි එම අවදානම් පිළිබඳ තොරතුරු සංවර්ධනය කිරීමට අස්තිත්ත්වයේ විශේෂඥයා භාවිතා කිරීමට අස්තිත්ත්වය විසින් බලය පැවරුවහොත්, බාහිර පුද්ගලයා හෝ ආයතනය කළමනාකාරිත්වයක් වෙනුවෙන් කටයුතු කරන බව පෙනීයයි.<br><br>• බාහිර පුද්ගලයෙක් හෝ ආයතනයක් එහි විශේෂඥ ඥාණය වර්තමාන සහ අනාගත වෙළඳපොළ උපනතිවල තොරතුරු ලබාදීම සඳහා යොදවා එය පුළුල් පරාසයක පරිශීලකයන්ට සුදුසු සහ ඔවුන්ගේ භාවිතය සඳහා ලබාදෙයි. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී භාවිත කළ යුතු උපකල්පන පිළිබඳ තීරණ ගැනීමට උපකාරීවීමට එම තොරතුරු අස්තිත්ත්වය විසින් භාවිත කළහොත්, එවැනි තොරතුරු බාහිර මූලාශ්‍රයකින් ලැබූ තොරතුරු ලෙස සැළකිය හැකිය. අස්තිත්ත්වයට විශේෂිත කරුණු සහ තත්ත්වයන්ට අදාළ වර්තමාන සහ අනාගත උපනති ඇමතීමට ඒ හා සමාන වර්ගයේ තොරතුරු සඳහා අස්තිත්ත්වය විසින් බලය පැවරුවහොත් එම බාහිර පුද්ගලයා හෝ ආයතනය කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් ලෙස කටයුතු කරන බව පෙනී යයි.<br><br>* ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - ශ්‍රීලගිප්‍ර 7, මූල්‍ය සාධන පත්‍රඃ හෙළිදරව් කිරීම් |
| අ1 | විගණකගේ මතය සහ වාර්තාවට සහායවීමට විගණන සාක්ෂි අවශ්‍ය වේ. එය ස්වභාවයෙන් සමුච්චිත වන අතර මූලිකව ලබාගන්නේ විගණන ක්‍රියාවලිය තුළ ඉටු කරන විගණන ක්‍රියාපටිපාටිවලිනි. කෙසේ වෙතත් පෙර | විගණකගේ මතය සහ වාර්තාවට සහායවීමට විගණන සාක්ෂි අවශ්‍ය වේ. එය ස්වභාවයෙන් සමුච්චිත වන අතර මූලිකව ලබාගන්නේ විගණන ක්‍රියාවලිය තුළ ඉටු කරන විගණන ක්‍රියාපටිපාටිවලිනි. කෙසේ වෙතත් පෙර වූ විගණන |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | වූ විගණන (ප්‍රවර්තන විගණනයේ එහි අදාළත්වයට බලපෑ හැකි පෙර වූ විගණනයේ සිට වෙනස්වීම් සිදුවී ඇති ඇත්දැයි විගණක නිර්ණය කර ඇත්නම්) හෝ සේවාදායකයන්ගේ පිළිගැනීම සහ පවත්වාගෙන යාම සඳහා සමාගමේ තත්ත්ව පාලන ක්‍රියාපටිපාටි වැනි වෙනත් මූලාශ්‍ර වලින් ලබා ගන්නා තොරතුරු එලෙසම ඇතුළත් විය හැකිය. ~~අස්තිත්ත්වයට අභ්‍යන්තර සහ බාහිර වෙනත් මූලාශ්‍රවලට අමතරව~~ අස්තිත්ත්වයේ ගිණුම්කරණ වාර්තා වැදගත් විගණන සාක්ෂි ~~මූලාශ්‍රයකි. එසේම~~ විගණක සාක්ෂි ලෙස භාවිත කළ හැකි ~~තොරතුරු~~ කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ වැඩ ප්‍රයෝජනයට ගනිමින් පිළියෙළ කළ හැකිය. කළමනාකාරිත්වයේ සැදහුම්-වලට සහායවන සහ තහවුරු කෙරෙන සහ එවැනි සැදහුමක් පරස්පර වන යම් තොරතුරක් යන තොරතුරු යන දෙකෙන්ම විගණන සාක්ෂි සමන්විත වේ. ඊට අමතරව, සමහර සිද්ධින්හීදී තොරතුරු නොමැති විට (උදාහරණ ලෙස, ඉල්ලන ලද නියෝජනය වීම ලබාදීම කළමනාකාරිත්වය ප්‍රතික්ෂේප කිරීම විගණක විසින් භාවිතා කිරීම සහ ඒ අනුව, විගණන සාක්ෂියක් ස්ථාපිත වේ.<br><br>~~*ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) 9 වන ඡේදය~~ | (ප්‍රවර්තන විගණනයට* එහි අදාළත්වයට බලපෑ හැකි පෙර වූ විගණනයේ සිට වෙනස්වීම් සිදුවීඇති ඇත්දැයි විගණක නිර්ණය කර ඇත්නම්) හෝ සේවාදායකයන්ගේ පිළිගැනීම සහ පවත්වාගෙන යාම සඳහා සමාගමේ තත්ත්ව පාලන ක්‍රියාපටිපාටි වැනි වෙනත් මූලාශ්‍ර වලින් ලබා ගන්නා තොරතුරු එලෙසම ඇතුළත් විය හැකිය. අස්තිත්ත්වයේ ගිණුම්කරණ වාර්තා තුළ සහ අස්තිත්ත්වය අභ්‍යන්තර වෙනත් මූලාශ්‍ර වැදගත් විගණන සාක්ෂි මූලාශ්‍රයකි. විගණන සාක්ෂි ලෙස භාවිත කළ හැකි තොරතුරු කළමනාකාරිත්වයේ විශේෂඥයෙකුගේ වැඩ භාවිත කර පිළියෙළ කළ ඒවා හෝ බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් ඒවා විය හැකිය. කළමනාකාරිත්වයේ සැදහුම්වලට සහායවන සහ තහවුරු කෙරෙන සහ එවැනි සැදහුමක් පරස්පර වන යම් තොරතුරක් යන තොරතුරු යන දෙකෙන්ම විගණන සාක්ෂි සමන්විත වේ. ඊට අමතරව, සමහර සිද්ධින්හීදී තොරතුරු නොමැති විට (උදාහරණ ලෙස, ඉල්ලන ලද නියෝජනය වීම ලබාදීම කළමනා-කාරිත්වය ප්‍රතික්ෂේප කිරීම, විගණක විසින් භාවිතා කිරීම) සහ ඒ අනුව, විගණන සාක්ෂියක් ස්ථාපිත වේ.<br><br>*ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) 9 වන ඡේදය |
| අ9 | අස්තිත්ත්වයෙන් ස්වාධීන මූලාශ්‍ර වලින් ලැබෙන තොරතුරු, එනම් විගණක විගණන සාක්ෂි ලෙස භාවිත කිරීමට ඇතුළත් විය හැක්කේ තුන්වන පාර්ශ්වයන්ගෙන් ලැබෙන සනාථ කිරීම්, විශ්ලේෂකයන්ගේ වාර්තා සහ තරගකරුවන් පිළිබඳ සන්සන්දනය කිරීමේ දත්ත. (දත්ත පිල් ලකුණු කිරීම) | අස්තිත්ත්වයෙන් ස්වාධීන මූලාශ්‍රවලින් ලැබෙන තොරතුරු, විගණක විගණන සාක්ෂි ලෙස භාවිත කිරීමට ඇතුළත් විය හැක්කේ තුන්වන පාර්ශ්වයන්ගෙන් ලැබෙන සනාථ කිරීම් සහ විශ්ලේෂකයන්ගේ වාර්තා සහ තරගකරුවන් පිළිබඳ සන්සන්දනය කිරීමේ දත්ත ඇතුළුව (දත්ත පිල් ලකුණු කිරීම) බාහිර පාර්ශ්ව වලින් ලැබෙන තොරතුරුය. |
| අ31 | තොරතුරුවල විශ්වාසදායකත්වයම විගණන සාක්ෂි ලෙස භාවිත කළ හැකිය. සහ එබැවින් අදාළවන අවස්ථාවන්හිදී ඒවායේ පිළියෙළ කිරීම පවත්වාගෙන යාම මත පාලන ඇතුළුව ඒවායේ ස්වභාවය සහ ඒවායේ මූලාශ්‍රය සහ එය ලබාගත්තේ කුමන තත්ත්වයන් මත ද මගින් විගණන සාක්ෂිවලට බලපෑම් කෙරේ. එබැවින්, විවිධ ආකාරයේ විගණන සාක්ෂිවල විශ්වාස දායකත්වය පිළිබඳ සාධාරණීයකරණය වැදගත් ව්‍යතිරේඛවලට යටත් වේ. විගණන සාක්ෂි ලෙස භාවිත කළ යුතු තොරතුරු ලබාගන්නේ අස්තිත්ත්වයට බාහිර මූලාශ්‍රවලින් වනවිට පවා එහි | තොරතුරුවල විශ්වාසදායකත්වයම විගණන සාක්ෂි ලෙස භාවිත කළ හැකිය. සහ එබැවින් අදාළවන අවස්ථාවන්හිදී ඒවායේ පිළියෙළ කිරීම පවත්වාගෙන යාම මත පාලන ඇතුළුව ඒවායේ ස්වභාවය සහ ඒවායේ මූලාශ්‍රය සහ එය ලබාගත්තේ කුමන තත්ත්වයන් මත ද මගින් විගණන සාක්ෂිවලට බලපෑම් කෙරේ. එබැවින්, විවිධ ආකාරයේ විගණන සාක්ෂිවල විශ්වාස දායකත්වය පිළිබඳ සාධාරණීයකරණය වැදගත් ව්‍යතිරේඛවලට යටත් වේ. විගණන සාක්ෂි ලෙස භාවිත කළ යුතු තොරතුරු ලබාගන්නේ අස්තිත්ත්වයට බාහිර මූලාශ්‍රවලින් වනවිට පවා එහි |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | විශ්වාසදායකත්වයට බලපෑ හැකි තත්ත්වයන් පැවතිය හැකිය. උදාහරණ ලෙස මූලාශ්‍රය පිළිබඳව දැනුමක් නොමැති නම් හෝ කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ අරමුණුගතභාවය අඩු වේනම් ස්වාධීන ~~බාහිර මූලාශ්‍රයකින්~~ ලබාගන්නා තොරතුරු විශ්වාසදායක නොවිය හැකිය. එම ව්‍යතිරේක පැවතිය හැකි බව හඳුනා ගනිමින්, විගණන සාක්ෂිවල විශ්වාසනීයත්වය පිළිබඳ පහතවන සාධාරණීයකරණය ප්‍රයෝජ-නවත් විය හැකියඃ | විශ්වාසදායකත්වයට බලපෑ හැකි තත්ත්වයන් පැවතිය හැකිය. උදාහරණ ලෙස මූලාශ්‍රය පිළිබඳව දැනුමක් නොමැති නම් හෝ කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ අරමුණුගතභාවය අඩු වේනම් අස්තිත්ත්වයෙන් ස්වාධීන මූලාශ්‍රයකින් ලබාගන්නා තොරතුරු විශ්වාසදායක නොවිය හැකිය. එම ව්‍යතිරේක පැවතිය හැකි බව හඳුනා ගනිමින්, විගණන සාක්ෂිවල විශ්වාසනීයත්වය පිළිබඳ පහතවන සාධාරණීයකරණය ප්‍රයෝජනවත් විය හැකියඃ |
| අ33අ - අ33ඊ | [අනුරූප නැත] | *බාහිර තොරතුරු මූලාශ්‍ර*<br><br>අ33අ විගණන සාක්ෂි ලෙස භාවිත කිරීමට, බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සඳහා අස්තිත්ත්වය විසින් එම තොරතුරු භාවිත කළේද හෝ ලබාගත්තේද යන්න විගණක ද නොසලකා, එම තොරතුරුවල අදාළත්වය සහ විශ්වසනීයත්වය සැළකිල්ලට ගැනීමට 7 වන ඡේදය මගින් විගණකට අවශ්‍ය කෙරේ. බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරු සඳහා, එම සැළකිල්ලට ගැනීමට සමහර අවස්ථාවලදී, ශ්‍රීලවිප්‍ර 330 හෝ, අදාළ වන පරිදි ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත)* සමග අනුකූලව තවදුරටත් විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කරමින් සහ ඉටු කිරීම මගින් ලබාගත්, බාහිර තොරතුරු මූලාශ්‍රයක් විසින් තොරතුරු පිළියෙළ කිරීම හෝ බාහිර තොරතුරු මූලාශ්‍ර පිළිබඳ විගණන සාක්ෂි ඇතුළත් විය හැකිය.<br><br>* ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත), ගිණුම්කරණ ඇස්තමේන්තු සහ හෙළිදරව් විගණනය කිරීම්.<br><br>අ33ආ කළමනාකාරිත්වය හෝ අදාළ වන විට කළමනාකාරිත්වයේ විශේෂඥයා බාහිර තොරතුරු මූලාශ්‍රයක් භාවිත කරන්නේ කුමක් නිසාද යන්න පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සහ තොරතුරුවල අදාළත්වය සහ විශ්වාසදායකත්වය සැළකිල්ලට ගන්නේ (එහි නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය ඇතුළුව) කෙසේද යන්න එම තොරතුරුවල අදාළත්වය සහ විශ්වාසදාය- |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | | කත්වයේ විගණකගේ සැළකිල්ලට ගැනීමේ දී දැන්වීමට උපකාරි විය හැකිය.<br><br>අ33ඇ මුල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම තුළ දී කළමනාකාරිත්වය විසින් තොරතුරු භාවිත කරනවිට, මෙම සාධකවලින් කිහිපයක් පමණක් අදාළ විය හැකි බව සැළකිල්ලට ගෙන, ඒවායේ නිරවද්‍යතාවය සම්පූර්ණත්වය ඇතුළුව බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරුවල අදාළත්වය සහ විශ්වාසදායකත්වය සැළකිල්ලට ගැනීමේ දී පහත සඳහන් සාධක වැදගත් විය හැකියඃ<br><br>• බාහිර තොරතුරු මූලාශ්‍රයේ ස්වභාවය සහ අධිකාරිය උදාහරණ ලෙස, සමහර වර්ගවල තොරතුරු සඳහා අධිකාරිය විය හැක්කේ, කර්මාන්තයක තොරතුරු පොදු ප්‍රජාවට ලබාදීමට ව්‍යවස්ථාදායක විධානයක් සහිත රජයේ සංඛ්‍යා ලේඛණ කාර්යාලය හෝ මහ බැංකුවක්;<br><br>• අස්තිත්ත්වය සහ තොරතුරු මූලාශ්‍රය අතර සම්බන්ධතාවය මගින් ලබාගත් තොරතුරු වලට බලපෑම් කිරීමේ හැකියාවන්;<br><br>• විශ්වාසදායක තොරතුරු ලබාදීමේ ගති නිරීක්ෂණ වාර්තාවන් ඇති මූලාශ්‍රයක් මගින් තොරතුරු චර්යා රටාවකට ලබාදෙන්නේ ද යන විගණකගේ විනිශ්චය ඇතුළුව තොරතුරුවලට සම්බන්ධ-යෙන් බාහිර තොරතුරු මූලාශ්‍රයේ හැකියාව සහ කීර්තිමත්භාවය;<br><br>• බාහිර තොරතුරු මූලාශ්‍රය විසින් ලබා දී ඇති තොරතුරුවල විශ්වාසදාය-කත්වය සමග විගණකගේ අතීත අත්දැකීම්;<br><br>• කළමනාකාරීත්වය හෝ විගණක විසින් භාවිතාකළ ඒ හා සමාන අරමුණක් සඳහා බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරු වල අදාළත්වය සහ හෝ විශ්වාසදායකත්වය පරිශීලක-යන්ට අනුව පොදු වෙළඳපොළ පිළිගැනීමේ සාක්ෂි;<br><br>• ලබාගත් සහ භාවිතා කළ තොරතුරුවල අදාළත්වය සහ |

| විස්තරය | 2017 | 2020 |
| --- | --- | --- |
| | | විශ්වාසදායකත්ව ඇගයීමට පාලන අස්තිත්ත්වය පිහිටුවා ඇත්ද;<br>• බාහිර තොරතුරු මූලාශ්‍රය සමස්ථ වෙළඳපොළ තොරතුරු සමාහරණය කරන්නේද හෝ වෙළඳපොළ ගනුදෙනු සෘජු "ඇතුල් කිරීමේ" නිරත වන්නේද;<br>• භාවිතා කරනු ලබන තොරතුරු භාවිතා කරන ආකෘතිය සඳහා සුදුසු ද, සහ අදාළ වන්නේ නම් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සැළකිල්ලට ගෙන සංවර්ධනය කළේද;<br>• භාවිතකළ තොරතුරු පරස්පර වියහැකි විකල්ප තොරතුරු;<br>• ලබාගත් තොරතුරුවලට සම්බන්ධිත ප්‍රතික්ෂේප කිරීමේ හෝ වෙනත් සීමාකාරී බස් වහරේ ස්වභාවය සහ ප්‍රමාණය;<br>• තොරතුරු පිළියෙළ කිරීමේ දී භාවිත කළ ක්‍රම, ක්‍රම යෙදුම කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ තොරතුරු ඇතුළත්ව, අදාළවන අවස්ථාවලදී, එවැනි යෙදුම තුළ ආදර්ශ භාවිත කළේද සහ ක්‍රම මත පාලන; සහ<br>• ලබාගත හැකිවිට, ලබාගත් තොරතුරු සංවර්ධනය කිරීම කළ බාහිර තොරතුරු මූලාශ්‍ර මගින් ව්‍යවහාර කළ උපකල්පන සහ වෙනත් දත්තවල යෝග්‍යභාවය සැල-කිල්ලට ගැනීමට අදාළ තොරතුරු.<br>අ33ඇ සැදහුම් මට්ටමේ දී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම්වලට බාහිර තොරතුරු භාවිතය අදාළ ද, ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් සඳහා හේතුවීමට එම තොරතුරු භාවිතය අදාළ වන ප්‍රමාණය සහ බාහිර තොරතුරු මූලාශ්‍රයෙන් ලැබූ එම තොරතුරු විශ්වාසදායක විය නොහැකි බව (උදාහරණ ලෙස එය ලැබුනේ කීර්තිමත් ප්‍රභවයකින් ද) ඒවායේ ස්වභාවය සහ ප්‍රමාණය විගණකගේ සැලකිල්ලෙන් සිතා බැලීමේ දී සැළකිල්ලට ගැනේ. අ34අ ඡේදය තුළ විස්තර කළ කරුණු විගණකගේ සැළකිල්ලට |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | | ගැනීම මත පදනම්ව බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලැබූ තොරතුරු භාවිත කිරීමට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම්වලට ප්‍රතිචාර දැක්වීමට පවතින තත්ත්වයන් තුළ යෝග්‍ය වන අදාළ වනවිට, එහි අභ්‍යන්තර පාලනය ඇතුළුව අස්තිත්ත්වය සහ එහි පරිසරයේ තවදුරටත් වන අවබෝධය ශ්‍රීලවිප්‍ර 315 සමග අනුකූලව අවශ්‍ය කරන බව හෝ ශ්‍රීලවිප්‍ර 330* සහ ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත)** සමග අනුකූලව තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි විගණක නිර්ණය කළ හැකිය. එවැනි ක්‍රියාපටිපාටිවලට ඇතුළත් විය හැක්කේ:<br>• බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරු විකල්ප ස්වාධීන තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරු සමග සන්සන්දනය කිරීමක් ඉටු කිරීම.<br>• බාහිර තොරතුරු මූලාශ්‍රයක් කළමනාකාරිත්වය භාවිතයේ දී සැලකිල්ලට ගැනීමට අදාළ වනවිට, බාහිර තොරතුරු මූලාශ්‍ර වලින් වන තොරතුරුවල විශ්වාසදායකත්වය සැල-කිල්ලට ගැනීමට අස්තිත්-ත්වය පිහිටුවා ඇති පාලනයන් හි සහ එවැනි පාලනයන් හි මෙහෙයුම් සඵලදායිතාවය භව්‍ය ලෙස පරීක්ෂා කිරීම පිළිබඳ අවබෝධයක් ලබාගැනීම.<br>• එහි ක්‍රියාවලි, ශිල්පක්‍රම සහ උපකල්පන අවබෝධ කරගැනීමට සහ හඳුනා ගැනීමේ දී සහ අවබෝධ කරගැනීමේ අරමුණ සඳහා සහ අදාළවන විට එහි පාලනයන් හි මෙහෙයුම් සඵලදායකත්වය පරීක්ෂා කිරීමට බාහිර තොරතුරු ප්‍රභවයකින් තොරතුරු ලබාගැනීමට ක්‍රියාපටිපාටි ඉටු කිරීම.<br>* ශ්‍රීලවිප්‍ර 330, 6 වන ඡේදය<br>** ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) 30 වන ඡේදය<br>අ33ඉ සමහර තත්ත්වයන්හි දී නිශ්චිත තොරතුරු ලබාගත හැක්කේ තනි තොරතුරු සපයන්නෙක්ගෙන් පමණක් විය හැකිය. උදාහරණ ලෙස මහ බැංකුවකින් ලැබෙන තොරතුරු හෝ උද්ධමන අනුපාතිකය වැනි තොරතුරු රජයෙන් හෝ පිළිගත් තනි කර්මාන්තයේ ආයතනයක්. එවැනි |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | | අවස්ථාවලදී පවත්නා තත්ත්වයන් තුළදී යෝග්‍ය විය හැකි විගණන පටිපාටිවල ස්වභාවය සහ ප්‍රමාණය විගණකට නිර්ණය කිරීමට බලපෑම් වන්නේ, තොරතුරු ප්‍රභවයේ ස්වභාවය සහ කීර්තිමත්භාවය එම බාහිර තොරතුරු අදාළ වන ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානමේ කුමකටද, සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් සඳහා හේතුවලට අදාළ එම තොරතුරුවල භාවිතයේ කුමන ප්‍රකාශයකටද මගිනි. උදාහරණ ලෙස තොරතුරු ලැබෙන්නේ කීර්තිමත් අධිකාරියලත් මූලාශ්‍රයකින් වනවිට, තොරතුරු මූලාශ්‍රයේ වෙබ් අඩවියට තහවුරු කිරීම හෝ ප්‍රකාශිත තොරතුරු වැනි විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි විස්තීර්ණ බවින් අඩු විය හැකිය. වෙනත් අවස්ථාවලදී මූලාශ්‍රය කීර්තිමත් ලෙස තක්සේරු වන්නේ නැතිනම්, වඩා විස්තීර්ණ ක්‍රියාපටිපාටි යෝග්‍ය බව විගණක නිර්ණය කළහැකි අතර යම් ස්වාධීන විකල්ප තොරතුරු මූලාශ්‍රයකට එරෙහිව සන්සන්දනය කිරීමට නොමැතිවිට, ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට හැකිවීම ප්‍රායෝගික නම් බාහිර තොරතුරු මූලාශ්‍රයෙන් තොරතුරු ලබා-ගැනීමට ක්‍රියාපටිපාටි ඉටු කළ යුතු ද යන්න සලකා බැලිය හැකිය.<br><br>අ33ඊ බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලැබෙන තොරතුරුවල අදාළත්වය සහ විශ්වාසදායකත්වය සලකා බැලීමට කුමන හෝ ප්‍රමාණවත් පදනමක් විගණකට නොමැතිවිට, විකල්ප ක්‍රියා-පටිපාටි මගින් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි නම් විගණකට විෂය පථය මත සීමා කිරීමක් තිබිය හැකිය. විෂය පථය මත පැනවූ ඕනෑම සීමා කිරීමක් ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත)* හි අවශ්‍යතාවයන් සමග අනුකූලව අගය කෙරේ.<br><br>* ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) *ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම්*, 13 වන ඡේදය |
| අ35 | විගණන සාක්ෂි ලෙස භාවිතා විය හැකි තොරතුරු පිළියෙළ කර ඇත්තේ කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ | විගණන සාක්ෂි ලෙස භාවිතා විය හැකි තොරතුරු පිළියෙළ කර ඇත්තේ කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | වැඩ ප්‍රයෝජනයට ගැනීමෙන් වනවිට, මෙම ශ්‍රීලවිප්‍රයේ 8 වන ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර වේ. උදාහරණ ලෙස නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළක් නොමැති සුරැකුම්පත් සඳහා සාධාරණ අගය ඇස්තමේන්තු කිරීම ආදර්ශ යෙදුම් කළ හැකි විශේෂ පුද්ගලයෙක් හෝ ආයතනයක් සතුවිය හැකිය. එම පුද්ගලයා හෝ ආයතනය ඇස්තමේන්තුවක් කිරීමේදී එම විශේෂඥ ඥානය ව්‍යවහාර කරයි නම්, එම ඇස්තමේන්තුව එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී භාවිත කරනවිට එම පුද්ගලයා හෝ ආයතනය කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් වන අතර 8 වන ඡේදය ව්‍යවහාර වේ. අනෙක් අතට එම පුද්ගලයා හෝ සංවිධානය අන්වශයෙන් අස්තිත්ත්වයට ලබාගත නොහැකි පුද්ගලික ගනුදෙනු සම්බන්ධයෙන් මිල ගණන් දත්ත යන්තමින් ලබාදේ නම්, ඒ සඳහා එහි ස්වාධීන ඇස්තමේන්තුකරන ක්‍රම අස්තිත්ත්වය භාවිත කරයි, එවැනි තොරතුරු විගණන සාක්ෂි ලෙස භාවිත කරයි නම්, මෙම ශ්‍රීලවිප්‍රයේ 7 වන ඡේදයට යටත් වේ. ~~එසෙන්~~, අස්තිත්ත්වය විසින් කළමනාකාරිත්වයේ විශේෂ-ඥයාගේ භාවිතය සඳහා නොවේ. | වැඩ ප්‍රයෝජනයට ගැනීමෙන් වනවිට, මෙම ශ්‍රීලවිප්‍රයේ 8 වන ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර වේ. උදාහරණ ලෙස නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළක් නොමැති සුරැකුම් පත් සඳහා සාධාරණ අගය ඇස්තමේන්තු කිරීම ආදර්ශ යෙදුම් කළ හැකි විශේෂ පුද්ගලයෙක් හෝ ආයතනයක් සතුවිය හැකිය. එම පුද්ගලයා හෝ ආයතනය ඇස්ත-මේන්තුවක් කිරීමේදී එම විශේෂඥ ඥානය ව්‍යවහාර කරයි නම්, එම ඇස්තමේන්තුව එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී භාවිත කරනවිට එම පුද්ගලයා හෝ ආයතනය කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් වන අතර 8 වන ඡේදය ව්‍යවහාර වේ. අනෙක් අතට එම පුද්ගලයා හෝ සංවිධානය අන්වශයෙන් අස්තිත්ත්වයට ලබාගත නොහැකි පුද්ගලික ගනුදෙනු සම්බන්ධයෙන් මිල ගණන් දත්ත යන්තමින් ලබාදේ නම්, ඒ සඳහා එහි ස්වාධීන ඇස්තමේන්තුකරන ක්‍රම අස්තිත්ත්වය භාවිත කරයි, එවැනි තොරතුරු විගණන සාක්ෂි ලෙස භාවිත කරයි නම්, මෙම ශ්‍රීලවිප්‍රයේ 7 වන ඡේදයට යටත් වන අතර <u>බාහිර තොරතුරු මූලාශ්‍රයකින් වන තොරතුරු</u>. අස්තිත්ත්වය විසින් කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ භාවිතය සඳහා නොවේ. |
| අ44 පාද සටහන | [1]ශ්‍රීලවිප්‍ර 620, ~~විගණකගේ විශේෂඥයාගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම~~, 7 වන ඡේදය | [1]ශ්‍රීලවිප්‍ර 620, 7 වන ඡේදය |
| අ48 | අදාළ සැලසුම් සඳහා විගණන සාක්ෂි ලෙස කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ වැඩවල යෝග්‍යතාවය අගය කරන විට සැළකිල්ලට ගත යුතු දෑ වලට ඇතුළත් විය හැක්කේ,<br>• එම විශේෂඥයාගේ සොයා ගැනීම් හෝ තීරණවල, අදාළත්වය සහ සාධාරණත්වය, වෙනත් විගණන සාක්ෂි සමග ඒවායේ සංගතභාවය සහ ඒවා යෝග්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශවල පිළිබිඹු වන්නේද;<br>• එම විශේෂඥයාගේ වැඩ සැලකිය යුතු උපකල්පන සහ ක්‍රම අවශ්‍ය කරන්නේ නම් එම උපකල්පන සහ ක්‍රමවල අදාළත්වය සහ සාධාරණීය-කරණය; සහ | අදාළ සැලසුම් සඳහා විගණන සාක්ෂි ලෙස කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ වැඩවල යෝග්‍යතාවය අගය කරන විට සැළකිල්ලට ගත යුතු දෑ වලට ඇතුළත් විය හැක්කේ,<br>• එම විශේෂඥයාගේ සොයා ගැනීම් හෝ තීරණවල, අදාළත්වය සහ සාධාරණත්වය, වෙනත් විගණන සාක්ෂි සමග ඒවායේ සංගතභාවය සහ ඒවා යෝග්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශවල පිළිබිඹු වන්නේද;<br>• එම විශේෂඥයාගේ වැඩ සැලකිය යුතු උපකල්පන සහ ක්‍රම අවශ්‍ය කරන්නේ නම් එම උපකල්පන සහ ක්‍රමවල අදාළත්වය සහ සාධාරණීය-කරණය; සහ<br>• එම විශේෂඥයාගේ වැඩවලට සැලකිය යුතු අන්දමේ ප්‍රභව දත්ත |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | • එම විශේෂඥයාගේ වැඩවලට සැලකිය යුතු අන්දමේ ප්‍රභව දත්ත භාවිතය අවශ්‍ය කරන්නේ නම් එම ප්‍රභව දත්තවල අදාළත්වය, සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය. | භාවිතය අවශ්‍ය කරන්නේ නම් එම ප්‍රභව දත්තවල අදාළත්වය, සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය සහ<br>• එම විශේෂඥයාගේ වැඩවලට බාහිර තොරතුරු මූලාශ්‍රයකින් වන තොරතුරු භාවිතය අවශ්‍ය කරන්නේ නම් එම තොරතුරුවල අදාලත්වය සහ විශ්වාසදායකත්වය. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 501 (ශ්‍රීලවිප්‍ර 501 - විගණන සාක්ෂි - තෝරාගත් අයිතම සඳහා නිශ්චිත සැළකිල්ලට ගැනීම්)** | | |
| අ19 | නඩුවක් පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය සහ හිමිකම් පෑම් හඳුනා ගැනීමේ අරමුණු සඳහා ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හටගැන්විය හැකි අතර එසේම, නඩුවක් පවත්වාගෙන යාමේ ක්‍රියාවලියේ සහ හිමිකම් පෑම් සම්බන්ධයෙන් අගය කිරීම හා මැණීම වැනි වෙනත් අදාළ සැළකිල්ලට ගැනීම් පිළිබඳව ද විගණන සාක්ෂි ලබා දිය හැකිය. නඩුවක් පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය සහ හිමිකම්පෑම් හි මූල්‍ය ප්‍රකාශවල ඇස්තමේන්තුවල අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් විගණකගේ සැළකිල්ලට ගැනීම් වලට අදාළ මගපෙන්වීම් ලබාදීම සහ අවශ්‍යතාවයන් ශ්‍රීලවිප්‍ර 540* ස්ථාපිත කරයි.<br>* ශ්‍රීලවිප්‍ර 540-, *සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය* | නඩුවක් පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය සහ හිමිකම්පෑම් හඳුනා ගැනීමේ අරමුණු සඳහා ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හටගැන්විය හැකි අතර එසේම, නඩුවක් පවත්වාගෙන යාමේ ක්‍රියාවලියේ සහ හිමිකම්පෑම් සම්බන්ධයෙන් අගය කිරීම හා මැණීම වැනි වෙනත් අදාළ සැළකිල්ලට ගැනීම් පිළිබඳව ද විගණන සාක්ෂි ලබා දිය හැකිය. නඩුවක් පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය සහ හිමිකම්පෑම් හි මූල්‍ය ප්‍රකාශවල ඇස්තමේන්තුවල අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් විගණකගේ සැළකිල්ලට ගැනීම් වලට අදාළ මගපෙන්වීම් ලබාදීම සහ අවශ්‍යතාවයන් ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත)* ස්ථාපිත කරයි.<br>* ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) - *සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය* |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 505 (ශ්‍රීලවිප්‍ර 505 - බාහිර තහවුරු කිරීම්)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 510 (ශ්‍රීලවිප්‍ර 510 - මුල් වරට විගණන කාර්යභාර - ආරම්භක ශේෂ)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දින හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| පරිශිෂ්ඨය | • ...<br>• මෙම විශේෂ අධිකරණ බලප්‍රදේශය තුළ නීතිය සහ රෙගුලාසි මගින් විගණකට මූල්‍ය කාර්යසාධනය මුදල් ප්‍රවාහ සම්බන්ධයෙන් කොන්දේසි සහිත මතයක් දීම තහනම් කර ඇත. සහ විකරණය | • ...<br>• මෙම විශේෂ අධිකරණ බලප්‍රදේශය තුළ නීතිය හා රෙගුලාසි මගින් විගණකට මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ සම්බන්ධයෙන් කොන්දේසි සහිත මතයක් දීම සහ මූල්‍ය තත්ත්වය |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | නොකළ මතයක් ... සම්බන්ධයෙන් ... | සම්බන්ධයෙන් විකරණය නොකළ මතයක් දීම තහනම් කර ඇත. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 520 (ශ්‍රීලවිප්‍ර 520 - විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 530 (ශ්‍රීලවිප්‍ර 530 - විගණන නියැදි)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 540 (සංශෝධිත) (ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය)** | | |
| සම්පූර්ණ ශ්‍රීලවිප්‍ර මෙම ලේඛනය අවසානයේ වෙනමම ඇතුළත් කර තිබේ. | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 550 (ශ්‍රීලවිප්‍ර 550 - සම්බන්ධිත පාර්ශ්ව)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 560 (ශ්‍රීලවිප්‍ර 560 - පසුව වන සිදුවීම්)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දිනයෙන් හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 570 (සංශෝධිත) (ශ්‍රීලවිප්‍ර 570 (සංශෝධිත) අඛණ්ඩ පැවැත්ම)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 580 (ශ්‍රීලවිප්‍ර 580 - ලිඛිත නියෝජනය වීම්)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දිනයෙන් හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| 1 වන පරිශිෂ්ඨය | • ...<br>• ශ්‍රීලවිප්‍ර 540, - ~~*සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු*~~ *සම්බන්ධිත හෙළිදරව් කිරීම්* ~~*ඇතුළුව*~~ *ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය* - ~~22~~ වන ඡේදය | • ...<br>• ශ්‍රීලවිප්‍ර 540 <u>(සංශෝධිත),</u> *ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය* - <u>37</u> වන ඡේදය |
| 2 වන පරිශිෂ්ඨය | මෙම සහ වෙනත් ශ්‍රීලවිප්‍ර මගින් අවශ්‍යකරණ ලිඛිත නියෝජනයන් පහත දක්වෙන නිදර්ශනාත්මක ලිපියේ අඩංගු වේ. මෙම නිදර්ශනය තුළ අදාළ වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති; ලිඛිත නියෝජනයක් ලබාගැනීමට ශ්‍රීලවිප්‍ර 570* හි අවශ්‍යතාවය අදාළ නොවේ. සහ ඉල්ලා සිටි ලිඛිත නියෝජන වලට ව්‍යතිරේඛ නොමැති බව උපකල්පනය කෙරේ. ව්‍යතිරේඛ තිබුණේනම්, ව්‍යතිරේක පිළිබිඹුවීමට, නියෝජනයවීම් වෙනස් කිරීම අවශ්‍ය වේ. | මෙම සහ වෙනත් ශ්‍රීලවිප්‍ර මගින් අවශ්‍යකරණ ලිඛිත නියෝජනයන් පහත දක්වෙන නිදර්ශනාත්මක ලිපියේ අඩංගු වේ. මෙම නිදර්ශනය තුළ අදාළ වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති; ලිඛිත නියෝජනයක් ලබාගැනීමට ශ්‍රීලවිප්‍ර 570 <u>(සංශෝධිත)</u>* හි අවශ්‍යතාවය අදාළ නොවේ. සහ ඉල්ලා සිටි ලිඛිත නියෝජන වලට ව්‍යතිරේඛ නොමැති බව උපකල්පනය කෙරේ. ව්‍යතිරේඛ තිබුණේනම්, ව්‍යතිරේක පිළිබිඹුවීමට, නියෝජනයවීම් වෙනස් කිරීම අවශ්‍ය වේ. |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | ...<br>• ~~සාධාරණ අගයට මනිනු ලැබූ ඇ~~ සාධාරණයයි යන්න ~~ඇතුළුව~~ ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී ~~අප විසින්~~ භාවිතකළ ~~සැලකිය යුතු~~ උපකල්පන (ශ්‍රීලවිප්‍ර 540)* ශ්‍රීලවිප්‍ර (570) - *අඛණ්ඩ පැවැත්ම* | ...<br>• අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් සාධාරණ වන හඳුනාගැනීම මැනීම හෝ හෙළිදරව් කිරීම ඉෂ්ඨ කරගැනීමට යෝග්‍ය ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී සහ ඒවායේ සම්බන්ධිත හෙළිදරව් කිරීම් වලදී භාවිත කළ ක්‍රම, දත්ත සහ සැලකිය යුතු අන්දමේ උපකල්පන (ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත)*<br>* ශ්‍රීලවිප්‍ර 570 - *අඛණ්ඩ පැවැත්ම* |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 600 (ශ්‍රීලවිප්‍ර 600 - විශේෂ සැළකිල්ලට ගැනීම් - සමූහ මූල්‍ය ප්‍රකාශ විගණන (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුළුව)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 610 (සංශෝධිත 2013) (ශ්‍රීලවිප්‍ර 610 (සංශෝධිත 2013) - (අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 620 (ශ්‍රීලවිප්‍ර 620 - විගණකගේ විශේෂඥවරයෙකුගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම)** | | |
| අ36 | සමහර අවස්ථාවලදී ඉතා ඉහළ විශේෂීකරණය කළ අස්තිත්ත්වය සංවර්ධනය කළ අනුකෘති භාවිතය ඇතුළුව, ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වය විසින් භාවිත කළ උපකල්පන සහ ක්‍රම ශ්‍රීලවිප්‍ර 540* හි සාකච්ඡා කෙරේ. එම සාකච්ඡාව ලියා ඇත්තේ කළමනාකාරිත්වයේ උපකල්පන සහ ක්‍රම සම්බන්ධයෙන් විගණකට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමේ සම්බන්ධය තුළ වුවද, එය එලෙසම විගණකගේ විශේෂඥයාගේ උපකල්පන සහ ක්‍රම විගණක අගය කරනවිට උපකාරී විය හැකිය.<br>*ශ්‍රීලවිප්‍ර 540, ~~*සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු*~~ *සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්* ~~*ඇතුළුව*~~ *ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය,* ~~8~~, 13 සහ ~~15~~ ඡේද | සමහර අවස්ථාවලදී ඉතා ඉහළ විශේෂීකරණය කළ අස්තිත්ත්වය සංවර්ධනය කළ අනුකෘති භාවිතය ඇතුළුව, ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වය විසින් භාවිත කළ උපකල්පන සහ ක්‍රම ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත)* හි සාකච්ඡා කෙරේ. එම සාකච්ඡාව ලියා ඇත්තේ කළමනාකාරිත්වයේ උපකල්පන සහ ක්‍රම සම්බන්ධයෙන් විගණකට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමේ සම්බන්ධය තුළ වුවද, එය එලෙසම විගණකගේ විශේෂඥයාගේ උපකල්පන සහ ක්‍රම විගණක අගය කරනවිට උපකාරී විය හැකිය.<br>*ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත), *ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය ඡේද* 13, 18 සහ 20 |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 700 (සංශෝධිත) (ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත) - මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරීම සහ වාර්තාකරණය)** | | |
| 13 (ඇ) | (අ) කළමනාකාරිත්වය විසින් සිදුකළ ගිණුම්කරණ ඇස්තමේන්තු සාධාරණ වේ; | (අ) කළමනාකාරිත්වය විසින් සිදුකළ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සාධාරණ වේ; |
| අ3 | ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී වියහැකි කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීවීම් ශ්‍රීලවිප්‍ර 540 ආමන්ත්‍රණය කෙරේ. වියහැකි කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී | ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී වියහැකි කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීවීම් ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත) ආමන්ත්‍රණය කෙරේ. වියහැකි කළමනාකාරිත්වයේ |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | හැඟවීම් එක් එක් ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය මත තීරණයන් ලබාගැනීමේදී අරමුණ සඳහා අවප්‍රකාශයක් ස්ථාපනය නොවේ. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගත්කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරද යන්න පිළිබඳව විගණකගේ ඇගයීමේදී ඒවා බලපෑ හැකිය.<br><br>*ශ්‍රීලවිප්‍ර 540, ~~සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු~~ සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ~~ඇතුළුව~~ ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය, ~~21~~ ඡේදය | පක්ෂග්‍රාහී හැඟවීම් එක් එක් ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය මත තීරණයන් ලබාගැනීමේදී අරමුණ සඳහා අවප්‍රකාශයක් ස්ථාපනය නොවේ. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගත්කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරද යන්න පිළිබඳව විගණකගේ ඇගයීමේදී ඒවා බලපෑ හැකිය.<br><br>* ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත), *ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය*, 32 ඡේදය |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 701 (ශ්‍රීලවිප්‍ර 701 - ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම)** | | |
| 4(ආ) | ඇස්තමේන්තු කිරීමේ ඉහළ අනියතතාවයක් ~~තිබෙන බව හඳුනාගත්~~ ගිණුම්කරණ ඇස්තමේන්තු ඇතුළුව, සැලකිය යුතු අන්දමේ කළමනාකාරිත්ව විනිශ්චයක් අවශ්‍යකරණ මූල්‍ය ප්‍රකාශතුළ වන ක්ෂේත්‍ර වලට සම්බන්ධ සැලකිය යුතු අන්දමේ විගණක විනිශ්චයන්. (යොමුව. (අ23 - අ24 ඡේද) | ඇස්තමේන්තු කිරීමේ ඉහළ ප්‍රමාණයකට අනියතතාවයකට යටත් ගිණුම්කරණ ඇස්තමේන්තු ඇතුළුව, සැලකිය යුතු අන්දමේ කළමනාකාරිත්ව විනිශ්චයක් අවශ්‍යකරණ මූල්‍ය ප්‍රකාශතුළ වන ක්ෂේත්‍ර වලට සම්බන්ධ සැලකිය යුතු අන්දමේ විගණක විනිශ්චයන්. (යොමුව. (අ23 - අ24 ඡේද) |
| අ23-24 ශිර්ෂ | ඇස්තමේන්තු කිරීමේ ඉහළ අනියතතාවයක් ~~තිබෙන බව හඳුනාගත්~~ ගිණුම්කරණ ඇස්තමේන්තු ඇතුළුව, සැලකිය යුතු අන්දමේ කළමනාකාරිත්ව විනිශ්චයක් අවශ්‍යකරණ මූල්‍ය ප්‍රකාශ තුළ වන ක්ෂේත්‍ර වලට සම්බන්ධ සැලකිය යුතු අන්දමේ විගණක විනිශ්චයන්. (යොමුව. (9(ආ) ඡේදය) | ඇස්තමේන්තු කිරීමේ ඉහළ ප්‍රමාණයකට අනියතතාවයකට යටත් ගිණුම්කරණ ඇස්තමේන්තු ඇතුළුව, සැලකිය යුතු අන්දමේ කළමනාකාරිත්ව විනිශ්චයක් අවශ්‍යකරණ මූල්‍ය ප්‍රකාශ තුළ වන ක්ෂේත්‍ර වලට සම්බන්ධ සැලකිය යුතු අන්දමේ විගණක විනිශ්චයන්. (යොමුව. (9(ආ) ඡේදය) |
| අ24 | කෙසේ වෙතත් ශ්‍රීලවිප්‍ර 540* ~~සමග අනුකූලව~~ ඉහළ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය ගිණුම්කරණ ඇස්ත-මේන්තුවල ~~තිබෙන බව හඳුනා ගත්~~ සැලකිය යුතු අන්දමේ අවදානම් වියයුතු ලෙසට නිර්ණය නොකර තිබිය හැකි බවට, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයන්, ඔවුන්ගේ උනන්දුව මතුකර දක්වා ඇත. වෙනත් දෑ අතරට එවැනි ඇස්තමේන්තු බොහෝ සේ රඳා පවත්නේ කළමනාකාරිත්වයේ විනිශ්චය සහ සුලභවය. බොහෝ ලෙස සංකීර්ණ මූල්‍ය ප්‍රකාශවල ක්ෂේත්‍ර මත සහ කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ සහ විගණකගේ විශේෂඥයා යන දෙදෙනාගේම සහභාගිත්වය අවශ්‍ය විය හැකිය. එම කර්මාන්තය තුළ වන වෙනත් ආයතන සමග අස්තිත්ත්වයේ පරිචයන් සංගත නොවන තත්ත්වයන්හිදී විශේෂයෙන්ම මූල්‍ය ප්‍රකාශ පිලිබඳ ඔවුන්ගේ අවබෝධයට | කෙසේ වෙතත් (ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත)* බලන්න.) සමග අනුකූලව ඉහළ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයන්ට යටත් ගිණුම්කරණ ඇස්තමේන්තුවල තිබෙන බව හඳුනා ගත් සැලකිය යුතු අන්දමේ අවදානම් වියයුතු ලෙසට නිර්ණය නොකර තිබිය හැකි බවට, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයන්, ඔවුන්ගේ උනන්දුව මතුකර දක්වා ඇත. වෙනත් දෑ අතරට එවැනි ඇස්තමේන්තු බොහෝ සේ රඳා පවත්නේ කළමනාකාරිත්වයේ විනිශ්චය සහ සුලභව. බොහෝ ලෙස සංකීර්ණ මූල්‍ය ප්‍රකාශවල ක්ෂේත්‍ර මත සහ කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ සහ විගණකගේ විශේෂඥයා යන දෙදෙනාගේම සහභාගිත්වය අවශ්‍ය විය හැකිය. එම කර්මාන්තය තුළ වන වෙනත් ආයතන සමග අස්තිත්ත්වයේ පරිචයන් සංගත නොවන තත්ත්වයන්හිදී විශේෂයෙන්ම මූල්‍ය |

| විස්තරය | 2017 | 2020 |
|---|---|---|
| | අදාළ මූල්‍ය ප්‍රකාශවල සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇති (සහ එම ප්‍රතිපත්තිවල සැලකිය යුතු අන්දමේ වෙනස්වීම්) ගිණුම්කරණ ප්‍රතිපත්ති පරිශීලකයන් එසේම මතුකර දක්වා ඇත.<br><br>*ශ්‍රීලවිප්‍ර 540, ~~සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු~~ සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ~~ඇතුළුව~~ ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය. ~~10-11~~ ඡේද බලන්න. | ප්‍රකාශ පිලිබඳ ඔවුන්ගේ අවබෝධයට අදාළ මූල්‍ය ප්‍රකාශවල සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇති (සහ එම ප්‍රතිපත්තිවල සැලකිය යුතු අන්දමේ වෙනස්වීම්) ගිණුම්කරණ ප්‍රතිපත්ති පරිශීලකයන් එසේම මතුකර දක්වා ඇත.<br><br>*ශ්‍රීලවිප්‍ර 540 (සංශෝධිත), ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය 16-17 ඡේද බලන්න. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 705 (සංශෝධිත) - (ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) ස්වාධින විගණකගේ වාර්තාවේ මතය විකරණය කිරීම්)** | | |
| වෙනස් වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 706 (සංශෝධිත) (ශ්‍රීලවිප්‍ර 706 (සංශෝධිත) ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණ ඡේද)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 710 (ශ්‍රීලවිප්‍ර 710 - සන්සන්දනාත්මක තොරතුරු අනුරූපී සංඛ්‍යා සහ සන්සන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ)** | | |
| * පාද සටහන | ~~මෙම ප්‍රමිතයේ පිටු 1280 සිට 1361 තුළ දක්වා හඳුනාගත් සංශෝධන වලට අනුකූලව 2018 මාර්තු 31 දිනයෙන් හෝ ඉන්පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බල පැවැත්වේ.~~ | [අන්තර්ගතය ඉවත් කර ඇත] |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 720 (සංශෝධිත) (ශ්‍රීලවිප්‍ර 720 - වෙනත් තොරතුරුවලට සම්බන්ධිත විගණකගේ වගකීම්)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 800 (සංශෝධිත) (ශ්‍රීලවිප්‍ර 800 සංශෝධිත) - විශේෂ සැළකිල්ලට ගැනීම් - විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක් සමග අනුකූලව පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශ විගණනය)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 805 (සංශෝධිත) - (ශ්‍රීලවිප්‍ර 805 සංශෝධිත) - විශේෂ සැළකිල්ලට ගැනීම් - තනි මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයන්, ගිණුම් හෝ අයිතම විගණනය)** | | |
| වෙනස්වීම් නැත | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 810 (සංශෝධිත) (ශ්‍රීලවිප්‍ර 810 (සංශෝධිත) - සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත වාර්තා කිරීමේ කාර්යභාර)** | | |
| වෙනස්වීම් නැත | | |

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 540 (සංශෝධිත)
# ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් විගණනය

(2019 දෙසැම්බර් 15 දින හෝ ඉන් පසුව ආරම්භ වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලපැවැත්වේ)

## පටුන


| | ඡේදය |
|---|---|
| **හැඳින්වීම** | |
| මෙම ශ්‍රීලවිප්‍ර යේ විෂය පථය | 1 |
| ගිණුම්කරණ ඇස්තමේන්තුවල ස්වභාවය | 2-3 |
| මෙම ශ්‍රීලවිප්‍රයේ ප්‍රධාන සංකල්ප | 4-9 |
| බලාත්මක වන දිනය | 10 |
| **අරමුණ** | **11** |
| **නිර්වචන** | **12** |
| **අවශ්‍යතාවයන්** | |
| අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාවන් | 13-15 |
| ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම | 16-17 |
| ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් තක්සේරුවට ප්‍රතිචාර | 18-30 |
| ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත හෙළිදරව් කිරීම් | 31 |
| කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂපාතීවීම්හි හැඟවීම් | 32 |
| ඉටුකළ විගණන ක්‍රියාපටිපාටි මත පදනම්ව සමස්ථ අගය කිරීම | 33-36 |
| ලිඛිත නියෝජනය වීම් | 37 |
| පාලනය පිළිබඳ වගකිව යුතු අය, කළමනාකාරිත්වය හෝ වෙනත් අදාළ පාර්ශ්ව සමඟ සන්නිවේදනය | 38 |
| ලේඛණ ගත කිරීම | 39 |
| **භාවිත කිරීම සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු** | |
| ගිණුම්කරණ ඇස්තමේන්තුවල ස්වභාවය | අ1- අ7 |
| මෙම ශ්‍රීලවිප්‍රයේ ප්‍රධාන සංකල්ප | අ8- අ13 |
| නිර්වචන | අ14- අ18 |
| අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාවන් | අ19- අ63 |
| ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම | අ64- අ80 |
| ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම්වලට ප්‍රතිචාර | අ81- අ132 |
| කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂපාතීවීම්හි හැඟවීම් | අ133- අ136 |
| ඉටුකළ විගණන ක්‍රියාපටිපාටි මත පදනම්ව සමස්ථ අගය කිරීම | අ137- අ144 |
| ලිඛිත නියෝජනය වීම් | අ145 |
| පාලනය පිළිබඳ වගකිවයුතු අය, කළමනාකාරිත්වය හෝ වෙනත් අදාළ පාර්ශ්ව සමඟ සන්නිවේදනය | අ146- අ148 |
| ලේඛණගත කිරීම | අ149- අ152 |
| 1 වන පරිශිෂ්ඨය : ආවේණික අවදානම් සාධක | |
| 2 වන පරිශිෂ්ඨය : පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ සන්නිවේදනය | |


ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රීලවිප්‍ර) 540 (සංශෝධිත), ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම විගණනය කියවිය යුත්තේ ශ්‍රීලවිප්‍ර 200, ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයක් පවත්වාගෙන යාම හා එක් කිරීමෙනි.

## හැඳින්වීම

### මෙම ශ්‍රීලවිප්‍රයේ විෂය පථය

1. මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය (ශ්‍රීලවිප්‍ර) මූල්‍ය ප්‍රකාශ විගණනයකදී, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධිතව විගණකගේ වගකීම් සමග කටයුතු කෙරේ. ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත)[1], ශ්‍රීලවිප්‍ර 330[2], ශ්‍රීලවිප්‍ර 450[3], ශ්‍රීලවිප්‍ර500[4], සහ වෙනත් අදාළ ශ්‍රීලවිප්‍රයන්ට සම්බන්ධ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධ හෙළිදරව් කිරීම් ව්‍යවහාර කරන්නේ හෝ ව්‍යාප්ත කරන්නේ කෙසේද, හෝ යොමු කිරීමට වන අවශ්‍යතාවයන් සහ මග පෙන්වීම් විශේෂිතව එහි ඇතුළත් වේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල අවප්‍රකාශ මත අගය කිරීම සහ කළමනාකාරිත්වයේ සිදුවිය හැකි පක්ෂග්‍රාහී වීම් හි හැඟවීම් මත අවශ්‍යතාවයන් සහ මගපෙන්වීම් ද එලෙසම එහි ඇතුළත් වේ.

### ගිණුම්කරණ ඇස්තමේන්තුවල ස්වභාවය

2. ගිණුම්කරණ ඇස්තමේන්තු ස්වභාවයෙන්ම පුළුල්ව වෙනස්වීම් වලට භාජනය වන අතර, මූල්‍ය වටිනාකම් සෘජුව නිරීක්ෂණය කළ නොහැකිවිට, කළමනාකාරිත්වය විසින් ඇස්තමේන්තු කළ යුතුය. මෙම මූල්‍ය වටිනාකම් මැනීම ඇස්තමේන්තු කිරීමේ අනියතතා වලට යටත් වන අතර දැනුමේ හෝ දත්ත තුළ අපේක්ෂිත සීමාකිරීම් එයින් පිළිඹිබු වේ. මෙම සීමා කිරීම් ආවේණික පුද්ගලගතභාවයට සහ මැනීමේ ප්‍රතිඵල තුළ විචලනයට හේතු හට ගැන්විය හැකිය. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියම උපකල්පන සහ දත්ත භාවිත කරමින් ක්‍රමයක් තෝරා ගැනීම සහ ව්‍යවහාර කිරීම සම්බන්ධ කරගන්නා නිසා සහ එයට කළමනාකාරිත්ව විනිශ්චය අවශ්‍ය බැවින්, මැනීමේ සංකීර්ණතා හට ගැන්මට හේතුවිය හැකිය. මෙම මූල්‍ය වටිනාකම් මැණීම මත, සංකීර්ණතාවය, පුද්ගලගතභාවය හෝ වෙනත් ආවේණික අවදානම් සාධක වල බලපෑම්, ඒවායේ අවප්‍රකාශවීමට නැඹුරු වීමට බලපායි. (යොමුව ඃ අ1 - අ6, 1 වන පරිශිෂ්ඨය)

3. මෙම ශ්‍රීලවිප්‍රය සියලුම ගිණුම්කරණ ඇස්තමේන්තු වලට ව්‍යවහාර වන්නේ වුවත් ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට යටත් ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රමාණය ඉතා පුළුල් ලෙස වෙනස් වේ. අවදානමක තක්සේරුවේ ස්වභාවය, කාල නිර්ණය සහ ප්‍රමාණය සහ මෙම ශ්‍රීලවිප්‍රය මගින් අවශ්‍ය කරන තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට, සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානමට සම්බන්ධිත තක්සේරුවන අවදානමට සම්බන්ධව වෙනස් වනු ඇත. එක්තරා ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය ඉතා පහළ විය හැකිය. ඒවායේ ස්වභාවය සහ සංකීර්ණත්වය සහ පුද්ගලගතභාවය සම්බන්ධ වන පදනම මත ඒවා ඇස්තමේන්තු කිරීමේදී ඉතා පහළ විය හැකිය. එවැනි ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා, මෙම ශ්‍රීලවිප්‍රය මගින් අවශ්‍යකරන අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ තවදුරටත් අවශ්‍ය වන විගණන ක්‍රියාපටිපාටි විස්තීර්ණ විය හැකි ලෙස අපේක්ෂා නොකෙරේ. ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ, සංකීර්ණභාවය හෝ පුද්ගලගතභාවය ඉතා ඉහළ වනවිට එවැනි ක්‍රියාපටිපාටි වඩා විස්තීර්ණ වියහැකි ලෙස අපේක්ෂා කෙරේ. මෙම ශ්‍රීලවිප්‍රයේ අවශ්‍යතාවයන් පරිමානුකූලව දක්විය හැකි වන්නේ කෙසේද යන්න සඳහාවන මගපෙන්වීම් මෙම ශ්‍රීලවිප්‍රයේ අඩංගු වේ. (යොමුව ඃ අ7 ඡේදය)

### මෙම ශ්‍රීලවිප්‍රයේ ප්‍රධාන සංකල්ප

4. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සැදහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් තක්සේරු කිරීමේ අරමුණු සඳහා ආවේණික අවදානමේ වෙන්ව වූ තක්සේරුවක් මෙම ශ්‍රීලවිප්‍රයෙන් අවශ්‍ය කෙරේ. විශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තුවක ස්වභාවය මත පදනම්ව සැදහුමක් අවප්‍රකාශයකට නැඹුරුවීම ප්‍රමාණාත්මක විය හැක්කේ, සංකීර්ණතාවය පුද්ගලගතභාවය හෝ වෙනත් ආවේණික අවදානම් සාධක සහ ඒවා අතර අන්තර් සම්බන්ධතාවයට යටත්ව හෝ බලපෑම මතය. ශ්‍රීලවිප්‍ර 200,[5] යෙහි විස්තර කර ඇති පරිදි සමහර සැදහුම් සහ සම්බන්ධිත පන්තිවල ගනුදෙනු, ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම් වල ආවේණික අවදානම වෙනත් ඒවාට වඩා වැඩිය. ඒ අනුව, ආවේණික අවදානමේ තක්සේරුව රඳා පවත්නේ, අවප්‍රකාශය විය හැකි බවේ හෝ විශාලත්වයට ආවේණික අවදානම් සාධකය කුමන ප්‍රමාණයකට බලපාන්නේද මත සහ මෙම ශ්‍රීලවිප්‍රයේ ආවේණික අවදානමේ ප්‍රේක්ෂාවලිය හඳුන්වනු ලබන පරිමාණය මත එය වෙනස් වේ. (යොමුව ඃ අ8 - අ9, අ65 - අ66, 1 පරිශිෂ්ඨය බලන්න)

---

1 ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත), *අස්තිත්වය සහ එහි පරිසරය අවබෝධ කර ගැනීම මගින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීම.*

2 ශ්‍රීලවිප්‍ර 330, *තක්සේරු කළ අවදානම්වලට විගණකගේ ප්‍රතිචාර*

3 ශ්‍රීලවිප්‍ර 450, *විගණනය තුළදී හඳුනාගත් අවප්‍රකාශ අගය කිරීම*

4 ශ්‍රීලවිප්‍ර 500, *විගණන සාක්ෂි*

5 ශ්‍රීලවිප්‍ර 200, *ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමග අනුකූලව විගණනයක් මෙහෙයවීම,* අ40 ඡේදය.

5. මෙම ශ්‍රීලවිප්‍රය, ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) සහ ශ්‍රීලවිප්‍ර 330 තුළවන අදාළ අවශ්‍යතාවයනට යොමුකරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධ පාලන පිළිබඳ පහත දෑ ඇතුළුව තීරණ පිළිබඳව විගණකගේ තීරණවල වැදගත්කම අවධාරණය කිරීමට සම්බන්ධිත මග පෙන්වීම් ලබාදෙයිඃ

- විගණනයට අදාළව ඇති පාලන සඳහා, ඒවායේ සැලසුම් අගය කිරීමට සහ ඒවා ක්‍රියාවේ යොදවා ඇත්දැයි නිර්ණය කිරීමට විගණකට අවශ්‍ය කෙරේ.
- අදාළ පාලනයන්හි මෙහෙයුම් සඵලදායකත්වය පරීක්ෂා කිරීම.

6. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සැදහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් තක්සේරු කිරීමේදී පාලන අවදානමේ වෙනමම වූ තක්සේරුවක් කිරීම ද මෙම ශ්‍රීලවිප්‍රයෙන් එලෙසම අවශ්‍ය කෙරේ. පාලන අවදානම තක්සේරු කිරීමේදී පාලනයන්හි මෙහෙයුම් සඵලදායකත්වය මත සැලසුම් කළ විශ්වාසය, විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි වලින් ඒවාට මැදිහත් වීමක් වේදැයි විගණක සැළකිල්ලට ගත් විගණක පාලන පරීක්ෂාවන් ඉටු නොකරන්නේ නම්, සැදහුම් මට්ටමේ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානමේ විගණකගේ තක්සේරුව එම විශේෂ සැදහුම සම්බන්ධව සඵලදායක මෙහෙයුම් පාලන සඳහා අඩුකළ නොහැකිය.[6] (යොමුව : අ10 ඡේදය)

7. ආවේණික අවදානම් සාධක එකක් හෝ ඊට වැඩි ගණනක බලපෑම සහ පාලන අවදානමේ විගණකගේ තක්සේරුව සැළකිල්ලට ගෙන, සැදහුම් මට්ටමේදී, ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් සඳහා හේතුවලට ප්‍රතිචාර දක්වීමට අවශ්‍ය විය හැකි, විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි (අවශ්‍යවන අවස්ථාවලදී පාලන පරීක්ෂාවන් ඇතුළුව) මෙම ශ්‍රීලවිප්‍රය අවධානය කරයි.

8. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධව වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිත කිරීම ආවේණික අවදානම් සාධකවලට විගණකගේ සැළකිල්ල මගින් බලපායි සහ ගිණුම්කරණ ඇස්තමේන්තු විශාල ප්‍රමාණයක ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයකට යටත් වනවිට එහි වැදගත්කම වැඩිවේ හෝ සංකීර්ණතාවය, පුද්ගලගතභාවය හෝ වෙනත් ආවේණික අවදානම් සාධක මගින් විශාල ප්‍රමාණයකට එයට බලපෑම් වේ. ඒ හා සමානව, කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී බව හෝ වංචා නිසා අවප්‍රකාශවලට නැඹුරු වීම වඩා විශාල වනවිට වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිතා කිරීම වැදගත් වේ. (යොමුව : අ11 වන ඡේදය)

9. ඉටුකළ විගණන පටිපාටි සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සම්බන්ධය තුළ, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සාධාරණ[7] ද හෝ අවප්‍රකාශ වී ඇත්ද යන්න, විගණකට අගය කිරීම මෙම ශ්‍රීලවිප්‍රයෙන් අවශ්‍ය කෙරේ. මෙම ශ්‍රීලවිප්‍රයේ අරමුණු සඳහා අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ අදහස් කරන්නේ එම අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අදාළ අවශ්‍යතාවය, එහි අමතන ලද දේ ඇතුළුව යෝග්‍ය පරිදි ව්‍යවහාර කර ඇති බවයඃ (යොමුව : අ12-අ13, අ139-අ144 ඡේද)

- ක්‍රමය තෝරා ගැනීම ඇතුළුව, උපකල්පන සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල ස්වභාවය සහ අස්තිත්ත්වයේ කරුණු සහ තත්ත්වයන් සැළකිල්ලට ගෙන ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම;
- කළමනාකාරිත්වයේ කරුණ ඇස්තමේන්තුව තේරීම; සහ
- ගිණුම්කරණ ඇස්තමේන්තු සංවර්ධනය කර ඇත්තේ කෙසේද සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ ස්වභාවය, ප්‍රමාණය සහ ප්‍රභව විස්තර කිරීම ඇතුළුව, ගිණුම්කරණ ඇස්තමේන්තුව පිළිබඳ හෙළිදරව් කිරීම.

**බලාත්මක දිනය**

10. මෙම ශ්‍රීලවිප්‍රය 2019 දෙසැම්බර් 15 වන දින හෝ ඉන්පසුව ආරම්භවන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.

**අරමුණ**

11. විගණකගේ අරමුණ වන්නේ, මූල්‍ය ප්‍රකාශ තුළවන ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව තුළ සාධාරණ ද යන්න පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමය.

**නිර්වචන**

12. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවල අරමුණු සඳහා පහත සඳහන් පදවලට ආරෝපිත තේරුම් පහත දක්වේඃ

---

6 ශ්‍රීලවිප්‍ර 530, *විගණන නියැදිකරණය,* 3 වන පරිශිෂ්ඨය

7 ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත), *මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරීම සහ වාර්තාකරණය,* 13 (ඇ) ඡේදය බලන්න.

(අ) ගිණුම්කරණ ඇස්තමේන්තුව - අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් සමග අනුකූලව ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට යටත් මැනීම සඳහා මූල්‍ය වටිනාකම. (යොමුව : අ 14 ඡේදය)

(ආ) විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය - කළමනාකරණයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව ඇගයීම තුළ විගණක සංවර්ධනය කළ පිළිවෙළින් වටිනාකමක් හෝ වටිනාකම් පරාසයක් (යොමුව : අ15 ඡේදය)

(ඇ) ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය - මැනීම තුළ නිරවද්‍ය ආවේණික අඩුකමට නැඹුරුවීමේ හැකියාව (යොමුව : අ16 ඡේදය, 1 වන පරිශිෂ්ඨය)

(ඈ) කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීබව - කළමනාකාරිත්වය විසින් තොරතුරු පිළියෙළ කිරීමේදී මධ්‍යස්ථභාවයේ අඩුකම (යොමුව : අ17 ඡේදය)

(ඉ) කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව - ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ලෙස මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනා ගැනීම හෝ හෙළිදරව් කිරීම සඳහා කළමනාකාරිත්වය තෝරාගත් වටිනාකම.

(ඊ) ගිණුම්කරණ ඇස්තමේන්තුවක ප්‍රතිඵලය - ගිණුම්කරණ ඇස්තමේන්තුවක් මගින් ආමන්ත්‍රණය කළ ගනුදෙනුවක හෝ සිද්ධි(යක) හෝ තත්ත්වය(ක)න්හි නිශ්චය කිරීමකින් ප්‍රතිඵලයක් වන තථ්‍ය මූල්‍ය වටිනාකම. (යොමුව : අ18 ඡේදය)

## අවශ්‍යතාවයන්

### අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාවන්

13. ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත)[8] මගින් අවශ්‍යකරන අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනය ඇතුළුව, අස්තිත්ත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමේදී අස්ත්ත්වයේ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත පහත සඳහන් කරුණු පිළිබඳ අවබෝධයක් විගණක ලබාගත යුතුය. මූල්‍ය ප්‍රකාශ වෙත සහ සැදහුම් මට්ටම්වලදී, ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම හඳුනා ගැනීම සහ තක්සේරුව සඳහා යෝග්‍ය පදනමක් ලබාදීමට අවශ්‍ය ප්‍රමාණය තෙක් අවබෝධයක් ලබාගැනීමට විගණකගේ ක්‍රියාපටිපාටි ඉටු කළ යුතුය. (යොමුව : අ19-අ22 ඡේද)

*අස්තිත්ත්වය සහ එහි පරිසරය*

(අ) ගිණුම්කරණ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනා ගැනීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍යතාවය හටගැන්විය හැකි හෝ වෙනස්වීම් වලට හේතුවිය හැකි අස්තිත්ත්වයේ ගනුදෙනු සහ වෙනත් සිද්ධීන් සහ තත්ත්වයන් (යොමුව : අ23 ඡේදය)

(ආ) ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත අදාළ මූල්‍ය ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් (හඳුනාගැනීමේ නිර්ණායක, මැණීමේ පදනම් සහ සම්බන්ධිත ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් ඇතුළුව) සහ ගනුදෙනු සහ වෙනත් සිද්ධීන් සහ තත්ත්වයන් ආවේණික අවදානම් සාධක වලට යටත් හෝ එමගින් බලපෑමට ලක්වන්නේ කෙසේද යන්න ඇතුළුව, අස්තිත්ත්වයේ ස්වභාවය සහ තත්ත්වයන් සහ එහි පරිසරය සම්බන්ධයෙන් ඒවා ව්‍යවහාර වන්නේ කෙසේද. (යොමුව : අ24-අ25 ඡේද)

(ඇ) අදාළවන විට විචක්ෂණයෙන් අධීක්ෂණයට සම්බන්ධිත නියාමන ආකෘතිමය රාමු, ඇතුළුව, අස්තිත්ත්වයේ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළ නියාමන සාධක (යොමුව : අ26 ඡේදය)

(ඈ) ඉහත 13 (අ) - (ඇ) ඡේද තුළ කරුණුවල විගණකගේ අවබෝධය මත පදනම්ව, අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කළ යුතු ලෙස විගණක අපේක්ෂා කරන ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල ස්වභාවය. (යොමුව : අ27 ඡේදය)

*අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනය*

(අ) ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළ කළමනාකාරිත්වයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි මත අස්තිත්ත්වය විසින් පිහිටුවා ඇති අධීක්ෂණය සහ පාලනය පිළිබඳ කටයුතුවල ස්වභාවය සහ ප්‍රමාණය. (යොමුව : අ28-අ30 ඡේද)

(ආ) කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ භාවිතය සම්බන්ධය ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත විශේෂඥ කුසලතා හෝ දැනුමේ අවශ්‍යතාවය සහ ව්‍යවහාර කිරීම කළමනාකාරිත්වය හඳුනාගන්නේ කෙසේද (යොමුව : අ31 ඡේදය)

---

8 ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) 3, 5-6, 9, 11-12, 15-17 සහ 20-21 ඡේද.

(ඈ) ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත අවදානම්. අස්තිත්ත්වයේ අවදානම් තක්සේරු ක්‍රියාවලිය හඳුනා ගන්නේ සහ අමතන්නේ කෙසේද. (යොමුව ඃ අ32-අ33 ඡේද)

(ඇ) ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධවන පරිදි, පහත දේ ඇතුළුව අස්තිත්ත්වයේ තොරතුරු පද්ධතිය ඃ

(i) ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල අවශ්‍යතාවය සඳහා හෝ වෙනස්වීම් හට ගැන්වීමට හේතුවිය හැකි, මූල්‍ය ප්‍රකාශවලට වැදගත් ගනුදෙනු පන්ති, සිද්ධීන් සහ තත්ත්වයන්; සහ (යොමුව ඃ අ34-අ35 ඡේද)

(ii) එවැනි ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට කළමනාකාරිත්වය කෙසේ;

අ. කළමනාකාරිත්වය අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය, අදාළ ක්‍රම, උපකල්පන හෝ ප්‍රභව දත්ත සහ ඒවායේ වෙනස්වීම්වල අවශ්‍යතාවය හඳුනා ගන්නේ කෙසේද ඇතුළුව. (යොමුව ඃ අ36-අ37 ඡේද)

i. ආදර්ශ භාවිතය ඇතුළුව භාවිත කළ ක්‍රම තෝරාගැනීම හෝ සැලසුම් කිරීම් සහ ව්‍යවහාර කිරීම (යොමුව ඃ අ38-අ39 ඡේද)

ii. විකල්පයන්හි සැළකිල්ලට ගැනීම සහ සැලකිය යුතු උපකල්පන හඳුනාගැනීම ඇතුළුව භාවිත කළයුතු උපකල්පන තෝරාගැනීම; සහ (යොමුව ඃ අ40-අ43 ඡේද)

iii. භාවිත කළයුතු දත්ත තෝරාගැනීම, (යොමුව ඃ අ44 ඡේදය)

ආ. සිදුවිය හැකි මැනීමේ ප්‍රතිඵලවල පරාසය සැළකිල්ලට ගැනීම මගින් ඇතුළුව, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ ප්‍රමාණය අවබෝධ කරගැනීම; සහ (යොමුව ඃ අ45)

ඇ. මූල්‍ය ප්‍රකාශ තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළත් කිරීම් සඳහා සහ කරුණ හැඟවීමේ ඇස්තමේන්තු හෝ තෝරා ගැනීම ඇතුළුව, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය ඇමතීම. (යොමුව ඃ අ46-අ49 ඡේද)

(ඉ) 13(ඇ)(ii) ඡේදය තුළ විස්තර කර ඇති පරිදි ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකාරිත්වයේ ක්‍රියාවලිය මත විගණනයට අදාළ පාලන ක්‍රියාවන්. (යොමුව ඃ අ50-අ54 ඡේද)

(ඊ) පෙර වූ ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිඵලය(න්)හි කෙසේ කළමනාකාරිත්වය සමාලෝචනය කරන්නේ ද සහ එම සමාලෝචනයන්ගේ ඵලයනට ප්‍රතිචාර දැක්වීම.

14. ප්‍රවර්තන කාලපරිච්ඡේදය තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීමට සහාය වීමට පෙර වූ ගිණුම්කරණ ඇස්තමේන්තුවල හෝ අදාළවන පරිදි ඒවායේ පසුව සිදුකළ යළි ඇස්තමේන්තුවල ප්‍රතිඵල විගණක සමාලෝචනය කළයුතුය. එම සමාලෝචනයේ ස්වභාවය සහ ප්‍රමාණය නිර්ණය කිරීමේදී ගිණුම්කරණ ඇස්තමේන්තුවල ගතිලක්ෂණ විගණක සැළකිල්ලට ගතයුතුය. මෙම සමාලෝචනය පෙර වූ කාලපරිච්ඡේදයේ ගිණුම්කරණ ඇස්තමේන්තු පිළිබඳව වලංගු බව ප්‍රශ්න කිරීමේ විනිශ්වයක් ලෙස අදහස් නොකරන අතර එම ගිණුම්කරණ ඇස්තමේන්තු පිළියෙළ කර ඇත්තේ එම අවස්ථාවේදී ලබාගෙන ඇති තොරතුරු මත යෝග්‍ය ආකාරයකටය. (යොමුව ඃ අ55-අ60 ඡේද)

15. ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන්, ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම් හඳුනාගැනීමට තක්සේරු කිරීමට, එම අවදානම්වලට ප්‍රතිචාර ලෙස විගණන පටිපාටි සැලසුම් කිරීමට සහ ඉටුකිරීමට, හෝ ලබාගත් විගණන සාක්ෂි අගය කිරීමට, අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි ඉටුකිරීමට කාර්යභාරයේ නියුතු කණ්ඩායමට විශේෂඥ කුසලතා හෝ දැනුම අවශ්‍යදැයි විගණක නිර්ණය කළ යුතුය. (යොමුව අ61-අ63 ඡේද)

**ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම**

16. ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත)[9] මගින් අවශ්‍යකරණ පරිදි සැදහුම් මට්ටමේ දී ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනාගැනීමේ දී සහ තක්සේරු කිරීමේ දී, විගණක වෙන් වෙන්ව ආවේණික අවදානම සහ පාලන අවදානම තක්සේරු කළ යුතුය. ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනාගැනීමේ දී සහ ආවේණික අවදානම තක්සේරු කිරීමේ දී විගණක පහත දෑ සැළකිල්ලට ගත යුතුය. (යොමුව ඃ අ64-අ71 ඡේද)

(අ) ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට ගිණුම්කරණ ඇස්තමේන්තුව යටත්වන ප්‍රමාණය; සහ (යොමුවඃ අ72-අ75 ඡේද)

9 ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත), 25 සහ 26 ඡේද.

(ආ) සංකීර්ණතාවය, පුද්ගලගතභාවය හෝ වෙනත් ආවේණික අවදානම් සාධක මගින් පහත දෑ බලපාන ප්‍රමාණය; (යොමුව ඃ අ76-අ79 ඡේද)

(i) ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ දී ක්‍රමය, උපකල්පන සහ දත්ත තෝරා ගැනීම සහ ව්‍යවහාර කිරීම; හෝ

(ii) මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කිරීම සඳහා කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව සම්බන්ධිත හෙළිදරව් කිරීම් තෝරා ගැනීම.

17. 16 වන ඡේදය සමඟ අනුකූලව හඳුනාගත් හෝ තක්සේරු කළ ඕනෑම ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් විගණකගේ විනිශ්චය තුළ සැලකිය යුතු අන්දමේ අවදානමක් ද යන්න විගණක විසින් නිර්ණය කළ යුතුය.[10] සැලකිය යුතු අන්දමේ අවදානමක් පවතින බව විගණක නිර්ණය කළහොත්, එම අවදානමට අදාළ පාලන අවදානම් ඇතුළුව අස්තිත්වයේ පාලනයන්හි අවබෝධයක් විගණක විසින් ලබාගත යුතුය.[11] (යොමුව ඃ අ80 ඡේදය)

## ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම්වලට ප්‍රතිචාර

18. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 330[12] මගින් අවශ්‍යකරන පරිදි, එම අවදානම්වලට දුන් තක්සේරුව සඳහා හේතු සැළකිල්ලට ගනිමින් සැඳහුම් මට්ටමේ දී,[13] ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම්වලට විගණකගේ තවදුරටත් වන විගණන පටිපාටිවලට ප්‍රතිචාර දැක්විය යුතුය. විගණකගේ තවදුරටත්වන විගණන ක්‍රියාපටිපාටිවලට පහත සඳහන් පිවිසුම් මාර්ග එකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් විය යුතුය.

(අ) විගණකගේ වාර්තාවේ දිනය දක්වා සිදුවූ සිද්ධීන්හි විගණන සාක්ෂි ලබාගැනීම (21) වන ඡේදය බලන්න).

(ආ) කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තු කළේ කෙසේදැයි පරීක්ෂා කිරීම යොමුව. (22, 27 ඡේද බලන්න); හෝ

(ඇ) විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය තුළ වර්ධනය කිරීම (28-29 ඡේද බලන්න); හෝ

ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම ඉහළ ද, අවශ්‍ය විය යුත්තේ වඩාත් ඒත්තු ගන්වන සුළු විගණන සාක්ෂි බව විගණකගේ තවදුරටත් වන විගණක පටිපාටි සැළකිල්ලට ගත යුතුය.[14] තහවුරු විය හැකි ආකාරයට විගණන සාක්ෂි ලබාගැනීම දෙසට සාක්ෂි පක්ෂග්‍රාහී නොවිය යුතු හෝ පරස්පර විය හැකි ආකාරයට දෙසට වියහැකි සාක්ෂි බැහැර නොවන ආකාරයකට විගණක තවදුරටත් වන විගණන පටිපාටි සැලසුම්කර ඉටුකළ යුතුය. (යොමුව ඃ අ81-අ84 ඡේද)

19. ශ්‍රීලවිප්‍ර 330[15] න් අවශ්‍යකරන පරිදි, අදාළ පාලනවල මෙහෙයුම් සඵලදායකත්වය ලෙසට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට විගණක පරීක්ෂාවන් සැලසුම් කර ඉටුකළ යුතුය; වන්නේ නම්,

(අ) සැඳහුම් මට්ටමේ දී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හි විගණකගේ තක්සේරුවේ පාලන සඵලදායක ලෙස මෙහෙයවන බවට අපේක්ෂාවක් ඇතුළත් විය යුතුය; හෝ

(ආ) සත්තාවි ක්‍රියාපටිපාටිවලට පමණක් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි සැඳහුම් මට්ටමේ දී ලබාදිය නොහැකිය.

ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධව, එවැනි පාලනවල විගණකගේ පරීක්ෂාවන් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් තක්සේරුවට දුන් හේතුවලට ප්‍රතිචාර දැක්විය යුතුය. පාලන පරීක්ෂාවන් සැලසුම් කිරීමේ දී සහ ඉටුකිරීමේ දී, විගණක පාලනයක සඵලදායකත්වය මත ඉතා ඉහළ විශ්වාසයක් තබන විට විගණක වඩාත් ඒත්තු ගන්වන සුළු විගණන සාක්ෂි ලබාගත යුතුය.[16] (යොමුව ඃ අ85-අ89 ඡේද)

20. ගිණුම්කරණ ඇස්තමේන්තුවකට සම්බන්ධ සැලකිය යුතු අන්දමේ අවදානමක් සඳහා විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටිවලට එම පාලන මත විශ්වාසය තැබීමට විගණක සැළසුම්කරන්නේ නම්, ප්‍රවර්තන

[10] ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත), 27 ඡේදය.
[11] ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත), 29 ඡේදය.
[12] ශ්‍රීලවිප්‍ර 330, 6-15 සහ 18 ඡේද.
[13] ශ්‍රීලවිප්‍ර 330, 6-7 සහ 21 ඡේද.
[14] ශ්‍රීලවිප්‍ර 330, 7(ආ) ඡේදය.
[15] ශ්‍රීලවිප්‍ර 330, 8 වන ඡේදය.
[16] ශ්‍රීලවිප්‍ර 330, 9 වන ඡේදය.

වර්ෂයේ පාලන පරීක්ෂාවන් එම ක්‍රියාපටිපාටිවලට ඇතුළත් විය යුතුය. සැලකිය යුතු අවදානමේ පිවිසුම් මගට සමන්විත වන්නේ සත්තාවි ක්‍රියාපටිපාටි පමණක් නම්, එම ක්‍රියාපටිපාටිවලට විස්තරාත්මක පරීක්ෂාවන් ඇතුළත් විය යුතුය.[17] (යොමුව ඃ අ90 ඡේදය)

*විගණකගේ වාර්තාවේ දිනය තෙක් සිදුවන සිද්ධීන්ගෙන් විගණන සාක්ෂි ලබාගැනීම*

21. විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටිවලට, විගණකගේ වාර්තාවේ දිනය තෙක් සිදුවන සිදුවීම් වලින්වන විගණන සාක්ෂි ලබාගැනීම ඇතුළත් වනවිට, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ එවැනි විගණන සාක්ෂිවල අදාළත්වයට, මිනුම්කරණ දින සහ සිද්ධිය අතර පවත්නා තත්ත්වයන්හි සහ වෙනත් අදාළ කොන්දේසිවල වෙනස්වීම් බලපා හැකි ද යන්න සැළකිල්ලට ගෙන, ගිණුම්කරණ ඇස්තමේන්තුවට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශයේ අවදානම් ඇමතීමට එවැනි විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍යදැයි විගණක අගය කළ යුතුය. (යොමුව ඃ අ91-අ93 ඡේද)

*කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තු සිදුකළේ කෙසේදැයි පරීක්ෂා කිරීම*

22. කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තු සිදුකළේ කෙසේ ද යන්න පරීක්ෂා කිරීමේ දී, පහත දැට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට 23-26 ඡේද සමඟ අනුකූලව සැලසුම්කර සහ ඉටුකළ ක්‍රියාපටිපාටි විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටිවල ඇතුළත් කළ යුතුය. (යොමුව ඃ අ94 ඡේදය)

(අ) ගිණුම්කරණ ඇස්තමේන්තු සිදුකිරීමේ දී කළමනාකාරිත්වය විසින් භාවිත කළ ක්‍රමවල, සැලකිය යුතු අන්දමේ උපකල්පන සහ දත්ත තෝරාගැනීම සහ ව්‍යවහාර කිරීම; සහ

(ආ) කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳව හෙළිදරව් කිරීම සම්බන්ධිත සංවර්ධනය කිරීම කළමනාකාරිත්වය කෙසේ තෝරා ගත්තේ ද.

ක්‍රම

23. ක්‍රමවලට සම්බන්ධයෙන් 22 වන ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමේ දී, විගණකගේ තවදුරටත්වන විගණන ක්‍රියාපටිපාටි පහත දෑ ඇමතිය යුතුයඃ

(අ) අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ තෝරාගත් ක්‍රමය යෝග්‍ය ද යන්න සහ, අදාළ වන්නේ නම්, පූර්ව කාලපරිච්ඡේදවල භාවිත කළ ක්‍රමවලින් වෙනස් කිරීම් යෝග්‍ය ද; (යොමුව ඃ අ95-අ97 ඡේද)

(ආ) ක්‍රමය තෝරා ගැනීමේ දී ගත් විනිශ්චයන් වියහැකි කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී වීමක් හටගැන්වීමට ඉඟි පළකිරීමක් ද; (යොමුව ඃ අ96 ඡේදය)

(ඇ) ක්‍රමය සමඟ අනුකූලව ගණනය කිරීම් ව්‍යවහාර කළේ ද සහ ඒවා ගණිතමය වශයෙන් නිරවද්‍ය ද;

(ඈ) අදාළවන අවස්ථාවල දී විනිශ්චයන් සංගතව ව්‍යවහාර කර තිබේ ද, කළමනාකාරිත්වය ක්‍රම ව්‍යවහාර කරනවිට සංකීර්ණ ආදර්ශකරණය සම්බන්ධ කර ගත්තේ ද (යොමුව ඃ අ98-අ100 ඡේද)

(i) ආදර්ශයේ සැලසුම් කිරීම අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ මැනීමේ අරමුණ ඉෂ්ඨ කරන පවත්නා තත්ත්වයන් තුළ යෝග්‍ය සහ අදාළ වන්නේ නම්, පූර්ව කාලපරිච්ඡේදයේ ආදර්ශයෙන් වන වෙනස්වීම් පවත්නා තත්ත්වයන්හි දී යෝග්‍ය වේ; සහ

(ii) අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ මැනීමේ අරමුණ සමඟ ආදර්ශයේ නිමවුමේ ගැළපුම් සංගත සහ පවත්නා තත්ත්වයන් තුළ යෝග්‍ය වන බව; සහ

(ඉ) සැළකිය යුතු අන්දමේ උපකල්පනයන්හි අවංකත්වයට සහ ක්‍රමය අනුගමනය කරමින් දත්ත නඩත්තු කර තිබේ ද (යොමුව ඃ අ101 ඡේදය)

සැලකියයුතු අන්දමේ උපකල්පන

24. සැලකිය යුතු අන්දමේ උපකල්පන සමඟ සම්බන්ධයෙන්, 22 වන ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමේ දී විගණකගේ තවදුරටත්වන විගණන ක්‍රියාපටිපාටි පහත දෑ ඇමතිය යුතුය;

17 ශ්‍රීලවිප්‍ර 330, 15 සහ 21 වන ඡේද.

(අ) අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ සැලකිය යුතු අන්දමේ උපකල්පන යෝග්‍ය ද සහ අදාළ වන්නේ නම්, පූර්ව කාලපරිච්ඡේදවලින්වන වෙනස්වීම් යෝග්‍ය ද; (යොමුව ඃ අ95, අ102-අ103 ඡේද)

(ආ) සැලකිය යුතු අන්දමේ උපකල්පන තෝරා ගැනීමේ දී කළ විනිශ්චයන් වියහැකි කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීබවට බවට හැඟවීම් හට ගැන්මට හේතුවන්නේ ද; (යොමුව ඃ අ96 ඡේදය).

(ඇ) විගණනය තුළ දී ලබාගත් විගණකගේ දැනුම පදනම මත සැලකිය යුතු අන්දමේ උපකල්පන එකිනෙක සමඟ සහ වෙනත් ගිණුම්කරණ ඇස්තමේන්තුවල භාවිත කළ එම දෑ සමඟ අදාළ උපකල්පන සමඟ හෝ අස්තිත්ත්වයේ වෙනත් ව්‍යාපාරික ක්‍රියා ක්ෂේත්‍රවල භාවිත කරන සම්බන්ධිත උපකල්පන සමඟ සංගතවන්නේ ද යනවග (යොමුව ඃ අ104 ඡේදය)

(ඈ) අදාලවනවිට විශේෂිත ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට, කළමනාකාරිත්වයට අභිප්‍රායක් තිබේ ද සහ එසේ කිරීමට හැකියාව තිබේ ද. (යොමුව ඃ අ105 ඡේදය)

දත්ත

25. දත්තවලට සම්බන්ධයෙන් 22 වන ඡේදයේ අවශ්‍යතාව ව්‍යවහාර කිරීමේ දී විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටිවල පහත දෑ ඇමතිය යුතුයඃ

(අ) අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ. දත්ත යෝග්‍ය ද සහ අදාළ වන්නේ නම් පූර්ව කාලපරිච්ඡේදවලින් වන වෙනස්කම් යෝග්‍ය ද (යොමුව ඃඅ95, අ106 ඡේද);

(ආ) දත්ත තෝරාගැනීමේ දී කළ විනිශ්චයන්, වියහැකි කළමනාකාරිත්වයේ පක්ෂපාතී බවට හැඟවීම හට ගැන්වීමට හේතුව වන්නේ ද; (යොමුව ඃ අ96 ඡේදය)

(ඇ) පවතින තත්ත්වයන් තුළ දත්ත අදාළ සහ විශ්වාසදායක වන්නේ ද; සහ (යොමුව ඃ අ107 ඡේදය)

(ඈ) ගිවිසුම්ගත කොන්දේසිවලට සම්බන්ධයෙන් ඇතුළුව, කළමනාකාරිත්වය විසින් දත්ත යෝග්‍ය පරිදි අවබෝධ කරගන්නේ හෝ අර්ථකථනය කර ඇත් ද (යොමුව ඃ අ108 ඡේදය)

කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳ සම්බන්ධිත හෙළිදරව් කිරීම්.

26. 22 වන ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමේ දී, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ ගත් කළ කළමනාකාරිත්වය පහත සඳහන් දෑ සඳහා යෝග්‍ය පියවර ගෙන තිබේ ද යන්න විගණකගේ තවදුරටත්වන විගණන ක්‍රියාපටිපාටි ඇමතිය යුතුය.

(අ) ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය හඳුනාගැනීම; සහ (යොමුව ඃඅ109 ඡේදය)

(ආ) ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සංවර්ධනය කිරීම සහ උචිත කරුණ හැඟවීම ඇස්තමේන්තුව තෝරාගැනීම මගින් ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය ඇමතීම. (යොමුව ඃඅ110-අ114 ඡේද)

27. විගණකගේ විනිශ්චය ලබාගත් සාක්ෂි මත පදනම්වන විට, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක් අවබෝධ කර ගැනීමට හෝ ඇමතීමට කළමනාකාරිත්වය යෝග්‍ය පියවර ගෙන නොමැති අවස්ථාවක, විගණක කළ යුත්තේ; (යොමුව ඃ අ115-අ117 ඡේද)

(අ) ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අවබෝධ කර ගැනීමට අතිරේක ක්‍රියාපටිපාටි ඉටුකරන ලෙස කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටීම, හෝ කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම නැවත සලකා බැලීම මගින් එය ඇමතීම හෝ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට සම්බන්ධ අතිරේක හෙළිදරව් කිරීම් ලබාදීමට සැළකිල්ලක් දක්වීම, සහ 26 වන ඡේදය සමඟ අනුකූලව කළමනාකාරිත්වයේ ප්‍රතිචාර(ය) අගය කිරීම;

(ආ) විගණකගේ ඉල්ලීමට කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය ප්‍රමාණවත් ලෙස ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අමතා නැතැයි විගණක නිර්ණය කරන්නේ නම්, ප්‍රායෝගික වන ප්‍රමාණයකට විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය 28-29 ඡේද සමඟ අනුකූලව සංවර්ධනය කිරීම; සහ

(ඇ) අභ්‍යන්තර පාලනයේ ඌණතාවයක් පවතීදැයි ඇගයීම, එසේ පවතී නම් ශ්‍රීලවිප්‍ර 265[18] සමඟ අනුකූලව සන්නිවේදනය කිරීම.

[18] ශ්‍රීලවිප්‍ර 265, *පාලනය පිළිබඳ වගකිවයුතු අයට සහ කළමනාකාරිත්වයට අභ්‍යන්තර පාලනයේ ඌණතා සන්නිවේදනය.*

*විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය*

28. 27(ආ) ඡේදය මගින් අවශ්‍ය කරන විට ඇතුළුව, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සහ කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව ඇගයීමට, විගණක කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවක් හෝ පරාසයක් සංවර්ධනය කරනවිට, අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ ක්‍රම, උපකල්පන හෝ භාවිත කළ දත්ත යෝග්‍යදැයි ඇගයීම මත ක්‍රියාපටිපාටි විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටිවලට ඇතුළත් විය යුතුය. විගණක කළමනාකාරිත්වයේ හෝ විගණකගේ ස්වකීය ක්‍රම, උපකල්පන හෝ දත්ත භාවිත කරන්නේ ද යන්න නොසලකා 23-25 ඡේදවල කරුණු ඇමතීමට මෙම තවදුරටත් වන විගණන පටිපාටි සැලසුම් කර සහ ඉටුකළ යුතුය. (යොමුව : අ118-අ123)

29. විගණක, විගණකගේ පරාසය සංවර්ධනය කරන්නේ නම්, විගණක විසින්;

   (අ) අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ වෙනත් අවශ්‍යතාවයන් සහ මැනීමේ අරමුණුවල සම්බන්ධය තුළ සාධාරණ විය යුතු බව විගණක විසින් අගය කළ යුතු සහ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි මගින් සහාය දෙන වටිනාකම් පමණක් එම පරාසයේ ඇතුළත් බව නිර්ණය කිරීම (යොමුව : අ124-අ125 ඡේද)

   (ආ) මූල්‍ය ප්‍රකාශ තුළ හෙළිදරව් කිරීම්වල ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක විස්තරයකට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කර ඉටුකිරීම්.

*විගණන සාක්ෂිවලට සම්බන්ධිත වෙනත් සැලකිල්ලට ගැනීම්*

30. විගණන සාක්ෂි ලෙස භාවිත කළ හැකි තොරතුරුවල මූලාශ්‍රය කුමක් වුවත් ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් සම්බන්ධයෙන් විගණන සාක්ෂි ලබා ගැනීමේ දී විගණක විසින් ශ්‍රීලවිප්‍ර 500 තුළ අදාළ අවශ්‍යතා සමඟ අනුකූල විය යුතුය.

කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ වැඩ ප්‍රයෝජනයට ගන්නා විට, ශ්‍රීලවිප්‍ර 500 8(ඇ) ඡේදය සමඟ අනුකූලව අදාළ සැදහුම සඳහා විගණන සාක්ෂි ලෙස විශේෂඥයාගේ වැඩවල යෝග්‍යතාවය අගය කිරීමේ දී මෙම ශ්‍රීලවිප්‍රයේ 21-29 ඡේදවල අවශ්‍යතාවයන් විගණකට උපකාරී විය හැකිය. කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ වැඩ අගය කිරීමේ දී, තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කල් නිර්ණය සහ ප්‍රමාණය, විශේෂඥයාගේ සක්‍යතාවය, හැකියාවන් සහ පුද්ගලගතභාවයේ විගණකගේ අගය කිරීම විශේෂඥයා විසින් ඉටු කළ වැඩවල ස්වභාවය පිළිබඳ විගණකගේ අවබෝධය සහ විශේෂඥයාගේ, විශේෂඥ ඥාණයේ ක්ෂේත්‍රය පිළිබඳ විගණකගේ සමීප බව මගින් බලපෑම ඇති කරයි. (යොමුව : අ126-අ132).

**ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත හෙළිදරව් කිරීම**

31. 26(ආ) සහ 29(ආ) ඡේදවල අමතන ලද ඇස්තමේන්තු කිරීම සම්බන්ධිත අනියතතා හැර, ගිණුම්කරණ ඇස්තමේන්තුවකට සම්බන්ධිත හෙළිදරව් කිරීම් සඳහා සැදහුම් මට්ටමේ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි විගණක සැලසුම් කර ඉටු කළ යුතුය.

**කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂග්‍රාහීවීම්හි හැඟවීම්**

32. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වය විසින් සිදුකළ විනිශ්චයන් සහ තීරණ ඒවා තනි තනිව, සාධාරන වියහැකි පක්ෂග්‍රාහී හැඟවීම වුවත්, මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ද යන්න විගණක විසින් ඇගයිය යුතුය. කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂග්‍රාහීවීම්, හඳුනාගත්විට, විගණනය සඳහා හැඟවෙන දෑ විගණක විසින් අගය කළ යුතුය. නොමග යැවීමට අභිප්‍රාය ඇති අවස්ථාවක, කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී තත්ත්වයේ ස්වභාවය වංචා සහගත වේ. (යොමුව : අ133-අ136 ඡේද)

**ඉටුකළ විගණන පටිපාටි පදනම් කර සමස්ථ අගය කිරීම**

33. ගිණුම්කරන ඇස්තමේන්තුවලට ශ්‍රීලවිප්‍ර 330 ව්‍යවහාර කිරීමේදී[19] ඉටුකළ විගණන ක්‍රියාපටිපාටි සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව පහත දෑ වන්නේද යන්න සඳහා විගණක ඇගයීම කළ යුතුයඃ (යොමුව අ137-අ138 ඡේද)

   (අ) කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂග්‍රාහී වීම්වලට හැඟවීම් හඳුනා ගත්විට ඇතුළුව, සැදහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්හි අවදානම් තක්සේරුව යෝග්‍ය ලෙස පවතිනු ඇත.

---

19 ශ්‍රීලවිප්‍ර 330, 25-26 ඡේද

(ආ) මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගැනීම, මැනීම්, ඉදිරිපත් කිරීම සහ මෙම ගිණුම්කරණ ඇස්තමේන්තුවල හෙළිදරව් කිරීම් වලට සම්බන්ධිත කළමනාකාරිත්වයේ තීරණ, අදාළ මූල්‍ය ආකෘතිමය රාමුව සමඟ අනුකූල වේ; සහ

(ඇ) ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන ඇත.

34. 33(ඇ) ඡේදයෙන් අවශ්‍ය කරන පරිදි, ඇගයීමක් සිදු කිරීමේදී, ලබාගත් අදාළ සියළු විගණන සාක්ෂි, ඒවා තහවුරු කෙරෙන හෝ පරස්පර විරෝධී වන සාක්ෂි වුවත්, විගණක සැළකිල්ලට ගත යුතුය.[20] විගණකට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි වුවහොත්, ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ මතය හෝ විගණනය සඳහා හැඟවෙන දෑ විගණක අගය කළ යුතුය.[21]

### ගිණුම්කරණ ඇස්තමේන්තු සාධාරණ ද හෝ අවප්‍රකාශ වී ඇත් ද යන්න නිර්ණය කිරීම

35. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සාධාරණ ද හෝ අවප්‍රකාශ වී ඇත්ද යන්න විගණක නිර්ණය කළ යුතුය. මූල්‍ය ප්‍රකාශ මත නිවැරදි නොකළ අවප්‍රකාශයක බලපෑම විගණකගේ ඇගයීම් සඳහා අවප්‍රකාශකයකින් (සත්‍ය, විනිශ්චිත, හෝ ප්‍රක්ෂේපිත වුවත්) විගණක වෙන්කොට හඳුනා ගන්නේ කෙසේද යන්න පිළිබඳ මගපෙන්වීම් ශ්‍රීලවිප්‍ර 450[22] න් ලබාදෙයි.

36. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධව විගණක පහත දෑ අගය කළ යුතුය.

(අ) සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් වන අවස්ථාවක මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත්කළ සාධාරණ ඉදිරිපත් කිරීමක් අත්කරගැනීමට ආකෘතිමය රාමුව මගින් නිශ්චිතව අවශ්‍ය කරන දෑයින් එහාට ගිය හෙළිදරව් කිරීම් කළමනාකාරිත්වය ඉදිරිපත් කර ඇත්ද;[23] හෝ

(ආ) අනුකූලතා ආකෘතිමය රාමුවක් වන අවස්ථාවක, මූල්‍ය ප්‍රකාශ නොමග නොයැවීමට අවශ්‍ය කරන දේ හෙළදරව් කර ඇත්ද[24]

### ලිඛිත නියෝජනය වීම්

37. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව හඳුනාගැනීම, මැනීම හෝ හෙළිදරව් කිරීම අත්කර ගැනීමට, ගිණුම්කරන ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම සඳහා භාවිත කළ ක්‍රම, සැලකිය යුතු අන්දමේ උපකල්පන සහ දත්ත යෝග්‍ය දැයි යන්න පිළිබඳව කළමනාකාරිත්වයෙන්[25] සහ අදාළවනවිට පාලනය පිළිබඳ වගකිව යුතු අයගෙන් ලිඛිත නියෝජනයන් විගණක ඉල්ලා සිටිය යුතුය. විගණක එසේම ක්‍රම, උපකල්පන හෝ භාවිත කළ දත්ත වලට සම්බන්ධිත දෑ ඇතුළුව, නිශ්චිත ගිණුම්කරණ ඇස්තමේන්තු පිළිබඳ නියෝජනය වීමක් ලබාගැනීමේ අවශ්‍යතාවය සැළකිල්ලට ගත යුතුය. (යොමුව ඃ අ145 ඡේදය)

### පාලනය පිළිබඳ වගකිව යුතු අය, කළමනාකාරිත්වය හෝ වෙනත් අදාළ පාර්ශ්ව සමඟ සන්නිවේදනය

38. ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත)[26] සහ ශ්‍රීලවිප්‍ර 265[27] ව්‍යවහාර කිරීමේදී පිළිවෙළින් අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයන්හි සැලකිය යුතු අන්දමේ ගුණාත්මක අංග සහ අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අන්දමේ ඌණතාවයන් ඇතුළුව, සමහර කරුණු පිළිබඳව පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු අය හෝ කළමනාකාරිත්වය සමඟ විගණකට සන්නිවේදනය කිරීම අවශ්‍ය වේ. එසේ කිරීමේදී, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීමේදී සංකීර්ණතාවය, පුද්ගලගතභාවය හෝ වෙනත් ආවේණික අවදානම් සාධකයන්හි බලපෑම් හෝ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානමට දී ඇති හේතු සැළකිල්ලට ගත්තේද යන්න සැළකිල්ලට ගැනීමට හෝ කිසිවක් වේනම් ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන් කරුණ විගණක සැළකිල්ලට ගත යුතුය. අමතරව සමහර අවස්ථාවන්හිදී නියාමකයන් හෝ විචක්ෂණයෙන් කටයුතු කරන අධීක්ෂකවරයෙක් වැනි වෙනත් අදාළ

[20] ශ්‍රීලවිප්‍ර 500, 11 වන ඡේදය
[21] ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත), *ස්වාධීන විගණකගේ වාර්තාවට විකරණය කිරීම්*
[22] ශ්‍රීලවිප්‍ර 450, අ6 ඡේදය
[23] ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත), 14 ඡේදය ද බලන්න.
[24] ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත), 19 ඡේදය ද බලන්න.
[25] ශ්‍රීලවිප්‍ර 580, *ලිඛිත නියෝජනයවීම්*
[26] ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) *පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ සන්නිවේදනය*, 16(අ) ඡේදය.
[27] ශ්‍රීලවිප්‍ර 265, 9 වන ඡේදය

පාර්ශ්ව සමඟ සමහර කරුණු පිළිබඳව සන්නිවේදනය කිරීමට නීතිය හෝ රෙගුලාසි මගින් විගණකට අවශ්‍ය කෙරේ. (යොමුව ඃ අ146-අ148 ඡේද)

**ලේඛණගත කිරීම**

39. විගණන ලේඛණගත කිරීම තුළ විගණක ඇතුළත් කළ යුතු දෑ.[28] (යොමුව ඃ ඡේද අ149-අ152)

(අ) අස්තිත්ත්වයේ ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සම්බන්ධිත අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනය ඇතුළුව අස්තිත්ත්වය සහ එහි පරිසරයේ විගණකගේ අවබෝධය අනුව ප්‍රධාන මූලිකාංග;

(ආ) සැඳහුම් මට්ටමේදී[29] එම අවදානම්වල තක්සේරුවට දී ඇති හේතු (ආවේණික අවදානමකට හෝ පාලන අවදානමකට සම්බන්ධිතද) සැළකිල්ලට ගෙන ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම සමඟ තවදුරටත් වන විගණකගේ විගණන ක්‍රියාපටිපාටිවලට සම්බන්ධකය;

(ඇ) ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය ඇමතීමට හෝ අවබෝධ කරගැනීමට කළමනාකාරිත්වය යෝග්‍ය පියවර ගෙන නොමැතිව විගණකගේ ප්‍රතිචාර(ය)

(ඈ) 32 වන ඡේදයෙන් අවශ්‍යකරන පරිදි, කිසිවක් වේනම්, ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සම්බන්ධිත කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂග්‍රාහීවීම්වලට හැඟවීම් සහ විගණනය සඳහා හඟවනු දෑ පිළිබඳ විගණකගේ ඇගයීම; සහ

(ඉ) අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සාධාරණද, හෝ අවප්‍රකාශ වී ඇත්ද යන්න විගණකගේ නිර්ණය කිරීමට සම්බන්ධිත සැලකිය යුතු අන්දමේ විනිශ්චයන්.

**භාවිත කිරීම සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු**

**ගිණුම්කරණ ඇස්තමේන්තුවල ස්වභාවය** (යොමුව ඃ 2වන ඡෙදය)

*ගිණුම්කරණ ඇස්තමේන්තුවලට උදාහරණ*

අ1. ගනුදෙනු පන්ති, ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම්වලට සම්බන්ධිත ගිණුම්කරණ ඇස්තමේන්තුවල උදාහරණ වලට ඇතුළත් වන්නේඃ

- තොග භාවිතයෙන් ගිලීයාම.
- දේපොළ සහ උපකරණ ක්ෂයවීම.
- යටිතල පහසුකම් වත්කම් ඇගයීම.
- මූල්‍ය සාධන පත්‍ර ඇගයීම.
- නොවිසඳී ඇති නඩුකීමක ප්‍රතිඵලය.
- අපේක්ෂිත ණය හානි සඳහා ප්‍රතිපාදන.
- රක්ෂණ ගිවිසුම් වගකීම් අගය කිරීම.
- ප්‍රතිඥාභාර බැඳියාවන්.
- සේවක විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්
- කොටස් පදනම් ගෙවීම්.
- කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් නිර්ණය කිරීම ඇතුළුව ව්‍යාපාර සංයෝජනයකදී අත්කරගත් වත්කම් සහ වගකීම්වල සාධාරණ අගය.
- බැහැර කිරීම සඳහා තබාගෙන ඇති දීර්ඝ - ජීව කාලයක් ඇති වත්කම් හෝ දේපොළ හෝ උපකරණවල හානිකරණය
- ස්වාධීන පාර්ශ්ව අතරේ වත්කම් හෝ වගකීම්වල මූල්‍ය නොවන හුවමාරු වීම්
- දීර්ඝ කාලීන කොන්ත්‍රාත් සඳහා අයභාරය හඳුනාගැනීම

---

28 ශ්‍රීලවිප්‍ර 230, *විගණන ලේඛණගතකිරීම* 8-11, අ6, අ7 සහ අ10 ඡේද.

29 ශ්‍රීලවිප්‍ර 330, 28(ආ) ඡේදය

*ක්‍රම*

අ2. ක්‍රමයක් යනු අවශ්‍යකරණ මැනීමේ පදනම සමග අනුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමට කළමනාකාරිත්වය විසින් භාවිත කරන මැනීමේ ශිල්ප ක්‍රමයක් වේ. උදාහරණ ලෙස කොටස් පදනම මත ගෙවීමේ ගනුදෙනුවකට සම්බන්ධිත ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමට භාවිත කළ හැකි තනි පිළිගත් න්‍යායාත්මක විකල්ප කැඳවුම් මිල නිර්ණය කිරීමට බ්ලැක්-ස්කෝල්ස් (Black-Scholes) මිල කිරීමේ සූත්‍රය භාවිත කිරීමය. ආගණනය කිරීමේ මෙවලමක් හෝ ක්‍රියාවලියක් භාවිත කර ව්‍යවහාර කරන ක්‍රමයක් සමහර අවස්ථාවලදී ආදර්ශයක් ලෙස හැඳින්වෙන අතර, ඒ සඳහා උපකල්පන සහ දත්ත ව්‍යවහාර කිරීම සහ ඒවා අතර සම්බන්ධ කට්ටලයක් සැළකිල්ලට ගැනීම සම්බන්ධ කර ගැනේ.

*උපකල්පන හා දත්ත*

අ3. පොලී අනුපාතිකයක්. වට්ටම් අනුපාතිකයක් හෝ අනාගත තත්ත්වයන් හෝ සිද්ධීන් පිළිබඳ විනිශ්චයන් තේරීමක් ලෙස ඇති කරුණු පිළිබඳව ලබාගත හැකි තොරතුරු මත පදනම්ව විනිශ්චයන් උපකල්පන වලට අවශ්‍ය කෙරේ. යෝග්‍ය විකල්ප පරාසයකින් කළමනාකාරිත්වය විසින් විකල්පයක් තෝරා ගත හැකිය. කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් සිදුකළ හෝ ඔහු විසින් හඳුනාගත් උපකල්පන ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් භාවිත කරන විට ඒවා කළමනාකාරිත්වයේ උපකල්පන බවට පත්වේ.

අ4. ඍජු නිරීක්ෂණ මගින් හෝ අස්තිත්ත්වයට බාහිර පාර්ශ්වයකින් මගින් ලබාගත හැකි තොරතුරු මෙම ශ්‍රීලවිප්‍රයේ අරමුණු සඳහා දත්ත වේ. විශ්ලේෂණාත්මක හෝ අර්ථ නිරූපණය පදනම් කළ ශිල්ප ක්‍රම ව්‍යවහාර කිරීම මගින් ලබාගත් දත්ත උපදවාගත් දත්ත ලෙස හැඳින්වේ. එවැනි ශිල්ප ක්‍රමවලට මනාව පිළිගත් න්‍යායාත්මක පදනමක් ඇතිවිට සහ එබැවින් ඒ සඳහා කළමනාකාරිත්වයේ විනිශ්චය ඉතා අඩුය. එසේ නොවන්නේ නම් එවැනි තොරතුරු උපකල්පන වේ.

අ5. දත්තවල උදාහරණවල ඇතුළත් වන්නේඃ

- වෙළඳපොළ ගනුදෙනු වලදී එකඟ වූ මිල ගණන්;
- නිෂ්පාදන යන්ත්‍රයකින් නිමවුමේ ප්‍රමාණයන් හෝ මෙහෙයුම් කාල;
- ගිවිසුම්ගත පොළී අනුපාතික, ගෙවීමේ උපලේඛණ සහ ණය ගිවිසුමක ඇතුළත් කොන්දේසි වැනි, ගිවිසුමක ඇතුළත්, ඓතිහාසික මිල ගණන් හෝ වෙනත් කොන්දේසි;
- බාහිර මූල්‍ය තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් ආර්ථික හෝ ඉපයීම් පුරෝකථක තොරතුරු වැනි ඉදිරි දැක්මක් ඇති තොරතුරු, හෝ
- ඉදිරි පොලී අනුපාතික වලින් අන්තර් නිවේශණ ශිල්ප ක්‍රම (උපදවා ගත් දත්ත) භාවිතයෙන් නිර්ණය කළ අනාගත පොලී අනුපාතික.

අ6. දත්ත පුළුල් පරාසයක මූලාශ්‍ර වලින් ළඟා විය හැකිය. උදාහරණ ලෙස දත්තඃ

- ආයතනය තුළ හෝ බාහිරව උත්පාදනය වූ;
- එක්කෝ පොදු හෝ උපයෝගී ලෙජර් තුළින් හෝ බාහිරව හෝ ඒවා තුළ වන පද්ධතියකින්
- ගිවිසුම් තුළ නිරීක්ෂණය වන; හෝ
- ව්‍යවස්ථානුකූල හෝ නියාමන ප්‍රකාශ තුළ නිරීක්ෂණය වන ක්‍රමවලින් ලබා ගත හැකිය.

*පරිමාණගත කිරීම* (යොමුව ඃ 3 වන ඡේදය)

අ7. මෙම ශ්‍රීලවිප්‍රයේ අවශ්‍යතාවයන් එම මග පෙන්වීම් අඩංගු උදාහරණ ඇතුළත් වෙළඳපොළ පරිමාණුගත කිරීම කෙසේ කරන්නේ ද යන්න ඇතුළත් ඡේද වන්නේ අ20-අ22, අ63, අ67 සහ අ84 වේ.

**මෙම ශ්‍රීලවිප්‍රයේ ප්‍රධාන සංකල්ප**

*ආවේණික අවදානම් සාධක* (යොමුව ඃ 4 වන ඡේදය)

අ8. පාලන පිළිබඳ සැළකිල්ලට ගැනීමට පෙර සැදහුමක් අවප්‍රකාශයකට නැඹුරු වීමට බලපෑ හැකි සිද්ධීන් සහ තත්ත්වයන්හි ගතිලක්ෂණ ආවේණික අවදානම් සාධක වේ. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී සහ මූල්‍ය ප්‍රකාශ තුළ ඒවායේ ඉදිරිපත් කිරීමේ සම්බන්ධය තුළ, මෙම ආවේණික අවදානම් සාධකවල ස්වභාවය සහ ඒවායේ අන්තර් සබඳතාවය පිළිබඳ විස්තර තවදුරටත් 1 වන පරිශිෂ්ඨයේ කෙරේ.

අ9. ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීමේදී හෝ තක්සේරු කිරීමේදී, විගණක සැළකිල්ලට ගතහැකි, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක්, ආවේණික අවදානම් සාධක සංකීර්ණතාවය හෝ පුද්ගලගතභාවය වෙනත් ආවේණික අවදානම් සාධක වලට අමතරව, ගිණුම්කරණ ඇස්තමේන්තු යටත්විය හැකි හෝ බලපෑ හැක්කේ කුමන ප්‍රමාණයට යන්න පහත දෑ මගින් ඇතුළත් විය හැකිය.

- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමට භාවිත කළ ක්‍රම, උපකල්පන හෝ භාවිත කළ දත්ත තුළ වෙනස්වීම් වල අවශ්‍යතාවයට හේතුවිය හැකි, අදාළමූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් හෝ අදාළ මූල්‍ය ප්‍රකාශයක අයිතම වල ස්වභාවය හෝ තත්ත්වයන්හි වෙනස්වීම්.
- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වයට පක්ෂග්‍රාහී බව හෝ වංචා නිසා අවප්‍රකාශයකට නැඹුරු වීම.

*පාලන අවදානම* (යොමුව : 6 වන ඡේදය)

අ10. සැදහුම් මට්ටමේදී පාලන අවදානම තක්සේරු කිරීම තුළ විගණක සඳහා ප්‍රධාන සැළකිල්ලට ගැනීමක් වන්නේ, සැදහුම් මට්ටමේදී තක්සේරු කළ ආවේණික අවදානම් අමතන පාලන සහ විගණක විශ්වාසය තැබීමට කුමන ප්‍රමාණයකට අපේක්ෂා කරන්නේ දී සහ සැලසුම්කළ පාලනයන්හි සඵලදායකත්වය මතය. එම පාලන සඵලදායක ලෙස සැලසුම් කර ඇති සහ ඉටු කර ඇති බවට විගණකගේ අගය කිරීම, ඒවා පරීක්ෂා කලයුතු ද යන්න නිර්ණය කිරීමේ පාලන වල මෙහෙයුම් සඵලදායකත්වය පිළිබඳ අපේක්ෂාවන් සහාය වේ.

*වෘත්තිය සංශය දෘෂ්ඨිය* (යොමුව : 8 වන ඡේදය)

අ11. විගණකට වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිත කළ හැක්කේ කුමන ක්‍රම වලින්දැයි විස්තර කරන උදාහරණ සඳහා වන ඡේද වන්නේ අ60, අ95, අ96, අ137 සහ අ139 ඡේද වේ. විගණකගේ වෘත්තිය සංශය දෘෂ්ඨිය භාවිත කිරීම ලේඛනගත කළ හැක්කේ කුමන ක්‍රමවලින් ද යන්න මත මග පෙන්වීම අ152 ඡේදයෙන් ලබාදෙන අතර වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිත කිරීම සඳහා ලේඛණගත කිරීම සාක්ෂි ලබාදිය හැකි, මෙම ශ්‍රීලවිප්‍රයේ ඡේද සඳහා නිශ්චිත ඡේද සඳහා උදාහරණ ඇතුළත් වේ.

*"සාධාරණබවේ" සංකල්පය* (යොමුව : අ9, 35 ඡේද)

අ12. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සාධාරණ ද යන්න විගණකගේ සැළකිල්ලට ගැනීමට අදාළ වියහැකි වෙනත් සැළකිල්ලට ගැනීම්වල ඇතුළත් විය හැක්කේ;

- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ දී භාවිතා කළ දත්ත සහ උපකල්පන සෑම එකක් සමඟ හෝ අස්තිත්වයේ ව්‍යාපාර කටයුතුවල ක්ෂේත්‍රවල හෝ වෙනත් ගිණුම්කරණ ඇස්තමේන්තුවල භාවිත කළ දෑ සමඟ සංගත බව; සහ
- අදාළ මූල්‍ය ආකෘතිමය රාමුව මගින් අවශ්‍යකරණ ලෙස යෝග්‍ය තොරතුරු ගිණුම්කරණ ඇස්තමේන්තු සැළකිල්ලට ගැනීම.

අ13. "යෝග්‍ය පරිදි ව්‍යවහාර කිරීම" යන පදය ලෙස 9 වන ඡේදයේ භාවිත කළ ආකාරය ලෙස යන්නෙන් අදහස් වන්නේ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව වන බව පමණක් නොව එසේ කිරීමේදී එම ආකෘතිමය රාමුවේ මැනීමේ පදනමේ අරමුණු සමඟ සංගත වන විනිශ්චයන් පිළිබිඹු වන ආකාරයට ය.

## නිර්වචන

*ගිණුම්කරණ ඇස්තමේන්තු* (යොමුව : 12(අ) ඡේදය)

අ14. ගිණුම්කරණ ඇස්තමේන්තු යනු මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත් හෝ හෙළිදරව් කළ පන්තිවලට සම්බන්ධිත විය හැකි ගනුදෙනු හෝ ගිණුම් ශේෂයක මූල්‍ය වටිනාකම් ය. ගනුදෙනු හෝ ගිණුම් ශේෂ පන්තියකට සම්බන්ධ හඳුනාගැනීම හෝ හෙළිදරව් කිරීම පිළිබඳ විනිශ්චයක් කිරීමට භාවිතා කළ හෝ හෙළිදරව් කිරීම ඇතුළත් කළ මූල්‍ය වටිනාකම් ද එලෙසම ගිණුම්කරණ ඇස්තමේන්තුවල ඇතුළත් වේ.

*විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය* (යොමුව : 12(ආ) ඡේදය)

අ15. විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය භාවිතා කළ හැක්කේ ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සෘජුව (උදාහරණ ලෙස වෙනස් වර්ගවල මූල්‍ය සාධන පත්‍රවල හානිකරන ප්‍රතිපාදනය හෝ සාධාරණ අගය ඇස්තමේන්තු කිරීමට) හෝ වක්‍රව (උදාහරණ ලෙස, ගිණුම්කරණ ඇස්තමේන්තුවක්

සඳහා සැලකිය යුතු අන්දමේ උපකල්පනයක් ලෙස වටිනාකමක් භාවිතා කිරීමට) ඇස්තමේන්තු කිරීමට ය. මූල්‍ය නොවන අයිතමයක දත්ත හෝ උපකල්පනයක් අගය කිරීමේදී (උදාහරණ ලෙස වත්කමක ඇස්තමේන්තු කළ ප්‍රයෝජ්‍ය ජීවිත කාලය) වටිනාකම් පරාසය හෝ වටිනාකමක් සංවර්ධනය කිරීමේදී විගණක විසින් ඒ හා සමාන පිවිසුම් මගක් විගණක ගත හැකිය.

*ඇස්තමේන්තු කිරීමේ අනියතතා* (යොමුව ඃ 12 (ඇ) ඡේදය)

අ16. සියලුම ගිණුම්කරණ ඇස්තමේන්තු ඉහළ මට්ටමක ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයකට යටත් නොවේ. උදාහරණ ලෙස මිල ගණන්වල සත්‍ය හෝ හුවමාරු සිදුවන කරදරයක් නොමැතිව ලබාගත හැකි සහ විශ්වාසදායක තොරතුරු ලබාදෙන සක්‍රීය සහ විවෘත වෙළඳපොළ තුළ ඇති සමහර අයිතම මූල්‍ය ප්‍රකාශවල තිබිය හැකිය. කෙසේ වෙතත් අගය කිරීමේ ක්‍රම සහ දත්ත නිසි අන්දමින් නිර්වචනය කර තිබුණේ වුවද ඇස්තමේන්තු කිරීමේ අනියතතා තිබිය හැකිය. උදාහරණ ලෙස සක්‍රීය සහ විවෘත වෙළඳපොලක මිල කියුම් ලත් සුරකුම්පත් අගය කිරීමේදී දරාගෙන සිටින සුරකුම්පත් ප්‍රමාණය සැලකිය යුතු නම් හෝ අලෙවි කරගත හැකි බව සීමාවන් වලට යටත් වන්නේ නම් ලැයිස්තුගත වෙළෙඳපොළ මිල ගණන් වලට ගැළපුම් කිරීමට සිදුවේ. මෙයට අමතරව කිසියම් කාලයක පවත්නා පොදු ආර්ථික වාතාවරණයන්, උදාහරණ ලෙස විශේෂ වෙළඳපොලක ද්‍රවශීලතාවය නොමැතිකම ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට බලපෑමක් විය හැකිය.

*කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීබව* (12 (ඇ) ඡේදය)

අ17. මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු බොහෝවිට මධ්‍යස්ථතාවයට ඇරයුම් කරයි. එනම් පක්ෂග්‍රාහීබවෙන් නිදහස් වීම වේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී ඇස්තමේන්තු කිරීම් අනියතතාවය පුද්ගලගතභාවය හටගැන්වීමට හේතු වේ. පුද්ගලගතභාවය පැවැත්ම කළමනාකාරිත්වය විසින් කරන විනිශ්චය අවශ්‍යතාවය හටගැන්වීම සඳහා සහ චේතනාන්විතව හෝ අචේතනිය කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීත්වය වෙත නැඹුරු කළ හැකිය. (උදාහරණයක් ලෙස ඕනෑ කරන ලාභ ඉලක්කයක් හෝ ප්‍රාග්ධන අනුපාතයන් අත්කරගැනීමට වන අභිප්‍රේරණයේ ප්‍රතිඵලයක් වශයෙන්) ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී පුද්ගලගතභාවයේ ප්‍රමාණයේ තරම සමඟ ගිණුම්කරණ ඇස්තමේන්තුවේ කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීවීම වැඩිවේ.

*ගිණුම්කරණ ඇස්තමේන්තුවක ප්‍රතිඵලය* (යොමුව ඃ 12 (ඉ) ඡේදය)

අ18. සමහර ගිණුම්කරණ ඇස්තමේන්තු ඒවායේ ස්වභාවය මගින් මෙම ශ්‍රීලවිප්‍ර ය සමග අනුකූලව විගණකගේ ඉටුකළ වැඩ සඳහා අදාළ ප්‍රතිඵලය නොතිබේ. උදාහරණයක් ලෙස එක්තරා වේලාවක වෙළඳපොළ සහභාගී වන්නන්ගේ අවබෝධය මත ගිණුම්කරණ ඇස්තමේන්තුවක් පදනම් විය හැකිය. ඒ අනුව වත්කම විකුණුවිට හෝ වගකීම පැවරුවිට උපලබ්ධි වූ මිල වෙනස්ය. වාර්තා කළ දිනයේ සිදුකළ සම්බන්ධිත ගිණුම්කරණ ඇස්තමේන්තුවේ කාලය ඉක්මවීමත් සමග වෙළඳපොළ සහභාගී වන්නන්ගේ අවබෝධයේ වටිනාකම වෙනස් වී ඇත.

## අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාවන්

*අස්තිත්ත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම* (යොමුව ඃ 13 වන ඡේදය)

අ19. ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) හි 11 - 24 ඡේදවලින් අස්තිත්ත්වය සහ එහි පරිසරය පිළිබඳ අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලන ඇතුළුව නියත කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට විගණකට අවශ්‍ය කෙරේ. මෙම ශ්‍රීලවිප්‍රයේ 13 වන ඡේදයේ අවශ්‍යතාවයන් වඩාත් විශේෂිතව සම්බන්ධ වන්නේ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සහ ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) තුළවන පුළුල් අවශ්‍යතාවයන් ගොඩනැගීමටය.

පරිමාණගත කිරීම

අ20. අස්තිත්ත්වයේ සහ එහි පරිසරයේ අවබෝධයක් ලබාගැනීමට, අස්තිත්ත්වයේ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලන ඇතුළුව විශාල ප්‍රමාණයකට අඩු ප්‍රමාණයකට රඳා පැවතිය හැක්කේ පවත්නා තත්ත්වයන් එක් එක් කරුණු(නක්) ව්‍යවහාර කරන ප්‍රමාණය විගණකගේ ක්‍රියාපටිපාටිවල ස්වභාවය කාල නිර්ණය හෝ ප්‍රමාණය මත රඳා පවතී. උදාහරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා අවශ්‍යතාවය හට ගන්වන ගනුදෙනු ස්වල්පයක් හෝ වෙනත් සිද්ධීන් හෝ තත්ත්වයන් අස්තිත්ත්වයකට තිබිය හැකිය. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීම් සරල විය හැකි අතර අදාළ නියාමන සාධක නොතිබිය හැකිය. තවද, ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සැලකිය යුතු අන්දමේ විනිශ්චයන් අවශ්‍ය නොවිය හැකි අතර ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලිය සංකීර්ණ බවෙන් අඩු විය හැක. මෙවැනි තත්ත්වයන්හිදී ගිණුම්කරණ ඇස්තමේන්තු, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය සංකීර්ණත්වය පුද්ගලගතභාවය හෝ

වෙනත් ආවේණික අවදානම් සාධකයන්ට මගින් බලපෑ හැක්කේ හෝ යටත් විය හැක්කේ කුඩා ප්‍රමාණයකටය සහ විගණනයට අදාළ පාලන ඉතා ස්වල්ප විය හැකිය. එසේනම් විගණකගේ අවදානම් තක්සේරු ක්‍රියාවලිය විස්තීර්ණ බවෙන් අඩුවිය හැකි අතර මූල්‍ය ප්‍රකාශ සඳහා වගකිව යුතු යෝග්‍ය කළමනාකාරිත්වයෙන් විමසීම් කිරීම තුළින් සහ ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියේ කළමනාකාරිත්වයේ සරල ඔස්සේ ගමන් කිරීමෙන් ප්‍රාථමිකව ලබාගත හැකිය.

අ21. එයට වෙනස්ව, ගිණුම්කරණ ඇස්තමේන්තු කළමනාකාරිත්වය විසින් සිදු කරන සැලකිය යුතු අන්දමේ විනිශ්චයන් අවශ්‍යවිය හැකි අතර ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලිය සංකීර්ණවිය හැකි අතර, සංකීර්ණ ආදර්ශ භාවිත කිරීම සම්බන්ධකර ගැනේ. එයටම අමතරව අස්තිත්ත්වයට වඩාත් අසංකලිෂ්ට තොරතුරු පද්ධතියක් සහ ගිණුම්කරණ ඇස්තමේන්තු හරහා වඩා විස්තීර්ණ පාලන තිබිය හැකිය. මෙම තත්ත්වයන් තුළ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට පුද්ගලගතභාවයට සංකීර්ණතාවයට හෝ වෙනත් ආවේණික අවදානම් සාධකවලට යටත් විය හැකි හෝ බලපෑම්වලට ලක්විය හැකිය. එසේ වන්නේ නම්, විගණකගේ අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටිවල ස්වභාවය හෝ කාල නිර්ණය අ20 ඡේදයේ වන තත්ත්වයනට වඩා වෙනස් විය හැකි හෝ වඩාත් විස්තීර්ණ විය හැකිය.

අ22. කුඩා අස්තිත්ත්ව ගණනාවක් තිබිය හැකි සරල ව්‍යාපාරික කටයුතු පමණක් ඇති අස්තිත්ත්ව සඳහා පහත සඳහන් සැළකිල්ලට ගැනීම් අදාළ විය හැකිය.

- ව්‍යාපාරික කටයුතු සරල හෝ අවශ්‍ය කරන ඇස්තමේන්තුවල ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය ඉතා අඩු ප්‍රමාණයක තිබීම නිසා ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා අදාළ ක්‍රියාවලිය සංකූලවිය නොහැකිය.
- ගිණුම්කරණ ඇස්තමේන්තු පොදු සහ උපයෝගී ලෙජරවලින් බාහිරව උත්පාදනය විය හැකිය. ඒවා මත සංවර්ධනය සීමිත විය හැකිය. සහ ඒවා නිර්ණය කිරීම මත සැලකිය යුතු අන්දමේ බලපෑමක් හිමිකරු, - කළමනාකරුට තිබිය හැකිය. ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම හඳුනා ගන්නා විට සහ කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී බවේ අවදානම් සැළකිල්ලට ගැනීම යන කරුණු දෙකේදීම ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ හිමිකරු - කළමනාකරුගේ භූමිකාව විගණක සැළකිල්ලට ගැනීම අවශ්‍ය විය හැකිය.

අස්තිත්ත්වය සහ එහි පරිසරය

අස්තිත්ත්වයේ ගනුදෙනු සහ වෙනත් සිද්ධීන් සහ තත්ත්වයන් (යොමුව : 13 (අ) ඡේදය)

අ23. ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීමට හෝ අවශ්‍යතාවයක් හට ගැන්මට විය හැකි පවත්නා තත්ත්වයන් තුළ වෙනස්වීම් සඳහා උදාහරණ වලට ඇතුළත්; පහත දෑ වන්නේද

- නව මාදිලිවල ගනුදෙනු සමඟ අස්තිත්ත්වය නියැලී සිටී ද;
- ගනුදෙනුවල කොන්දේසි වෙනස්වී ද; හෝ
- නව සිද්ධීන් හෝ තත්ත්වයන් සිදුවී ඇත් ද.

අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් (යොමුව : 13 (ආ) ඡේදය)

අ24. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන්හි අවබෝධයක් ලබාගැනීමේදී ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළ එම අවශ්‍යතාවයන් කළමනාකාරිත්වය ව්‍යවහාර කළේ කෙසේද සහ ඒවා යෝග්‍ය පරිදි ව්‍යවහාර කළේද යන්න සඳහා විගණකගේ නිර්ණය පිළිබඳ සහ කළමනාකාරිත්වය සමඟ සහ යෝග්‍ය වන පරිදි පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ සාකච්ඡාවක් සඳහා පදනම විගණකට ලබාදෙයි. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව යටතේ පිළිගත හැකි වැදගත් ගිණුම්කරණ පරිචයක් අස්තිත්ත්වයේ[30] පවත්නා තත්ත්වයන් තුළ වඩාත් යෝග්‍ය පරිචයක් නොවන බව විගණක සැළකිල්ලට ගන්නාවිට මෙම අවබෝධය එසේම පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ විගණකට සන්නිවේදනයේ දී උපකාරී වේ.

අ25. මෙම අවබෝධය ලබා ගැනීමේදී. විගණක පහත දෑ වන්නේද යන්න පිළිබඳ අවබෝධයක් ලබාගැනීම අපේක්ෂා කෙරේ.

- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවඃ
  - ගිණුම්කරණ ඇස්තමේන්තු හි මැනීම සඳහා හඳුනාගැනීම සඳහා නියත නිර්නායක හෝ ක්‍රම නියම කරයි;

---

[30] ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) 16(අ) ඡේදය.

- ° සාධාරණ අගයට මැනීමට අවසර දෙන හෝ අවශ්‍ය කරන නියත නිර්ණායක නියම කරයි. උදාහරණ ලෙස වත්කමකට හෝ වගකීමකට, සම්බන්ධයෙන් ගත යුතු නියත ක්‍රියාමාර්ග ඉටු කිරීම් කළමනාකාරිත්වයේ අභිප්‍රාය අවධානය යොමු කිරීම මගින්; හෝ
- ° විනිශ්චයන්, උපකල්පන හෝ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත ඇස්තමේන්තු කිරීමේ අනියතතා හි වෙනත් මූලාශ්‍ර සැලකිලිමත්කමක් දක්වමින් හෙළිදරව් කිරීම ඇතුළත්ව අවශ්‍යකරන හෝ යෝජිත හෙළිදරව් කිරීම් නියම කිරීම්; සහ

- අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ වෙනස්වීම්, අස්තිත්ත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට සම්බන්ධිත ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීමට අවශ්‍ය කෙරේ.

නියාමන සාධක (යොමුව : 13(ඇ) ඡේදය)

අ26. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළ නියාමන සාධක කිසිවක් වේනම් ඒවායේ අවබෝධයන් ලබාගැනීමට, අදාළ නියාමන ආකෘතිමය රාමු හඳුනාගැනීමේදී විගණකට උපකාරී විය හැකිය. (උදාහරණ ලෙස, බැංකුකරණය සහ රක්ෂණ කර්මාන්තවල විචක්ෂණයෙන් කටයුතු කරන අධීක්ෂකයන් විසින් ස්ථාපිත නියාමන ආකෘතිමය රාමු) සහ එවැනි නියාමන ආකෘතිමය රාමු(වක්) පහත දැ නිරීක්ෂණය කිරීමේදීඃ

- ගිණුම්කරණ ඇස්තමේන්තු මැනීම සඳහා, ක්‍රම හෝ හඳුනා ගැනීම සඳහා තත්ත්වයන් අමතයිද හෝ ඒ මත සම්බන්ධිත මග පෙන්වීම් ලබා දෙයිද;
- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයනට අමතරව, හෙළිදරව් කිරීම් පිළිබඳව මග පෙන්වීම් නියම කරයිද හෝ ලබාදෙයිද;
- නියාමන අවශ්‍යතාවයන් සපුරාලීමට කළමනාකාරිත්වයේ පක්ෂපාතී බව සඳහා හඟවන ක්ෂේත්‍ර තිබීමේ හැකියාව පිළිබඳ ඇඟවීම් ලබා දී ඇත්ද; හෝ
- ප්‍රමාණාත්මක අවප්‍රකාශයක වියහැකි අවදානම් ඇඟවිය හැකි, අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ. අවශ්‍යතාවයන් සමග සංගත නොවන නියාමන අරමුණු සඳහා අවශ්‍යතාවයන් අඩංගුවේදී යන්න. උදාහරණ ලෙස අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවෙන් අවශ්‍යකරන එම අපේක්ෂිත ණයහානි ප්‍රතිපාදනය ඉක්මවීම සඳහා අවම මට්ටමට බලපෑම් කිරීමට සොයා බැලිය හැකි සමහර නියාමනයන්.

මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් කිරීමට විගණක අපේක්ෂා කරන ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල ස්වභාවය (යොමුව : 13 (ඇ) ඡේදය.

අ27. අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ තුළ විගණක ඇතුළත් කිරීමට අපේක්ෂා කරන ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල ස්වභාවය අවබෝධකර ගැනීමේදී එවැනි ගිණුම්කරණ ඇස්තමේන්තුවල මැනීමේ පදනම සහ අදාළ විය හැකි හෙළිදරව් කිරීම්වල ස්වභාවය සහ ප්‍රමාණය විගණකගේ අවබෝධය ලබාගැනීමේදී උපකාරී වේ. කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තු කරන්නේ කෙසේද යන්න පිළිබඳව කළමනාකාරිත්වය සමග සාකච්ඡාවක් සඳහා එවැනි අවබෝධ කර ගැනීමක් විගණකට පදනමක් ලබාදෙයි.

*විගණනයට සම්බන්ධිත අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනය*

අධීක්ෂණයේ සහ පාලනයේ ස්වභාවය සහ ප්‍රමාණය (යොමුව : අ13 (අ) ඡේදය)

අ28. ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) ව්‍යවහාර කිරීමේදී,[31] ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකාරිත්වයේ ක්‍රියාවලිය මත පිහිටුවා ඇති අස්තිත්ත්වයක් අධීක්ෂණය සහ පාලනයේ ස්වභාවය සහ ප්‍රමාණය විගණකට අවබෝධ කර ගැනීම සඳහා විගණකගේ අවශ්‍ය කරන ඇගයීමට වැදගත් විය හැකි ඒවාට සම්බන්ධ පහත දැ වන්නේ ද;

- කළමනාකාරීත්වය පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග අවංකභාවයේ ශිෂ්ටත්වයක් සහ ආචාරධර්ම චර්යාවක් ඇතිකර සහ පවත්වාගෙන ගියේ ද; සහ
- පාලන පරිසරයේ මූලිකාංගවල ප්‍රබලතාවයත් අභ්‍යන්තර පාලනයේ අනෙක් සංරචක සඳහා යෝග්‍ය අඩිතාලමක් සාමූහිකව ද ලබාදෙන්නේ ද සහ පාලන පරිසරය තුළ ඇති ඌණතා මඟින් එම වෙනත් සංරචක පිළිගැනීමට රහසින් හානි කරයිද,

31 ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත), 14 වන ඡේදය)

අ29. පාලනය පිළිබඳ වගකිව යුතු අය පහත දෑ පිළිබඳ විගණක අවබෝධයක් ලබාගත හැකියඃ

- ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමට හෝ අවදානම් සම්බන්ධිත ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමට විශේෂ ක්‍රමයක හෝ ආදර්ශයක ගති ලක්ෂණ අවබෝධ කරගැනීමට දැනුම හෝ නිපුණතාවය තිබේද. උදාහරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා භාවිත කරන ක්‍රමයට හෝ තොරතුරු තාක්ෂණයට සම්බන්ධිත අවදානම්;
- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තු කළේ ද යන්න අවබෝධ කර ගැනීමට නිපුණතාවය සහ දැනුම තිබේද;
- කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම කළේ කෙසේද යන්න අගය කිරීමට කාලෝචිත පදනමක් යටතේ අවශ්‍ය කරන තොරතුරු තිබේද සහ කළමනාකාරිත්වයේ ප්‍රමාණවත් නොවන අයෝග්‍ය වන බව පෙනෙන කළමනාකාරිත්වයේ ක්‍රියා ප්‍රශ්න කිරීමට අධිකාරිය තිබේද, කළමනාකාරිත්වයෙන් ස්වාධීන ද;
- ආදර්ශ භාවිත කිරීම ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ කළමනාකාරිත්වයේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම; හෝ
- කළමනාකාරිත්වය භාරගෙන ඇති ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම. මෙයට ගිණුම්කරණ ඇස්තමේන්තු මත පාලනයන්හි මෙහෙයුම් සඵලදායකත්වය හෝ සැලසුම් කිරීමේදී යම් ඌණතාවයන් අනාවරණය කරගැනීම සහ නිවැරදි කිරීමට සැලසුම් කළ සමාලෝචන ක්‍රියාපටිපාටි සහ අධීක්ෂණය මෙයට ඇතුළත් විය හැකිය.

අ30. පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ අධීක්ෂණය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම ගිණුම්කරණ ඇස්තමේන්තුවල පහත තත්ත්වයන් යටතේ වැදගත් විය හැකිය.

- පුද්ගලගතභාවය ඇමතීමට කළමනාකාරිත්වය විසින් සැලකිය යුතු අන්දමේ විනිශ්චයක් අවශ්‍ය වීම;
- ඉහළ ඇස්තමේන්තු කිරීමේ අවදානමක් තිබීම;
- සිදුකිරීම් සංකීර්ණ වීම, උදාහරණ ලෙස තොරතුරු තාක්ෂණය පෘථුල ලෙස භාවිතය නිසා විශාල පරිමාවක දත්ත හෝ බහු ආංශික දත්ත ප්‍රභව භාවිතා කිරීම හෝ සංකීර්ණ අන්තර් සබඳතා සමඟ උපකල්පන;
- තිබෙන හෝ තිබීමට යෝග්‍ය ක්‍රමයක උපකල්පනයක හෝ දත්ත පූර්ව කාල පරිච්ඡේද සමඟ සන්සන්දනය කිරීමේදී වෙනසක්; හෝ
- සැලකිය යුතු අන්දමේ උපකල්පන අවශ්‍ය කිරීම.

කළමනාකාරිත්වයේ විශේෂඥයා භාවිත කිරීම ඇතුළුව කළමනාකාරිත්වයේ විශේෂඥ නිපුණතාව හෝ දැනුම ව්‍යවහාර කිරීම (යොමුව ඃ 13 (ආ) ඡේදය)

අ31. කළමනාකාරිත්වය විශේෂඥයකු සේවයේ නියුක්ත කිරීමේ අවශ්‍යතාවයේ සම්භාව්‍යතාවය දී පහත සඳහන් තත්ත්වයන්හිදී වැඩි වේ දැයි අස්තිත්වය සැළකිල්ලට ගත යුතුය.[32]

- ඇස්තමේන්තු කිරීම අවශ්‍ය කරන කරුණේ විශේෂඥ ස්වභාවය උදාහරණ වශයෙන් ඛනිජ හෝ හයිඩ්‍රෝකාබන් (hydrocarbon) නිදි නිස්සාරණ කර්මාන්ත හෝ සංකීර්ණ ගිවිසුම්ගත කොන්දේසි ව්‍යවහාරකරනයේදී විය හැකි ප්‍රතිඵලය අගය කිරීම මැනීම සම්බන්ධ වන ගිණුම්කරණ ඇස්තමේන්තු.
- එක්තරා මැනීමේ අවස්ථාවක් තුළ වුවත් තුන්වන මට්ටමේ සාධාරණ අගයන්[33] මැනීම වැනි අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අදාළ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමට අවශ්‍ය කරන ආදර්ශවල සංකීර්ණ ස්වභාවය
- අසාමාන්‍ය හෝ කලාතුරකින් වන ස්වභාවයේ තත්ත්වයන් ගනුදෙනු හෝ සිද්ධීන් අවශ්‍ය කරන ගිණුම්කරණ ඇස්තමේන්තු.

---

32 ශ්‍රීලවිප්‍ර 500, 8වන ඡේදය.
33 උදාහරණ සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත බලන්න. ශ්‍රීලගිප්‍ර 13, *සාධාරණ අගය මැනීම.*

අස්තිත්වයේ අවදානම් තක්සේරු ක්‍රියාවලිය (යොමුව : 13(ඇ)

අ32. අස්තිත්වයේ අවදානම් තක්සේරු ක්‍රියාවලිය ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත අවදානම් හඳුනාගන්නේ සහ අමතන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීම පහත දැක්වෙන දෑ වල වෙනස්වීම් සැළකිල්ලට ගැනීමේදී විගණක ට උපකාරී විය හැකි ය.

- ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන්;
- ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී හෝ භාවිතා කළ දත්තවල විශ්වාසදායක බවට බලපෑ හැකි අදාළ දත්ත ප්‍රභවවල ස්වභාවය හෝ ලබා ගත හැකි බව.
- අස්තිත්වයේ තොරතුරු පද්ධතිය හෝ තොරතුරු තාක්ෂණික පරිසරය; සහ
- ප්‍රධාන සේවක පිරිස් (නිලධරයන්).

අ33. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී කළමනාකාරීත්වයේ පක්ෂග්‍රාහී බව හෝ වංචාවක් නිසා අවප්‍රකාශයකට නැඹුරුවීම කළමනාකාරිත්වය කෙසේ හඳුනාගන්නේ සහ අමතන්නේ ද පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමේදී විගණක සැළකිල්ලට ගත හැකිවිය, කරුණුවලට පහත දෑ ඇතුළත් ද එසේ නම් කළමනාකාරීත්වයඃ

- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී ක්‍රම උපකල්පන සහ භාවිතා කළ දත්ත තෝරා ගැනීමේදී හෝ ව්‍යවහාර කිරීමේදී විශේෂ අවධානයක් දැක්වීම.
- ඓතිහාසික හෝ අය-වැයගත කාර්ය සාධනය හෝ වෙනත් දන්නා සාධක සමඟ සන්සන්දනය කිරීමේ අනපේක්ෂිත හෝ අසංගත කාර්යසාධනය ඉඟි කළ හැකි ප්‍රධාන කාර්ය සාධන හැඟවීම් අධීක්ෂණය කිරීම.
- පක්ෂග්‍රාහී වීම සඳහා එය අභිප්‍රේරණයක් විය හැකි මූල්‍ය හෝ වෙනත් දිරිගැන්වීම් හඳුනාගැනීම.
- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී ක්‍රම සැලකිය යුතු අන්දමේ උපකල්පන හෝ භාවිතා කළ දත්තවල වෙනස්වීම් සඳහා වන අවශ්‍යතාවය අධීක්ෂණය කිරීම.
- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ භාවිතා කළ කළ ආදර්ශයන්හි යෝග්‍ය අධීක්ෂණය සහ සමාලෝචනයක් ස්ථාපිත කිරීම.
- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී සිදුකළ සැලකිය යුතු අන්දමේ විනිශ්චයන් හී තර්කාන්විතය සඳහා ස්වාධීන සමාලෝචනයක් ලේඛනගත කිරීම අවශ්‍ය වීම.

ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත අස්තිත්වයේ තොරතුරු පද්ධතිය (යොමුව : 13(ඇ) (i)

අ34. 13(ඇ) ඡේදයේ විෂය පථය තුළවන ගනුදෙනු පන්තීන් සිද්ධීන් සහ තත්ත්වයන් ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) 18(අ) සහ (ඇ) ඡේදවලට යටත්ව එම සම්බන්ධිත හෙළිදරව් කිරීමට සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත ගනුදෙනු පන්තියේ සිද්ධීන් සහ තත්ත්වයන් එක සමාන වේ. අස්තිත්වයේ තොරතුරු පද්ධතියේ අවබෝධයක් ලබා ගැනීමේදී එය ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත විගණක පහත දේ සැළකිල්ලට ගත හැකිය.

- ගිණුම්කරණ ඇස්තමේන්තු පැනනගින්නේ අනුපිළිවෙලකට සහ පුනරාවර්තනය වන ගනුදෙනු වාර්තා කිරීමෙන් ද හෝ ඒවා පැනනගින්නේ පුනරාවර්තනය නොවන සහ අසාමාන්‍ය ගනුදෙනුවලින් ද.
- විශේෂයෙන්ම වගකීම්වලට සම්බන්ධිත ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් හි, සම්පූර්ණත්වය තොරතුරු පද්ධතිය අමතන්නේ කෙසේද.

අ35. විගණනය තුළදී කළමනාකාරිත්වය හඳුනා ගැනීමට අපොහොසත් වූ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල අවශ්‍යතාව හට ගැන්විය හැකි ගනුදෙනු පන්තීන් සිද්ධීන් හා තත්ත්වයන් විගණකට හඳුනාගත හැකිය. අස්තිත්වයේ අවදානම් තක්සේරු ක්‍රියාවලියේ සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු ඌණතාවයන් තිබේ දැයි නිර්ණය කිරීම ඇතුළුව කළමනාකාරිත්වය හඳුනා

ගැනීමට අපොහොසත් වූ ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක අවදානම් විගණක හඳුනා ගන්නා අවස්ථාවක තත්ත්වයන් සමඟ ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) කටයුතු කරයි.[34]

අදාළ ක්‍රම උපකල්පන සහ දත්ත මූලාශ්‍ර කළමනාකාරීත්වයේ හඳුනාගැනීම (යොමුව : 13(ඇ) (ii) (අ) ඡේදය)

අ36. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේ ක්‍රමය කළමනාකාරිත්වය වෙනස් කළහොත් සලකා බැලිය යුතු දෑට ඇතුළත් විය හැක්කේ උදාහරණ ලෙස එම නව ක්‍රමය වඩා යෝග්‍ය ද එය එමගින් අස්තිත්ත්වයට බලපාන පරිසරයේ හෝ තත්ත්වයන්ගේ වෙනස් වීම්වලට ප්‍රතිචාර වශයෙන් හෝ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව හෝ නියාමන පරිසරයේ අවශ්‍යතාවයන්වල වෙනස්වීම්වලට හෝ කළමනාකාරිත්වයට වෙනත් වලංගු හේතු තිබේද යන්න මතය.

අ37. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකාරිත්වය ක්‍රමය වෙනස් නොකළේ නම් සැළකිල්ලට ගැනීම්වලට ඇතුළත් විය හැක්කේ වර්තමාන පරිසරය හෝ තත්ත්වයක් නිසා පෙරවූ ක්‍රම උපකල්පන සහ දත්ත අඛණ්ඩව භාවිතයට කිරීම යෝග්‍ය ද යන්නය.

ක්‍රම (යොමුව : 13(ඇ) (ii) (අ)(i)

අ38. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී භාවිත කළ යුතු ක්‍රමය අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව නියම කළ හැකිය. බොහෝ අවස්ථාවලදී කෙසේ වෙතත් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව තනි ක්‍රමයක් නියම කරන්නේ හෝ අවශ්‍ය කරන මැනීමේ පදනම නියම කරන්නේ හෝ වෙනත් විකල්ප ක්‍රම භාවිතා කිරීමට හෝ ඉඩ දෙන්නේ නැත.

ආදර්ශ

අ39. කළමනාකාරීත්වයේ ස්වකීය ආදර්ශ වූ හෝ බාහිර ආදර්ශයක් වුවත් ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කරන ආදර්ශය වටා නිශ්චිත පාලන කළමනාකාරිත්වය සැලසුම්කර ක්‍රියාත්මක කළ හැකිය. ආදර්ශයක් මගින්ම සංකීර්ණතාවයේ හෝ පුද්ගලගතභාවය මට්ටම ඉහළ යන විට තුන්වන මට්ටමේ යෙදවුමක් භාවිතා කරමින් අපේක්ෂිත ණයහානි ආදර්ශයක් හෝ හෝ සාධාරණ අගය ආදර්ශයක් එවැනි සංකීර්ණතාවයක් හෝ පුද්ගලගතභාවයන් අමතන පාලන විගණනයට වඩාත් අදාළ විය හැකියි හැකි බව හඳුනාගත හැකිය. ආදර්ශවලට සම්බන්ධිත සංකීර්ණතාවය පවතින විට දත්තවල අවංක භාවය මත පාලන ද එලෙසම විගණනයට වඩාත් අදාළ විය හැකිය. විගණනයට අදාළ පාලන ක්‍රියාවන් සහ ආදර්ශය පිළිබඳව අවබෝධය ලබා ගැනීමේදී විගණක සැලකිය යුතු ඒ සඳහා යෝග්‍ය විය හැකි සාධකවලට පහත දේ ඇතුළත් යඃ

- ආදර්ශයේ අදාළත්වය සහ නිරවද්‍යතාවය කළමනාකාරිත්වය නිර්ණය කරන්නේ කෙසේද;
- ආදර්ශය භාවිත කිරීමට පෙර වලංගු බව සහතික කර තිබේද සහ එහි අපේක්ෂා කරන භාවිතය සඳහා එහි සුදුසුතාවය පවතින්නේ ද යන්න නිර්ණය කිරීමට ක්‍රමානුකූල කාල අන්තර වලදී යළි වලංගු කර ඇද්ද ඇතුළුව ආදර්ශය වලංගු කිරීම

හෝ ආපසු පරීක්ෂාව. අස්තිත්ත්වය ආදර්ශය වලංගු බව සහතික කිරීමට පහත දෑ අගය කිරීම ඇතුළත් විය හැකියඃ

  - ආදර්ශයේ න්‍යායික ප්‍රබලතාවය.
  - ආදර්ශයෙන් ගණිතමය අවංකභාවය.
  - දත්තයන්හි නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහ ආදර්ශයේ භාවිත කළ දත්ත සහ උපකල්පනයන් හි යෝග්‍යතාවය.

- වෙළෙඳපොළ හෝ වෙනත් තත්ත්වයන්හි වෙනස්වීම් සඳහා කාලානුරූපී පදනමක් මත ආදර්ශය යෝග්‍ය පරිදි වෙනස් කරන්නේ හෝ ගලපන්නේ කෙසේද හෝ ආදර්ශය හරහා යෝග්‍ය වෙනස්කිරීම් පාලන ප්‍රතිපත්ති තිබේද.
- ආදර්ශයෙන් නිමැවුමට කරන ගැලපුම් සමහර කර්මාන්ත තුළ උඩතැරිය ලෙස හැඳින්වීම එසේම කරන්නේද සහ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව අවශ්‍යතාවයන් සමඟ අනුකූල ව පවත්නා

[34] ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත), 17 වන ඡේදය.

තත්ත්වයන් තුළ එවැනි ගැලපුම් යෝග්‍ය වන්නේ ද. ගැලපුම් යෝග්‍ය නොවන විට එවැනි ගැලපුම් කළමනාකාරිත්වයේ විය හැකි පක්ෂග්‍රාහී බවේ හැඟවීම් විය හැකිය; සහ

- එහි අපේක්ෂිත යෙදුම් සීමා කිරීම් ප්‍රධාන පරාමිති අවශ්‍ය කරන දත්ත සහ විකල්ප එහි නිමැවුම ට සිදු කළ යම් ගැලපුම්වල ප්‍රතිඵල සහ පදනම ස්වභාවය ඇතුළුව ආදර්ශය ප්‍රමාණවත් ලෙස ලේඛන ගත කර ඇත්ද.

උපකල්පන (යොමුව ඃ 13(ඈ) (ii) අ(ii) ඡේදය

අ40. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී භාවිත කළ උපකල්පන කළමනාකරණය කෙසේ තෝරා ගත්තේද යන්න පිළිබඳව අවබෝධය ලබා ගැනීමේදී උදාහරණ ලෙස පහත සඳහන් කරුණු විගණක සැළකිල්ලට ගත හැකියඃ

- උපකල්පනය තෝරා ගැනීමට සහාය දෙන ලේඛනගත කිරීම සහ තෝරා ගැනීම සඳහා කළමනාකාරිත්වයේ පදනම උපකල්පනයක් තෝරා ගැනීම සඳහා නිර්ණායක හෝ මගපෙන්වීමේ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ලබාදිය හැකිය.
- උපකල්පන අදාළ සහ සම්පූර්ණ දැයි කළමනාකාරිත්වය තක්සේරු කරන්නේ කෙසේද.
- අදාළ වන විට උපකල්පන සෑම එකක් සමඟ හෝ වෙනත් ගිණුම්කරණ ඇස්තමේන්තුවල භාවිතා කළ දෑ සමඟ හෝ අස්තිත්ත්වයේ ව්‍යාපාර කටයුතු ක්ෂේත්‍රවල හෝ පහත සඳහන් කරුණු සමඟ සංගත වන්නේ කෙසේද යන්න කළමනාකාරිත්වය නිර්ණය කරන්නේ කෙසේද.
    - ° කළමනාකාරිත්වයේ පාලනය තුළ (උදාහරණ ලෙස වත්කමක ප්‍රයෝජ්‍ය ජීවිත කාලය ඇස්තමේන්තු කිරීමට බලපාන නඩත්තු වැඩසටහන් පිළිබඳ උපකල්පන) සහ ඒවා අස්තිත්ත්වයේ ව්‍යාපාරික සැලැස්ම සහ බාහිර පරිසරය සමඟ සංගත වන්නේද යන්න; සහ
    - ° කළමනාකාරීත්වයේ පාලනයෙන් බාහිරව (උදාහරණ ලෙස වියහැකි අධිකරණමය හෝ නියාමන ක්‍රියාවක් නිසා පොලී අනුපාතික හෝ මරණ අනුපාතික පිළිබඳ උපකල්පන).
- උපකල්පන හෙළිදරව් කිරීමට සම්බන්ධිත අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන්.

අ41. සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධව දත්ත ප්‍රභව සහ ඒවාට සහාය වන විනිශ්චයන් සඳහා පදනම සම්බන්ධයෙන් උපකල්පන වෙනස් වන්නේ පහත දැක්වෙන පරිදිවේ.

(අ) වාර්තාකරණ අස්තිත්ත්වයෙන් ස්වාධීන මූලාශ්‍රයන්ගෙන් ලබාගන්නා වෙළෙඳපොළ දත්ත පදනම් කළ සංවර්ධනය කළ වත්කමක හෝ වගකීමක මිල කිරීම වෙළෙඳපොළ සහභාගි වන්නන් භාවිතා කළ හැකි දෙයින් කුමක් පිළිබිඹු වන්නේ ද යන දෑ.

(ආ) පවතින තත්ත්වයන් තුළ ලබාගත හැකි ඉතාම උසස් දත්ත පදනම මත සංවර්ධනය කළ වත්කම හෝ හෝ වගකීම මිල කිරීමට වෙළෙඳපොළ සහභාගි වන්නන් භාවිතා කළ හැක්කේ කුමන උපකල්පනයක් ද යන්න පිළිබඳ අස්තිත්ත්වය ස්වකීය විනිශ්චය පිළිබිඹු වන එම දෑ.

ප්‍රායෝගිකව කෙසේ වෙතත් (අ) සහ (ආ) අතර වෙන් කොට හඳුනා ගැනීම සෑම විටම පැහැදිලිව නොපෙනෙන අතර ඒවා අතර වෙන් කොට හඳුනා ගැනීම රඳා පවත්නේ දත්තවල මූලාශ්‍රයන් හඳුනාගැනීම සහ උපකල්පනයට සහායවන විනිශ්චයන් මතය. තවදුරටත් වෙනස් වෙළෙඳපොළ සහභාගි වන්නන් විසින් භාවිතා කරන වෙනස් උපකල්පන ගණනාවකින් තෝරාගැනීම කළමනාකාරීත්වයට අවශ්‍ය විය හැකිය.

අ42. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් මැනීමට ප්‍රමාණාත්මක ලෙස උපකල්පනයේ සාධාරණ විචලනයක් බලපාන්නේ නම් නම් ගිණුම්කරණ ඇස්තමේන්තුව කිරීම සඳහා භාවිතා කළ උපකල්පන මෙම ශ්‍රීලවිප්‍රයේ හඳුන්වන්නේ සැලකිය යුතු අන්දමේ උපකල්පනයක් ලෙසය. ගිණුම්කරණ ඇස්තමේන්තුව කිරීමේදී භාවිතා කළ එකක් හෝ ඊට වැඩි උපකල්පන මත පදනම්ව මැනීම කුමන ප්‍රමාණයකට වෙනස් වන්නේ ද යන්න නිරූපණය කිරීමේදී සංවේදීතා විශ්ලේෂණයක් ප්‍රයෝජනවත් විය හැකිය.

අක්‍රීය හෝ ද්‍රවශීලතාවය නොමැති වෙළෙඳපොළ

අ43. වෙළෙඳපොළ අක්‍රීය හෝ ද්‍රවශීලතාවය නොමැතිනම් කළමනාකාරිත්වය උපකල්පන තෝරාගන්නේ කෙසේද යන්න පිළිබඳව විගණකගේ අවබෝධයට කළමනාකාරිත්වය පහත දෑ තිබේද යන්න පිළිබඳ අවබෝධයක් ඇතුළත් විය හැකියඃ

- එවැනි තත්ත්වයන් හිදී ක්‍රමය ව්‍යවහාර කිරීම තෝරාගැනීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවූවාද, එවැනි තෝරා ගැනීමකට ආදර්ශය ගැලපුම් කිරීම හෝ පවතින තත්ත්වයන් තුළ යෝග්‍ය නව ආදර්ශ සංවර්ධනය කිරීම ඇතුළත් කළාද;
- ආදර්ශයක් තෝරා ගැනීමට හෝ සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන කුසලතාවය සහිත සම්පත් අවශ්‍ය වන්නේ නම් හදිසි පදනමක් මත එවැනි පවතින තත්ත්වයක් තුළ යෝග්‍ය වන අගය කිරීමේ ශිල්ප ක්‍රම තෝරා ගැනීම ඇතුළුව;
- සම්බන්ධිත අනියතතා දී ඇති පරාසයක ප්‍රතිඵල නිර්ණය කිරීමට සම්පත්, උදාහරණ ලෙස සංවේදීතා විශ්ලේෂණයක් ඉටුකිරීමෙන්;
- වෙළෙඳපොළ තත්ත්වයන් නරක අතට හැරීම අස්තිත්වයක් මෙහෙයුම් වලට පරිසරයට සහ අදාළ ව්‍යාපාරික අවදානම් සහ අස්තිත්වයේ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට හඟවන දැහි බලපෑම එවැනි පවත්නා තත්ත්වයන්හිදී අදාළ වනවිට කෙසේ තක්සේරු කළ හැකිද යන්න ට ඇති උපක්‍රම; සහ
- මිල ගණන් දත්ත සහ ඒ මත අදාළත්වය එවැනි තත්ත්වයන්හිදී විශේෂ බාහිර තොරතුරු මූලාශ්‍රයකින් වෙනස් විය හැක්කේ කෙසේද යන්න පිළිබඳ යෝග්‍ය අවබෝධයක්.

දත්ත (යොමුව ඃ 13(ඇ) (ii) අ (iii)

අ44. ගිණුම්කරණ ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ කුමන දත්ත මත ද යන්න කළමනාකාරිත්වය කෙසේ තෝරා ගන්නේද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේදී විගණක සැළකිල්ලක් දැක්විය හැකි කරුණුවලට ඇතුළත්;

- බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරු ඇතුළත් වූ දත්තවල ස්වභාවය සහ මූලාශ්‍රය.
- දත්ත යෝග්‍ය දැයි කළමනාකාරිත්වය අගය කරන්නේ කෙසේද.
- දත්තවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය.
- පූර්ව කාල පරිච්ඡේදවල භාවිතා කළ දත්ත සමඟ භාවිතා කළ දත්තවල සංගතතාවය.
- මෙය විශාල පරිමාවක දත්ත හසුරුවීම සම්බන්ධවීම ඇතුළුව දත්ත ලබාගැනීමට සහ සැකසීමට භාවිතා කරන තොරතුරු තාක්ෂණික පද්ධතියේ සංකීර්ණතාවය.
- දත්ත ලබා ගන්නේ සහ සම්ප්‍රේෂණය කළේ කෙසේද සහ අවංකභාවය පවත්වා ගෙන යන්නේ කෙසේද.

කළමනාකාරිත්වය ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අවබෝධ කරගන්නේ සහ අමතන්නේ කෙසේද (යොමුව ඃ 13(ඇ) (ii) (ආ)-13(ඇ) (ii) (ඇ) ඡේද.

අ45. ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ ප්‍රමාණය කළමනාකාරිත්වය අවබෝධ කර ගනීද සහ අවබෝධ කරගන්නේ කෙසේද යන්නට සම්බන්ධිත විගණකට යෝග්‍ය වියහැකි කරුණුවලට ඇතුළත් විය හැක්කේ උදාහරණ ලෙසඃ

- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍ය විය හැකි විකල්ප ක්‍රම සැලකිය යුතු අන්දමේ උපකල්පන හෝ දත්ත මූලාශ්‍ර තිබේ නම් විගණක හඳුනාගන්නේ කෙසේද.
- තිබේනම් කළමනාකාරිත්වය විකල්ප ප්‍රතිඵල කළමනාකාරිත්වය සැළකිල්ලට ගන්නේ කෙසේද උදාහරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී සැලකිය යුතු අන්දමේ විකල්ප හෝ භාවිතා කළ දත්තවල වෙනස්වීම් නිර්ණය කිරීම සංවේදීතා විශ්ලේෂණයක් ඉටු කිරීම මගින්.

අ46. සාධාරණ ලෙස විය හැකි මැනීමේ ප්‍රතිඵලවලින් කළමනාකාරීත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීමට පිවිසුම් මගක් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව අවශ්‍යතාවයන් හෝ නියම කළ හැකිය. යෝග්‍ය වටිනාකම වන්නේ සාධාරණ ලෙස විය හැකි ප්‍රතිඵල මැනීමෙන් යෝග්‍ය පරිදි

තෝරාගත් එකක් බව මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව හඳුනාගත හැකිය සහ සමහර අවස්ථාවලදී වඩාත් අදාළ වටිනාකම විය හැක්කේ එම පරාසයේ මධ්‍යම කොටසේ විය හැකි බව හැඟවීම කළ හැකිය.

අ47. උදාහරණ ලෙස, සාධාරණ අගය ඇස්තමේන්තු සම්බන්ධයෙන් ශ්‍රීලගිප්‍ර 13[35] සඳහන් කරන්නේ සාධාරණ අගය මැනීමට බහු අංග අගය කිරීමේ ශිල්ප ක්‍රම භාවිතා කරන්නේ නම් (එනම් සාධාරණ අගය අදාළ ඇඟවීම්) එම ප්‍රතිඵල මඟින් මගින් අඟවනු ලබන වටිනාකම්වල පරාසයේ සාධාරණත්වය සැළකිල්ලට ගෙන අගය කළ යුතු බව ය. පවත්නා තත්ත්වය තුළ වඩාත් නියෝජනය වන සාධාරණ අගය පරාසය තුළ වන ලක්‍ෂ්‍යය සාධාරණ අගය මැනීමයි. වෙනත් අවස්ථාවන්හිදී සාධාරණව වියහැකි මැනීමේ ප්‍රතිඵල සම්භාවිතා බර තැබූ සාමාන්‍ය හෝ වඩාත් විය හැකි හෝ එය වඩාත් විය නොහැකි මැනීමේ වටිනාකම හෝ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව නියම කළ හැකිය.

අ48. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත හෙළිදරව් කිරීම් හෝ හෙළිදරව් කිරීමේ අරමුණු නියම කළ හැකි අතර සමහර අස්තිත්ත්ව අමතර තොරතුරු හෙළිදරව් කිරීමට තෝරා ගත හැකිය. උදාහරණ ලෙස මෙම හෙළිදරව් කිරීමේ අරමුණු පහත දැ ඇමතිය හැකියඃ

- යම් අදාළ ආදර්ශයක් සහ එහි තෝරාගැනීම සඳහා පදනම ඇතුළු ව භාවිත කළ ඇස්තමේන්තු කිරීමේ ක්‍රමය.
- එම ආදර්ශවල භාවිත කළ පාදක වන දත්ත සහ උපකල්පනවලට සම්බන්ධ තොරතුරු ඇතුළුව මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත් හෝ හෙළිදරව් කළ ඇස්තමේන්තු නිර්ණය කිරීමට භාවිතා කළ ආදර්ශ වලින් හෝ වෙනත් ගණනය කිරීම්වලින් ලබාගත් තොරතුරු පහත දැ වැනි.
    - අභ්‍යන්තරව සංවර්ධනය කළ උපකල්පන; හෝ
    - අස්තිත්වය පාලනයෙන් බැහැරවන සාධක මගින් බලපාන පොළී අනුපාතික වැනි දත්ත.
- පූර්ව කාලපරිච්ඡේදවලින් ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවලට වන යම් වෙනස්වීම්වල බලපෑම.
- අනියතතාවය ඇස්තමේන්තු කිරීමේ මූලාශ්‍ර.
- සාධාරණ අගය තොරතුරු.
- කළමනාකාරිත්වය විකල්ප උපකල්පන සැළකිල්ලට ගෙන ඇති බව නිරූපණය කරන මූල්‍ය ආදර්ශ මගින් ලබාගත් ලබාගත් සංවේදීතා විශ්ලේෂණය පිළිබඳ තොරතුරු.

අ49. සමහර අවස්ථාවන් තුළදී ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය සම්බන්ධයෙන් නිශ්චිත හෙළිදරව් කිරීම් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය කරවිය හැකිය. උදාහරණ ලෙසඃ

- කාලපරිච්ඡේදය අවසන් වූ පසුව වත්කම් හා වගකීම්වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපුමක විශාලත්වය හෝ ඉහළ විය හැකි බව හට ගැන්විය හැකි වෙනත් ප්‍රධාන මූලාශ්‍රයක ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ අනාගතය පිළිබඳ සිදුකළ උපකල්පනය පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම. "ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ ප්‍රධාන මූලාශ්‍ර" හෝ "තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු" ලෙස වැනි පද භාවිතා කරමින් එවැනි අවශ්‍යතාවයන් විස්තර කළ හැකිය. ඒවා කළමනාකාරිත්වයේ වඩාත්ම අසීරු පුද්ගලගත හෝ සංකීර්ණ විනිශ්චය අවශ්‍යකරණ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත විය හැකිය. එවැනි විනිශ්චයන් වඩාත් පුද්ගලගත සහ සංකීර්ණ විනිශ්චයක් විය හැකි අතර එබැවින් වත්කම් හා වගකීම්වල ධාරණ අගයට ආනුෂංගික ප්‍රමාණාත්මක ගැලපිලි සඳහා විභව්‍ය ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය වියහැකි අනාගත විනිශ්චය කිරීම බලපාන උපකල්පන සහ දත්තවල අයිතම ගණනාවක් සමඟ වැඩි විය හැකිය. හෙළිදරව් කළ යුතු තොරතුරුවලට ඇතුළත් විය හැක්කේ;
    - ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ උපකල්පනයක් හෝ වෙනත් මූලාශ්‍රවල ස්වභාවය;
    - සංවේදීතාවයට හේතු ඇතුළත්ව භාවිත කළ ක්‍රම සහ උපකල්පනයන්ගේ ධාරණ වටිනාකම් සංවේදීතාවය;
    - බලපෑම්වලට ලක් වූ වත්කම් සහ වගකීම්හි ධාරණ වටිනාකම්වලට සම්බන්ධයෙන් සාධාරණ ලෙස විය හැකි ප්‍රතිඵලවල පරාසය සහ අනියතතාවයේ අපේක්ෂිත නිශ්චය කිරීම; සහ

---

[35] ශ්‍රීලගිප්‍ර 13 *සාධාරණ අගය මැනීම*, 63 වන ඡේදය.

  - අනියතතාවය නිශ්චය නොකර එසේම පවතින්නේ නම් එම වත්කම් සහ වගකීම් සම්බන්ධයෙන් පෙර වූ උපකල්පනවලට සිදුකළ වෙනස් කිරීම්වල පැහැදිලි කිරීමක් වියහැකි
- ප්‍රතිඵල පරාසය හෙළිදරව් කිරීම සහ පරාසය නිර්ණය කිරීමේ දී භාවිත කළ උපකල්පන.
- පහත දෑ වැනි නිශ්චිත තොරතුරු හෙළිදරව් කිරීම;
  - අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්වයට සහ කාර්ය සාධනයට සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තුවල තොරතුරු සම්බන්ධයෙන් වැදගත්කම; සහ
  - වෙළඳපොළේ අක්‍රියභාවය සහ ද්‍රවශීලතාවය අඩුකම පිළිබඳව හෙළිදරව් කිරීම.
- අවදානමට නිරාවරණය වැනි ගුණාත්මක හෙළිදරව් කිරීම් සහ ඒවා පැනනගින්නේ කෙසේද අස්තිත්වයක් අරමුණු ප්‍රතිපත්ති සහ අවදානම කළමනාකරණයට ක්‍රියාපටිපාටි සහ අවදානම මැනීමට භාවිත කළ ක්‍රම සහ මෙම ගුණාත්මක සංකල්පවලට පූර්ව කාල පරිච්ඡේදයේ සිට යම් වෙනස් කිරීම්.
- අස්තිත්ත්වයේ ප්‍රධාන කළමණාකරන පිරිස් අභ්‍යන්තරව ලබා දුන් තොරතුරු මත පදනම් කර ණය අවදානම ද්‍රවශීලතා අවදානම සහ වෙළඳ පොළ අවදානම් ඇතුළුව අස්තිත්වයට කුමන ප්‍රමාණයක අවදානමකට නිරාවරණය වී ඇත්දැයි වැනි ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම්.

ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකාරිත්වය ක්‍රියාවලිය මත විගණනයට අදාළ පාලන ක්‍රියාවන් (යොමුව ඃ 13(ඉ) ඡේදය

අ50. විගණනයට අදාළ අදාළ පාලන හඳුනා ගැනීමේදී විගණකගේ විනිශ්චය සහ එබැවින් එම පාලනයන් හි සැලසුම අගය කිරීමේ අවශ්‍යතාවය සහ 13(ඇ)(ii) ඡේදයේ විස්තර කර ඇති කළමනාකාරිත්වයේ සම්බන්ධිත ක්‍රියාවලිය ඔවුන් ක්‍රියාවට නංවා ඇත්දැයි නිර්ණය කිරීම. ගිනුම්කරණ ඇස්තමේන්තු සමඟ ආශ්‍රිත සංකීර්ණතාවය මත රඳා පවතිමින් 13(ඇ) (ii) ඡේදයේ සියලු මූලිකාංගයන් ට සම්බන්ධිත අදාළ පාලන ක්‍රියාවන් විගණක හඳුනා ගත නොහැකිය.

අ51. විගණනයට අදාළ පාලන ක්‍රියාවන්හි අවබෝධයක් ලබා ගැනීමේ කොටසක් වශයෙන් විගණක පහත දෑ සැළකිල්ලට ගත හැකිය.

- පොදු සහ උපයෝගී ලෙජරවලින් බාහිරව දත්ත හෝ බාහිර තොරතුරු මූලාශ්‍රයක් කළමනාකාරිත්වය භාවිතා කරන විට ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු සංවර්ධනය කිරීමට භාවිතා කළ දත්තයන්හි යෝග්‍යතාවය කළමනාකාරිත්වය නිර්ණය කරන්නේ කෙසේද.
- කළමනාකාරිත්වයේ යෝග්‍ය මට්ටම්වලින් සහ යෝග්‍ය වන අවස්ථාවලදී පාලනය පිළිබඳ වගකිව යුතු අය විසින් උපකල්පන හෝ දත්ත ඇතුළුව ඒවායේ සංවර්ධනය කළ ගිණුම්කරණ ඇස්තමේන්තු සමාලෝචනය සහ අනුමත කිරීම.
- වගකීම් පැවරීමේ දී අස්තිත්ත්වයේ ස්වභාවය සහ එහි නිෂ්පාදන හෝ සේවාවන් යෝග්‍ය පරිදි සැළකිල්ලට ගත්තේ ද යන්න ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා වගකිව යුතු අය සහ සම්බන්ධිත ගනුදෙනුවලට අස්තිත්වය බැඳීමකට ලක් කරන අය අතර රාජකාරී බෙදා වෙන් කිරීම. උදාහරණ ලෙස විශාල මූල්‍ය ආයතනයක් සිද්ධිය වන අවස්ථාවක අදාළ රාජකාරි වෙන් කිරීම සමන්විත විය හැක්කේ, ඇස්තමේන්තු කිරීම සඳහා වගකිව යුතු ස්වාධීන කාර්යකින් සහ අස්තිත්වයට මූල්‍ය නිෂ්පාදනවල සාධාරණ අගය මිලකරණය වලංගු කිරීම එම නිෂ්පාදන හා ඔවුන්ගේ පාරිශ්‍රමිකය හා නොබැඳුණ පුද්ගලයන්ගෙන් කාර්යමණ්ඩලය සැපයීම මගින් ය.
- පාලන ක්‍රියා සැලසුම් කිරීමේ සඵල දායකත්වය. ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක් සඵලදායක ලෙස වලක්වන හෝ අනාවරණය සහ නිවැරදි කරන ආකාරයේ පුද්ගලගතභාවය සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අමතන පාලන සැලසුම් කිරීම, එම සංකීර්ණතාවය ඇමතීමට පාලන සැලසුම් කරනවාට වඩා කළමනාකාරිත්වයට සාමාන්‍යයෙන් වඩා අපහසු විය හැකිය. පුද්ගලගතභාවය සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අමතන පාලනවලට වැඩිපුර අත්හුරු අංග ඇතුළත් කිරීම අවශ්‍ය විය හැකිය. ඒවා පහසුවෙන් මග හැරිය හැකි හෝ නොසලකා හැරිය හැකි හෝ කළමනාකාරීත්වය විසින් මැදිහත්වීම් අක්‍රිය කළ හැකි නිසා ස්වයංක්‍රීය පාලනයන්ට වඩා විශ්වාස දායකත්වය අඩු විය හැකිය. සංකීර්ණතාවය අමතන පාලනයන්හි සැලසුමේ සඵලදායකත්වය සංකීර්ණතාවයේ හේතු සඳහා සහ එහි ස්වභාවය මත වෙනස්විය හැක. උදාහරණ ලෙස, නිරතුරුව භාවිතා කරන්නේ

දත්තවල අවංකභාවය මත සම්බන්ධිත ක්‍රමයක් වඩාත් සඵලදායක පාලන සහිතව සැලසුම් කිරීම පහසු විය හැකිය.

අ52. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී තොරතුරු තාක්ෂණය පුළුල් ලෙස කළමණාකාරීත්වයක් භාවිතා කරන විට විගණනයට අදාළ පාලනවලට ඇතුළත් කළ හැක්කේ සාමාන්‍ය තොරතුරු තාක්ෂණික පාලන සහ යෙදුම් පාලන වේ. එවැනි පාලන අවදානම් සම්බන්ධිත පහත දෑ ඇමතිය හැකියː

- විශාල පරිමාවක දත්ත සැකසීම සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියට හැකියාව සහ යෝග්‍ය පරිදි එය වින්‍යාසය කර තිබේද;
- ක්‍රමයක් ව්‍යවහාර කිරීමේ දී සංකීර්ණ ගණනය කිරීම්. විශේෂයෙන්ම පද්ධතිවලට ස්වයංක්‍රීය අතුරුමුහුණත් ආ හෝ අත්හුරු මැදිහත්වීම්වලට යටත් වේ නම් සංකීර්ණ ගනුදෙනු සකස් කිරීමට පද්ධති අතර නිතිපතා සන්සන්දනය කිරීමට විවිධාකාර පද්ධති අවශ්‍ය කෙරේ;
- ආදර්ශ සැලසුම් කිරීම සහ ක්‍රමාංකනය කලින් කලට පදනමක් යටතේ අගය කරන්නේ ද;
- අස්තිත්වයේ වාර්තාවලින් හෝ බාහිර තොරතුරු ප්‍රභවයන්ගෙන් ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන් සම්පූර්ණ සහ නිවැරදි දත්ත උපුටාගැනීම;
- දත්ත අස්තිත්ත්වයේ අතීතයේ තොරතුරු පද්ධතිය මගින් සම්පූර්ණ නිවැරදි දත්ත ගලා ඒම, ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කළ දත්තවලට කරන යම් වෙනස් කිරීම් හි යෝග්‍යතාවය දත්තවල අවංක භාවය සහ සුරක්ෂිතභාවය පවත්වාගෙන යාම;
- බාහිර තොරතුරු මූලාශ්‍ර භාවිතා කරන විට, දත්ත සකස් කිරීමේදී හෝ වාර්තා කිරීමට සම්බන්ධ අවදානම්;
- ආදර්ශවල බලයලත් අනුවාදවල බලවත් විගණන හෝඩුවාවක් පවත්වාගෙන යෑමට එක් එක් ආදර්ශය නඩත්තු කිරීමට සහ වෙනස් කිරීමට සහ එම ආදර්ශවලට අනවසර පිවිසුමක් හෝ හෝ සංශෝධනය කිරීම වැළැක්වීමට ප්‍රවේශය වටා කළමනාකාරීත්වයට පාලන තිබේද; සහ
- ජර්නල් සටහන් මත ඇති යෝග්‍ය පාලන ඇතුළත්ව, ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධ තොරතුරු පොදු ලෙජරය ට මාරු කිරීම මත යෝග්‍ය පාලන තිබේද.

අ53. බැංකු සහ රක්ෂණ වැනි සමහර කර්මාන්තවල පාලනය යන පදය භාවිතා කළ හැක්කේ පාලන පරිසරය තුළ පාලන අධීක්ෂණය සහ ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත)[36] හි විස්තර කර ඇති පරිදි අභ්‍යන්තර පාලනයේ වෙනත් සංරචකවල ක්‍රියාවන් විස්තර කිරීමටය.

අ54. අභ්‍යන්තර විගණන කාර්යයන් ඇති අස්තිත්ත්ව සඳහා එහි සෑම පහත සඳහන් දේ සඳහා විගණක අවබෝධයක් ලබා ගැනීමේ විශේෂයෙන්ම උපකාරී වේ.

- කළමනාකාරීත්වයේ ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතයේ සහ ප්‍රමාණය සහ ස්වභාවය;
- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමට භාවිතා කරන ආදර්ශ සහ දත්ත සහ උපකල්පනවලට සම්බන්ධ අවදානම් අමතන පාලන ක්‍රියා සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම;
- ගිණුම්කරණ ඇස්තමේන්තු පදනම් වන දත්ත උපදවන අස්තිත්ත්වයේ තොරතුරු පද්ධතියේ අංග; සහ
- ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත නව අවදානම් හඳුනාගන්නේ තක්සේරු කරන්නේ සහ කළමනාකරණය කරන්නේ කෙසේද.

*ප්‍රතිඵලය සමාලෝචනය කිරීම හෝ පෙරවූ ගිණුම්කරණ ඇස්තමේන්තු යළි ඇස්තමේන්තු කිරීම* (යොමුව ː 14 වන ඡේදය)

අ55. ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ වත්කම් හා වගකීම් පැවරීමේ දී හෝ උපලබ්ධි වීම මගින් ප්‍රතිඵලයක් පෙරවූ ගිණුම්කරණ ඇස්තමේන්තුවල ඇති විට හෝ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ අරමුණ සඳහා යළි ඇස්තමේන්තු කරන විට ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී

[36] ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) අ77 ඡේදය)

පෙර වූ ගිණුම්කරණ ඇස්තමේන්තු (අතීතානුයෝගී සමාලෝචනය) වල ප්‍රතිඵල සමාලෝචනයක් කිරීම හෝ යළි ඇස්තමේන්තු කිරීම උපකාරී වේ. අතීතානුයෝගී සමාලෝචනයක් ඉටු කිරීම මගින් විගණකට පහත දේ ලබා ගත හැකිය.

- කළමණාකාරීත්වයක් පෙර වූ ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියේ සඵලදායකත්වය සම්බන්ධයෙන් තොරතුරු කළමණාකාරීත්වයේ ප්‍රවර්තන ක්‍රියාවලියේ වියහැකි සඵලදායකත්වය පිළිබඳ කුමකින් විගණන සාක්ෂි විගණක ට ලබා ගත හැකිද.
- මූල්‍ය ප්‍රකාශ තුළ හෙළිදරව් කිරීමට අවශ්‍ය වියහැකි විගණන කරුණු වැනි වෙනස්වීම් සඳහා හේතු.
- ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළ සංකීර්ණතාවය හෝ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය සම්බන්ධයෙන් තොරතුරු.
- වියහැකි කළමනාකාරීත්ව පක්ෂග්‍රාහීවීමකට ඇඟවීමක් හෝ ගිණුම්කරණ ඇස්තමේන්තු නැඹුරුවීම සම්බන්ධයෙන් තොරතුරු. එවැනි වාතාවරණයක් හෝ තත්ත්වයන් හෝ ස්වභාවය, කාලනිර්ණය සහ තවදුරටත්වන විගණන පටිපාටිවල ප්‍රමාණය නිර්ණය කිරීමේ දී විගණකගේ වෘත්තීය සංශය දෘෂ්ටිය උපකාරී වේ.

අ56. අතීතානුයෝගී සමාලෝචනයක් ප්‍රවර්තන කාලපරිච්ඡේදය තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීමේදී සහ තක්සේරු කිරීමේදී සනාථ කෙරෙන විගණන සාක්ෂි ලබාදිය හැකිය. එවැනි අතීතානුයෝගී සමාලෝචනයක් පූර්ව කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ සඳහා සිදුකළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ඉටුකළ හැකි හෝ කාලපරිච්ඡේද ගණනාවක් පුරාවට හෝ කෙටි කාලපරිච්ඡේදයකට (අර්ධ වාර්ෂිකව හෝ කාර්තුවක) ඉටු කළ හැකිය. සමහර අවස්ථාවලදී ගිණුම්කරණ ඇස්තමේන්තුවක ප්‍රතිඵලය තීරණය කිරීමට දීර්ඝ කාලපරිච්ඡේදයකට වනවිට අතීතානුයෝගී සමාලෝචනය කාලපරිච්ඡේද ගණනාවක් පුරාවට ම වීම යෝග්‍ය විය හැකිය.

අ57. සැලකිය යුතු අන්දමේ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට කළමනාකාරීත්වයේ විනිශ්චයන් සහ විකල්පවල අතීතානුයෝගී සමාලෝචනය ශ්‍රීලවිප්‍ර 240[37] න් අවශ්‍ය කෙරේ. ප්‍රායෝගික කරුණක් වශයෙන් මෙම ශ්‍රීලවිප්‍ර සමඟ අනුකූලව අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටිය ලෙස පෙර වූ ගිණුම්කරණ ඇස්තමේන්තුවල විගණකගේ සමාලෝචනය ශ්‍රීලවිප්‍ර 240 මගින් අවශ්‍ය කරන සමාලෝචනයේ සම්බන්ධය තුළ ක්‍රියාවට නැංවිය හැකිය.

අ58. ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම්වල විගණකගේ පෙරවූ තක්සේරුව පදනම මත උදාහරණ ලෙස ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක එකක් හෝ ඊට වැඩි අවදානම් ආවේණික අවදානම වැඩියයි තක්සේරු කළහොත් වඩාත් විස්තරාත්මක අතීතානුයෝගී සමාලෝචනයක් අවශ්‍ය බව විගණක විනිශ්චය කළහැක. විස්තරාත්මක අතීතානුයෝගී සමාලෝචනයක කොටසක් ලෙස අදාළ වන විට පෙර වූ ගිණුම්කරණ ඇස්තමේන්තු සිදු කිරීමේදී භාවිත කළ දත්ත සහ සැලකිය යුතු අන්දමේ උපකල්පනවලට වන බලපෑමට විගණක විශේෂ අවධානයක් යොමු කළ හැකිය. උදාහරණ වශයෙන් අනෙක් අතට අනුපිළිවෙළට සහ පුනරාවර්තනය වන ගනුදෙනු වාර්තා කිරීමෙන් පැනනගින ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි ලෙස විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි ව්‍යවහාර කිරීම සමාලෝචනය කිරීමේ අරමුණ සඳහා ප්‍රමාණවත් බව විගණක විනිශ්චය කළ හැකිය.

අ59. කාලයේ එක්තරා අවස්ථාවක වටිනාකම පිළිබඳ හැඳින ගැනීම් සමඟ කටයුතු කරන මැනීම කරන දින වර්තමාන තත්ත්වයන් පදනම මත, සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු සහ වෙනත් ගිණුම්කරණ ඇස්තමේන්තුව සඳහා මැනීමේ අරමුණු අස්තිත්වය මෙහෙයුම් කටයුතු කරන පරිසරය වෙනස් වීමක් සමඟ සැලකිය යුතු අන්දමේ සහ සීඝ්‍රව වෙනස් විය හැකිය. එබැවින් විගණක අවධානය යොමු කළ යුත්තේ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීමට අදාළ වියහැකි සෑම තොරතුරු ලබාගැනීමේ සමාලෝචනය මතය. උදාහරණ ලෙස සමහර අවස්ථාවලදී ප්‍රතිඵලයට එය බලපෑ වෙළඳපොළ සහභාගී වන්නන්ගේ උපකල්පන මත වෙනස්වීමේ අවබෝධයක් ලබාගැනීමේදී පූර්ව කාල පරිච්ඡේදයේ සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තුවක අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අපහසු විය හැකිය. මෙම අවස්ථාවේදී විගණන සාක්ෂි ලබාගත හැක්කේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම හඳුනාගන්නා සහ තක්සේරු කිරීම සනාථ කෙරෙන පූර්ව කාල ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියේ කළමනාකාරිත්වය සඵලදායකත්වයක් අවබෝධය සහ ප්‍රතිඵලයේ උපකල්පන (මුදල් ප්‍රවාහ ප්‍රකාශයක වැනි) අවබෝධ කර ගැනීම මගිනි.

37 ශ්‍රීලවිප්‍ර 240, *මූල්‍ය ප්‍රකාශ විගණනයක දී වංචා ගැන සැලකීමට විගණකගේ ඇති වගකීම*, 33(ආ)(ii) ඡේදය.

අ60. ගිණුම්කරණ ඇස්තමේන්තුවක ප්‍රතිඵලය සහ පෙර වූ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශයක හඳුනාගත් වටිනාකම අතර වෙනස අත්‍යවශ්‍යයෙන්ම පෙරවූ කාලපරිච්ඡේදයක අවප්‍රකාශයක් නියෝජනය නොකරයි. කෙසේ වෙතත් එවැනි වෙනසක් අවප්‍රකාශයක් නියෝජනය කළ හැකි වන්නේ උදාහරණ ලෙස පෙර වූ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ අවසන් කළවිට තොරතුරුවලින් පැනනගින වෙනස් වීම් කළමනාකාරිත්වය ලබාගත හැකි නිසා හෝ එය සාධාරණ ලෙස ගෙන ඇති බව අපේක්ෂා කරන විට සහ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධනය තුළ සැළකිල්ලට ගෙන ඇත්නම්ය.[38] එවැනි වෙනසක් ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී ගිණුම්වලට තොරතුරු ලබාගැනීම් කළමනාකරණය ක්‍රියාවලියේ වලංගුකම සැක කළ හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස විගණක පාලන අවදානම යළි තක්සේරු කළ හැකි අතර මෙම කරුණ සම්බන්ධයෙන් වඩාත් මග පෙන්වන සුළු විගණන සාක්ෂි ලබා ගැනීමට නිර්ණය කළ හැකිය. ගිණුම්කරණ ඇස්තමේන්තු තුළ වෙනස් කිරීම් එය අවප්‍රකාශයක් ස්ථාපනය වන සහ වෙනස් කිරීම නිසා එසේ නොවන ගිණුම්කරණ ඇස්තමේන්තු අතර වෙනස පැහැදිලිව වෙන් කොට හඳුනා ගැනීමට සහ මෙම සෑම අවස්ථාවක් තුළදී අනුගමනය කළ යුතු අවශ්‍ය කරන ගිණුම්කරණ ක්‍රියාමාර්ගය මත මගපෙන්වීම් බොහෝ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවල අඩංගු වේ.

*විශේෂඥ කුසලතා හෝ දැනුම* (යොමුව : 15 වන ඡේදය)

අ61. කාර්යභාරයේ නියුතු කණ්ඩායමට විශේෂඥ කුසලතා සහ දැනුම අවශ්‍ය වන්නේ ද යන විගණකගේ නිර්ණය කිරීමට බලපෑ හැකි කරුණුවලට ඇතුළත් දේ සඳහා උදාහරණ වන්නේ,[39]

- විශේෂ ව්‍යාපාරයක්, හෝ කර්මාන්තයක් සඳහා (උදාහරණ ලෙස, ඛණිජ තැන්පතු, කෘෂි කාර්මික වත්කම්, සංකීර්ණ මූල්‍ය සාධන පත්‍ර, රක්ෂණ ගිවිසුම් වගකීම්) ගිණුම්කරණ ඇස්තමේන්තුවල ස්වභාවය.
- ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ ප්‍රමාණය.
- ක්‍රම හෝ භාවිත කළ ආදර්ශවල සංකීර්ණත්වය.
- සම නොවන අර්ථ නිරූපණයන්ට හෝ පරිචයන්ට යටත්විය හැකි දන්නා ක්ෂේත්‍ර හෝ ගිණුම්කරණ ඇස්තමේන්තු කළේ කෙසේද යන්න තුළ අසංගතතාවයන් ඇති ක්ෂේත්‍ර තිබේද යන්න ඇතුළුව, ගිණුම්කරණ ඇස්තමේන්තුවකට අදාළ වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක අවශ්‍යතාවයන්ගේ සංකීර්ණත්වය.
- ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානමට ප්‍රතිචාර දැක්වීම ලෙස භාරගැනීම අපේක්ෂා කරන විගණකගේ ක්‍රියාපටිපාටි.
- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් පැහැදිලිව සඳහන් නොකළ කරුණු පිළිබඳ විනිශ්චයක් සඳහා අවශ්‍යතාවයක්.
- දත්ත සහ උපකල්පන තෝරා ගැනීමට අවශ්‍යකරණ විනිශ්චයේ ප්‍රමාණය.
- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී තොරතුරු තාක්ෂණය අස්තිත්ත්වය භාවිත කිරීමේ ප්‍රමාණය සහ සංකීර්ණතාවය.

විශේෂඥ කුසලතා සහ දැනුම ඇති පුද්ගලයන්ගේ සහභාගී කරගැනීමේ ස්වභාවය, කල් නිර්ණය සහ ප්‍රමාණය විගණනය පුරාවටම වෙනස් විය හැකිය.

අ62. ගිණුම්කරණය හෝ විගණනය හැර (උදාහරණ ලෙස අගය කිරීමේ කුසලතා) වෙනත් ක්ෂේත්‍රවල කරුණු වලට සම්බන්ධ කරගන්නා විට විශේෂඥ කුසලතා හෝ අවශ්‍යකරන දැනුම විගණක සතු නොවිය හැකිය සහ විගණකගේ විශේෂඥයෙක් භාවිතා කිරීම අවශ්‍ය විය හැකිය.[40]

අ63. බොහෝ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට විශේෂඥ නිපුණතා හෝ දැනුම ව්‍යවහාර කිරීම අවශ්‍ය නොවේ. උදාහරණ ලෙස සරල තොග යල්පැනීමක් ගණනය කිරීමට විශේෂඥ කුසලතා හෝ දැනුම අවශ්‍ය නොකෙරේ. එහෙත් බැංකුකරණ ආයතනයක අපේක්ෂිත ණයහානි හෝ රක්ෂණ ආයතනයක රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා විශේෂඥ කුසලතා හෝ දැනුම ව්‍යවහාර කිරීම අවශ්‍ය වේ යයි විගණක නිගමනය කළ හැකිය.

---

38 ශ්‍රීලවිප්‍ර 560, පසුව සිදුවීම්, 14 ඡේදය.

39 ශ්‍රීලවිප්‍ර 220, *මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා තත්ත්ව පාලනය* 14 වන ඡේදය සහ ශ්‍රීලවිප්‍ර 300 *මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැලසුම් කිරීම* 8(ඵ) ඡේදය

40 ශ්‍රීලවිප්‍ර 620, *විගණකගේ විශේෂඥයාගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම*

**ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම (යොමුව : 4, 16 ඡේද)**

අ64. සැදහුම් මට්ටමේ ගිණුම්කරණ ඇස්තමේන්තුවක ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගැනීමට සහ තක්සේරු කිරීම මූල්‍ය ප්‍රකාශවල හඳුනා ගෙන ඇති එම දේට පමණක් නොව එසේම මූල්‍ය ප්‍රකාශවලට වන සටහන් තුළ ඇතුළත් දේ ඇතුළුව සියලු ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වැදගත් වේ.

අ65. ශ්‍රීලවිප්‍ර 200 අ42 ඡේදයේ ශ්‍රීලවිප්‍ර සාමාන්‍යයෙන් ආවේණික අවදානම සහ පාලන අවදානම වෙන වෙනම හඳුන්වන්නේ නැති බව සඳහන් වේ. කෙසේ වෙතත් ශ්‍රීලවිප්‍ර 330[41] සමඟ අනුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සැදහුම් මට්ටමේදී සැලකිය යුතු අන්දමේ අවදානම් ඇතුළුව ප්‍රමාණාත්මක අවප්‍රකාශයක, අවදානම්වලට ප්‍රතිචාර දැක්වීමට තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සඳහා පදනමක් ලබාදීමට, ආවේණික අවදානමේ සහ පාලන අවදානමේ වෙන් වෙන්ව වූ තක්සේරුවක් මෙම ශ්‍රීලවිප්‍ර මගින් අවශ්‍ය කෙරේ.

අ66. ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනාගැනීමේදී සහ ආවේණික අවදානම තක්සේරු කිරීමේදී ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය, සංකීර්ණතාවය පුද්ගලගතභාවයට හෝ වෙනත් ආවේණික අවදානම් සාධකවලට යටත් වී ඇත්තේ කුමන ප්‍රමාණයකටද හෝ බලපෑම්වලට යටත් වී ඇත්තේ කුමන ප්‍රමාණයකට යන්න විගණක සැළකිල්ලට ගැනීම අවශ්‍ය කෙරේ. ආවේණික අවදානම් සාධකවල විගණකගේ සැළකිල්ලට ගැනීම, එලෙසම පහත දෑ නිර්ණය කිරීමේ තොරතුරු ලබාදිය හැකිය.

- ආවේණික අවදානමේ ප්‍රේක්ෂාවලිය මත ආවේණික අවදානම තක්සේරුව මනින අවස්ථාවේදී; සහ
- සැදහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම්වල තක්සේරුවට දී ඇති හේතු සඳහා සහ එම හේතුවලට ප්‍රතිචාර ලෙස 18 වන ඡේදය සමඟ අනුකූලව විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි.

ආවේණික අවදානම් සාධක අතර අන්තර් සබඳතාවය 1 වන පරිශිෂ්ඨයේ තවදුරටත් විස්තර කෙරේ.

අ67. සැදහුම් මට්ටමේදී ආවේණික අවදානමේ විගණකගේ තක්සේරුව සඳහා හේතුවන්නේ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ සංකීර්ණතාවය, පුද්ගලගතභාවය හෝ වෙනත් අවදානම් සාධක යන, ආවේණික අවදානම් සාධකවලින් එකක් හෝ ඊට වැඩි ගණනකින් වන ප්‍රතිඵලයෙනි. උදාහරණ ලෙසඃ

(අ) අපේක්ෂාකරන ණය හානිවල, ගිණුම්කරණ ඇස්තමේන්තු සංකීර්ණ විය හැකිවීමට හේතුවන්නේ අපේක්ෂිත ණයහානි ඍජුව නිරීක්ෂණය කළ නොහැකි නිසා සහ සංකීර්ණ ආදර්ශයක භාවිත කිරීම අවශ්‍ය කිරීමයි. අනාවැකි පල කිරීමට අපහසු විය හැකි අස්තිත්වයට විශේෂිත විවිධත්වයේ සිදුවීම් පෙළක අනාගත සංවර්ධනය පිළිබඳ සංකීර්ණ ඓතිහාසික තොරතුරු සහ උපකල්පන කට්ටලයක් ආදර්ශය ලෙස භාවිත කළ හැකිය. අපේක්ෂිත ණය හානි සඳහා ගිණුම්කරණ ඇස්තමේන්තු ඉහළ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයකට සහ අනාගත සිද්ධීන් සහ තත්ත්වයන් පිළිබඳ විනිශ්චයන් කිරීම තුළ සැලකිය යුතු අන්දමේ පුද්ගලගතභාවයට යටත් විය හැකිය. මේ හා සමාන සැළකිල්ලට ගැනීම් රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා අදාළ වේ.

(ආ) පුළුල් පරාසයක වෙනස් තොග වර්ග සහිත අස්තිත්ත්වයක තොග යල් පැනීම සඳහා ප්‍රතිපාදනයක ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීම සඳහා සංකීර්ණ පද්ධති සහ ක්‍රියාවලි අවශ්‍ය විය හැකිය. එහෙත් තොගවල ස්වභාවය මත රඳා පවතිමින් එයට සම්බන්ධ වන්නේ කුඩා පුද්ගලගතභාවයන් සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ ප්‍රමාණය පහත් විය හැකිය.

(ඇ) වෙනත් ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සංකීර්ණ නොවිය හැකි අතර එහෙත් ඉහළ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක් තිබිය හැකි අතර සැලකිය යුතු අන්දමේ විනිශ්චයන් අවශ්‍ය විය හැකිය. උදාහරණ ලෙස වගකීමක් පිළිබඳව තනි තීරණාත්මක විනිශ්චයක් අවශ්‍ය කරන ගිණුම්කරණ ඇස්තමේන්තුවක්, නඩුකීමක ප්‍රතිඵලය මත ප්‍රතිඵලය වන වටිනාකම අසම්භාව්‍ය වේ.

අ68. ආවේණික අවදානම් සාධකවල අදාළත්වය සහ වැදගත්කම එක ඇස්තමේන්තුවක සිට වෙනත් ඇස්තමේන්තුවකට වෙනස් විය හැකිය. ඒ අනුව ආවේණික අවදානම් සාධක, එක්කෝ තනිතනිව හෝ සංයෝජනයක් ලෙස, සරල ගිණුම්කරණ ඇස්තමේන්තුවකට බලපාන්නේ අඩු ප්‍රමාණයකට සහ විගණක විසින් අඩු අවදානම් හඳුනාගත හැකි හෝ ආවේණික අවදානමේ ප්‍රේක්ෂාවලියේ පහළ අන්තයේ ආවේණික අවදානම තක්සේරු කරයි.

---

41 ශ්‍රීලවිප්‍ර 330, 7(ඇ) ඡේදය.

අ69. ප්‍රතිවිරුද්ධව, ආවේණික අවදානම් සාධක, එක්කෝ තනි තනිව හෝ සංයෝජිතව, සංකීර්ණ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට විශාල ප්‍රමාණයකට බලපායි සහ ආවේණික අවදානම් ප්‍රේක්ෂාවලියේ ඉහළ කෙළවරේ ආවේණික අවදානම තක්සේරු කිරීමට විගණකට හේතු විය හැකිය. මෙම ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ආවේණික අවදානම් සාධකයන්ගේ බලපෑම සඳහා විගණකගේ සැළකිල්ලට ගැනීම්, ප්‍රමාණාත්මක අවප්‍රකාශයේ හඳුනාගත් අවදානමේ ඍජුව බලපාන සංඛ්‍යාව සහ ප්‍රමාණය එවැනි අවදානම් තක්සේරුව සහ අවසාන වශයෙන් තක්සේරු කළ අවදානම්වල ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය කරන විගණන සාක්ෂිවල ඒත්තු ගන්වන ස්වභාවය, එලෙසම මෙම ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා විගණකගේ වෘත්තීය සංශය දෘෂ්ඨිය ව්‍යවහාර කිරීම විශේෂයෙන්ම වැදගත් වේ.

අ70. සැදහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්හි අවදානම් හි විගණකගේ තක්සේරුවට අදාළ අමතර තොරතුරු මූල්‍ය ප්‍රකාශවල දිනට පසුව සිදුවන සිද්ධීන් ලබාදිය හැකිය. උදාහරණ ලෙස විගණනය තුළ දී දැන ගැනීමට ලක්වූ ගිණුම්කරණ ඇස්තමේන්තුවක ප්‍රතිඵලය. එවැනි අවස්ථාවන්හිදී සැදහුම් මට්ටමේ[42] ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානමේ විගණක තක්සේරු කරයි හෝ තක්සේරුව ප්‍රතිශෝධනය කරයි. ගිණුම්කරණ ඇස්තමේන්තුවක්, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය, සංකීර්ණත්වය, පුද්ගලගතභාවය හෝ වෙනත් ආවේණික අවදානම් සාධක මගින් බලපාන්නේ හෝ යටත් වන්නේ කුමන ප්‍රමාණයට යන්න නොසලකා මූල්‍ය ප්‍රකාශවල දිනට පසුව සිදුවන සිද්ධීන්, 18 වන ඡේදය සමඟ අනුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු තුළ පරීක්ෂා කිරීමට පිවිසුම් මගක් තෝරා ගැනීමට එලෙසම විගණකට බලපෑම් කළ හැකිය. උදාහරණ ලෙස තෝරාගත් සේවකයන් සඳහා වන්දි ගෙවීමේ සරල ප්‍රතිශතයක් මත පදනම්ව සරල ප්‍රසාද දීමනා උපචිත කිරීම සඳහා සාපේක්ෂ සංකීර්ණත්වයෙන් හා පුද්ගලගතභාවයෙන් අඩු ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී සැදහුම් මට්ටමේදී ආවේණික අවදානමේ ප්‍රේක්ෂාවලියේ පහළ අන්තයේ ආවේණික අවදානමක් තක්සේරු කළ හැකිය. පසුව එන කාලපරිච්ඡේදයේ අවසානයේ ප්‍රසාද දීමනා ගෙවීමෙන් සැදහුම් මට්ටමේ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් සම්බන්ධයේ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාදිය හැකිය.

අ71. වඩා කැමති විගණන ශිල්පක්‍රම සහ ක්‍රමවේදයන් මත පදනම්ව පාලන අවදානමේ විගණකගේ තක්සේරුව වෙනස් ක්‍රමවලින් සිදුකළ හැකිය. පාලන අවදානම් තක්සේරුව ප්‍රකාශ කළ හැක්කේ ගුණාත්මක ප්‍රවර්ග භාවිත කිරීමෙන් (උදාහරණ ලෙස උපරිම, මධ්‍යස්ථ හෝ අවම ලෙස පාලන අවදානම් තක්සේරුව) හෝ හඳුනාගත් අවදානම ඇමතීමේදී පාලනය(යන්) කොපමණ සඵලදායක යන විගණකගේ අපේක්ෂාවන්ගේ භාෂිතයෙන්ය. එනම් පාලනවල මෙහෙයුම් සඵලදායකත්වය මත සැලසුම් කළ විශ්වාසදායකත්වය. උදාහරණ ලෙස උපරිම ලෙස පාලන අවදානම තක්සේරු කළහොත්, පාලන මෙහෙයුම්වල සඵලදායකත්වය මත විශ්වාසයක් තැබිය නොහැකි බව විගණක කල්පනාකර බලයි. පාලන අවදානම් තක්සේරුවන්නේ උපරිමයට වඩා අඩුවෙන් නම්, පාලන මෙහෙයුම්වල සඵලදායකත්වය මත විගණක විශ්වාසය තැබීම සලකා බලයි.

*ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය* (යොමුව ඃ 16(අ) ඡේදය)

අ72. අනියතතාවය ඇස්තමේන්තු කිරීමේ කුමන ප්‍රමාණයකට ගිණුම්කරණ ඇස්තමේන්තු යටත් වන්නේද යන්න සැළකිල්ලට ගැනීමේදී පහත දෑ පිළිබඳ විගණක සැළකිල්ලට ගනී;

- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් පහත දෑ අවශ්‍ය වන්නේද;
    - ඉහළ ඇස්තමේන්තු කළ ආවේණික අනියතතා මට්ටමක් ඇති ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමට භාවිත කරන ක්‍රමයක්. උදාහරණ ලෙස මූල්‍ය වර්තාකරණ ආකෘතිමය රාමුව නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වල භාවිතය අවශ්‍ය විය හැකිය.
    - දීර්ගකාලීන පුරෝකථන කාලපරිච්ඡේදයක් සහිත උපකල්පන, නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පදනම් වන උපකල්පන සහ එබැවින් කළමනාකාරිත්වයට සංවර්ධනය කිරීමට අසීරු හෝ එකිනෙක සම්බන්ධය වෙනස් උපකල්පන භාවිතය වැනි එම උපකල්පන භාවිතය ආවේණික ඉහළ මට්ටමේ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක් ඇත.
    - ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට හෙළිදරව් කිරීම.
- ව්‍යාපාරික පරිසරය ප්‍රචණ්ඩ හෝ වියහැකි කඩාකප්පල්කාරී සිදුවීම් සිදුවන වෙළඳපොළක අස්තිත්ත්වය සක්‍රිය විය හැකි (උදාහරණ ලෙස විශාල විදේශ ව්‍යවහාර මුදල් සංචලනය වන හෝ අක්‍රිය වෙළඳපොළක) සහ එබැවින් ගිණුම්කරණ ඇස්තමේන්තු පදනම් විය හැක්කේ කරදරයක් නොමැතිව නිරීක්ෂණය කළ නොහැකි දත්ත මතය.)

[42] ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත), 31 වන ඡේදය.

- කළමනාකාරිත්වය සඳහා (ප්‍රායෝගික වන්නේ නම් හෝ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් අවසර දෙන පරිදි යම්කිසි ප්‍රමාණයකට) පහත දේ හැකි වන්නේ නම්ඃ
  - අතීත ගනුදෙනුවක අනාගත උපලබ්ධිවීම පිළිබඳ නිරවද්‍ය හා විශ්වාසදායක අනාවැකි කිරීම (උදාහරණ ලෙසඃ අසම්භාව්‍ය ගිවිසුම් ගැන නියමයක් යටතේ ගෙවනු ලබන වටිනාකම) හෝ අනාගත සිද්ධීන්ගේ හෝ තත්ත්වයන් පිළිබඳ බලපායි. (උදාහරණ වශයෙන් අනාගත ණය හානිවල වටිනාකම හෝ රක්ෂණ හිමිකම් පෑම් නිරවුල් කරනු ලබන වටිනාකම සහ එය නිරවුල් කිරීමේ කාලනිර්ණය); හෝ
  - වර්තමාන තත්ත්වය පිළිබඳ නිරවද්‍ය සහ සම්පූර්ණ තොරතුරු ලබාගැනීමට (උදාහරණ වශයෙන් සාධාරණ අගය ඇස්තමේන්තුවක් සංවර්ධනය කිරීමට මූල්‍ය ප්‍රකාශවල දිනදී වෙළඳපොළ සහභාගිවන්නන්ගේ සාපේක්ෂ වැදගත්කම පිළිබිඹු විය හැකි අගය කිරීමේ ස්වභාවය පිළිබඳ තොරතුරු).

අ73. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සඳහා මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත් හෝ හෙළිදරව් කළ වටිනාකම් ප්‍රමාණය එය මගින්ම අවප්‍රකාශයකට එහි නැඹුරුවීම පිළිබඳ හැඟවීමක් නොවන නිසා උදාහරණයක් ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තුවක් අඩුවෙන් සඳහන් කිරීම විය හැකිය.

අ74. සමහර තත්ත්වයන්හිදී ඇස්තමේන්තු කිරීමේ අනියතාවය ඉතා ඉහළ විය හැකි බැවින් සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කළ නොහැකිය. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මූල්‍ය ප්‍රකාශ තුළවන අයිතමයක් හඳුනාගැනීම හෝ එහි සාධාරණ අගයට මැණීම වළක්වාලිය හැකිය. එවැනි අවස්ථාවන්හිදී ගිණුම්කරණ ඇස්තමේන්තුවක් හඳුනාගත යුතුද යන්න පමණක් නොව හෝ එය සාධාරණ අගයට මැනිය යුතුද, එලෙසම හෙළිදරව් කිරීම්වල සාධාරණත්වයට සම්බන්ධ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානමක් තිබිය හැකිය. එවැනි ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ගිණුම්කරණ ඇස්තමේන්තු හෙළිදරව් කිරීම සහ ඒවා සම්බන්ධ ආශ්‍රිත අනියතතාවයේ ඇස්තමේන්තුවක් හෙළිදරව් කිරීම අවශ්‍ය කෙරේ. (අ112-අ113, අ143-අ144 ඡේද)

අ75. සමහර අවස්ථාවලදී ගිණුම්කරණ ඇස්තමේන්තුවකට සම්බන්ධිත ඇස්තමේන්තු කිරීම් අනියතතා අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු අන්දමේ සැකපහළ කළ හැකිය. ශ්‍රීලවිප්‍ර 570 (සංශෝධිත)[43] එවැනි පවත්නා තත්ත්වයන්හි අවශ්‍යතාවයන් සහ මගපෙන්වීම් ස්ථාපනය කරයි.

*සංකීර්ණත්වය සහ පුද්ගලගතභාවය* (යොමුව ඃ 16 (ආ) ඡේදය)

ක්‍රමය තෝරාගැනීමේදී සහ ව්‍යවහාරකරණයේදී සංකීර්ණතාවය බලපාන ප්‍රමාණය

අ76. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී භාවිත කළ ක්‍රමය තෝරා ගැනීමේදී සහ ව්‍යවහාර කිරීමේදී සංකීර්ණතාවය, මගින් කුමන ප්‍රමාණයකට බලපාන්නේද යන්න සැළකිල්ලට ගැනීමේදී, විගණක සැලකිය හැක්කේ;

- කළමනාකාරිත්වය මගින් විශේෂඥ නිපුණතාවය හෝ දැනුමේ අවශ්‍යතාවය සඳහා ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමට භාවිතකරන ක්‍රමය ආවේණිකව සංකීර්ණබව ඇඟවිය හැකි අතර එම නිසා ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමකට විශාල ලෙස නැඹුරු විය හැකිය. අභ්‍යන්තරව කළමනාකාරිත්වය ආදර්ශයක් සංවර්ධනය කළවිට සහ සාපේක්ෂව එසේ කිරීමට ස්වල්ප පළපුරුද්දක් ඇතිවිට හෝ පිළි ගැනීමක් නොමැති ක්‍රමයක් ව්‍යවහාර කරන ආදර්ශයක් හෝ විශේෂ කර්මාන්තයේ පරිසරයේ පොදුවේ භාවිත නොකරන ආදර්ශයක් භාවිතා කරයි නම් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානමකට විශාල ලෙස නැඹුරු විය හැකිය.
- අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවකින් අවශ්‍යකරන මූලික මැනීමේ ස්වභාවය, බහුවිධ මූලාශ්‍රවලින් ඓතිහාසික සහ ඉදිරි දැක්මක් ඇති දත්ත සහ උපකල්පන ඒවා සමඟ බහුවිධ අන්තර් සම්බන්ධතාවයක් සහිත සංකීර්ණ ක්‍රමයක් අවශ්‍යකරන අවශ්‍යතාවය ප්‍රතිඵලයක් විය හැකිය. උදාහරණ ලෙස අපේක්ෂිත ණය හානි ප්‍රතිපාදනයකට, අනාගත ණය ගෙවීම් සහ ඓතිහාසික පළපුරුද්දේ දත්ත සැළකිල්ලට ගැනීම මත පදනම් වෙනත් මුදල් ප්‍රවාහ සහ ඉදිරි දැක්මේ උපකල්පන ව්‍යවහාර කිරීම පිළිබඳ විනිශ්චයක් අවශ්‍ය විය හැකිය. ඒ හා සමානව රක්ෂණ ගිවිසුම් වගකීමක්, අනාගත රක්ෂණ ගිවිසුම් ගෙවීම් ඓතිහාසික පළපුරුද්ද සහ ප්‍රවර්තන සහ උපකල්පිත අනාගත උපනති පදනම් කළ හැකි ප්‍රක්ෂේපනයක් සහ පිළිබඳ විනිශ්චයක් අවශ්‍ය විය හැකිය.

---

[43] ශ්‍රීලවිප්‍ර 570 (සංශෝධිත), *අඛණ්ඩ පැවැත්ම.*

දත්ත තෝරා ගැනීම සහ ව්‍යවහාරකරණය සංකීර්ණතාවය බලපෑමේ ප්‍රමාණයේ තරම

අ77. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී භාවිත කළ දත්ත තෝරා ගැනීම සහ ව්‍යවහාරකරණයේදී සංකීර්ණතාවය මගින් බලපෑමේ ප්‍රමාණය සැළකිල්ලට ගැනීම් විගණක සැලකිය යුත්තේ.

- දත්ත මූලාශ්‍රයේ අදාළත්වය සහ විශ්වාසදායකත්වය සැළකිල්ලට ගැනීමේදී දත්ත උපද්දවා ගැනීමේ ක්‍රියාවලියේ සංකීර්ණතාවය එක්තරා මූලාශ්‍රවලින් ලබාගන්නා දත්ත වෙනත් මූලාශ්‍රවලින් ලබාගන්නා දත්ත වලට වඩා විශ්වාසදායකය. එසේම රහස්‍යභාවය හෝ හිමිකාරත්වය යන හේතු සඳහා එලෙසම සමහර බාහිර තොරතුරු මූලාශ්‍ර ඔවුන් විසින් ලබාදෙන දත්තවල විශ්වාසදායකත්වය සැළකිල්ලට ගැනීමේදී අදාළ වියහැකි තොරතුරු හෙළිදරව් නොකිරීම (සම්පූර්ණ හෙළිදරව් නොකිරීම) උදාහරණයකට ඔවුන් භාවිත කළ පාදක තොරතුරුවල ප්‍රභවය හෝ කෙසේ ඒවා සමුච්චය කළේ, සැකසුම් කළේ කෙසේද යන්න.

- දත්තවල අවංකභාවය පවත්වාගෙනයාමේ ආවේණික සංකීර්ණතාවය. විශාල පරිමාවක දත්ත ඇතිවිට සහ බහුවිධ දත්ත මූලාශ්‍ර ඇතිවිට, ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමට එම දත්ත භාවිත කරනවිට අවංකභාවය පවත්වාගෙනයාමට ආවේණික සංකීර්ණතාවයක් තිබිය හැකිය.

- සංකීර්ණ ගිවිසුම්ගත කොන්දේසි අර්ථකථනය කිරීමේ අවශ්‍යතාවය ඃ උදාහරණ ලෙස වාණිජ සැපයුම්කරුවෙකුගෙන් හෝ ගනුදෙනුකරුවෙකුගෙන් පැනනගින මුදල් ගලාඒම්වල හෝ ගලායාම් නිර්ණය කිරීමේදී ප්‍රතිදාන රඳා පැවතිය හැක්කේ ඉතා ඉහළ සංකීර්ණ ගිවිසුම්ගත කොන්දේසි අවබෝධ කරගැනීමට හෝ අර්ථකථනය කිරීමට නිශ්චිත පළපුරුද්දක් හෝ නිපුණතාවය අවශ්‍යකරන පදනම මතය.

ක්‍රමය, උපකල්පනය හෝ දත්ත තෝරාගැනීමේදී හෝ ව්‍යවහාර කිරීමේදී එය පුද්ගලගතභාවයට බලපාන ප්‍රමාණයේ තරම

අ78. ක්‍රම, උපකල්පන හෝ දත්ත තෝරා ගැනීම සහ ව්‍යවහාරකරණය කිරීමේදී පුද්ගලගතභාවය මගින් වන බලපෑමේ ප්‍රමාණයේ තරමේ සැළකිල්ලට ගැනීමේ විගණක සැළකිල්ලට ගතහැක්කේ;

- ඇස්තමේන්තු කිරීමේ ක්‍රම තුළ භාවිත කළ සාධක අගය කිරීමේ පිවිසුම් මාර්ග සංකල්ප, ශිල්ප ක්‍රම සහ සාධක අදාළ මූල්‍ය වාර්තා හෝ ආකෘතිමය රාමුව නිශ්චය නොකරන්නේ කුමන ප්‍රමාණයකට යනවග;

- පුරෝකථක කාලපරිච්ඡේදයේ දිග ඇතුළුව, වටිනාකම හෝ කාල නිර්ණය සම්බන්ධයෙන් අනියතතාවය, වටිනාකම සහ කාල නිර්ණය ආවේණික ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක් මූලාශ්‍රයක් වේ සහ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරාගැනීමේ කළමනාකාරිත්වයේ විනිශ්චය අවශ්‍යතාවය හට ගන්වේ. එය එකින් එක කළමනාකාරිත්වය පක්ෂග්‍රාහී බවේ අවස්ථාවක් ඇති කරයි. උදාහරණ ලෙස ඉදිරි දැක්මේ උපකල්පන ඇතුළත් කරන ගිණුම්කරණ ඇස්තමේන්තුවක ඉහළ ප්‍රමාණයක පුද්ගලගතභාවය තිබිය හැකි අතර එය කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී බවට නැඹුරු විය හැකිය.

*වෙනත් ආවේණික අවදානම් සාධක* (යොමුව ඃ 16 (ආ) ඡේදය)

අ79. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සමඟ ආශ්‍රිත පුද්ගලගත බවේ ප්‍රමාණය, කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී බව හෝ වංචාවක් නිසා ගිණුම්කරණ ඇස්තමේන්තුවක් අවප්‍රකාශයකට බොහෝවිට නැඹුරු වීමට බලපායි. උදාහරණයක් ලෙස, ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ඉහළ ප්‍රමාණයක පුද්ගලගතභාවයට යටත්වන විට, ගිණුම්කරණ ඇස්තමේන්තු කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී බව හෝ වංචා නිසා ගිණුම්කරණ ඇස්තමේන්තු අවප්‍රකාශයකට නැඹුරුවීම බොහෝදුරට සිදුවිය හැකි අතර පුළුල් පරාසයක වියහැකි මැනීමේ ප්‍රතිඵලයක, මෙයින් එලයක් විය හැකිය. පවතින තත්ත්වයන් තුළ යෝග්‍ය නොවන හෝ බලපෑම් වලින් අචේතනිය හෝ චේතාන්විත කළමනාකාරීත්වයේ පක්ෂග්‍රාහී පරාසය තුළින් කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවකට කළමනාකාරිත්වය තෝරාගත හැකිය සහ එබැවින් එය අවප්‍රකාශ වී ඇත. අඛණ්ඩව පවතින විගණන සඳහා ඉහතින් වූ කාලපරිච්ඡේද වල විගණනය තුළදී හඳුනාගත් විය හැකි කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීවීම්වල හැඟවීම ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ, සැලසුම්කරණය සහ අවදානම් තක්සේරු පටිපාටි වලට බලපෑම් කළ හැකිය.

*සැලකිය යුතු අන්දමේ අවදානම්* (යොමුව ඃ 17 වන ඡේදය)

අ80. ප්‍රමාණාත්මක අවප්‍රකාශයක හඳුනාගත් සහ තක්සේරු කළ ඕනෑම අවදානමක් සැලකිය යුතු අන්දමේ අවදානමක්දැයි නිර්ණය කිරීමේදී ආවේණික අවදානමේ විගණකගේ තක්සේරු කිරීමේදී සැළකිල්ලට

ගන්නේ ගිණුම්කරණ ඇස්තමේන්තුවකට ඇස්තමේන්තුව කිරීමේ අනියතාවය, සංකීර්ණතාවය පුද්ගලගතභාවයට හෝ වෙනත් ආවේණික අවදානම මගින් කොපමණ ප්‍රමාණයකට යටත් ද හෝ ඒ හා බලපෑමට ලක්ව ඇත්ද යන්න විගණකට උපකාරී වේ.

## ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම්වලට ප්‍රතිචාර

*විගණකගේ තවදුරටත් වන විගණන පටිපාටි* (18 වන ඡේදය)

අ81. තවදුරටත් වන විගණන පටිපාටි සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී 18 වන ඡේදයේ ලැයිස්තුගත කළ පරීක්ෂා කිරීමේ පිවිසුම් මාර්ග තුනෙන් ඕනෑම එකක් (තනි තනිව හෝ සංයෝජනයක් වශයෙන්) විගණක භාවිත කළ හැකිය. උදාහරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමට උපකල්පන ගණනාවක් භාවිත කළවිට, පරීක්ෂා කළ සෑම උපකල්පනයකටම වෙනස් පිවිසුම් මගක් භාවිත කිරීමට විගණක තීරණය කළ හැකිය.

තහවුරු කරන හෝ පරස්පරවන වූවත් අදාළ විගණන සාක්ෂි ලබා ගැනීම

අ82. විගණන සාක්ෂි සමන්විත වන්නේ, කළමනාකාරීත්වයේ සැඳහුම් සනාථ හෝ තහවුරු කෙරෙන සහ එවැනි සැඳහුම්[44] පරස්පරවන ඕනෑම තොරතුරක් යන තොරතුරු දෙකම මගිනි. විගණන සාක්ෂියක් අපක්ෂපාති ආකාරයට ලබා ගැනීමේදී, අස්තිත්ත්වය තුළින් හෝ ඊට බාහිරව යන බහු-ආංගික මූලාශ්‍රයන්ගෙන් සාක්ෂි ලබාගැනීම අවශ්‍ය කෙරේ. කෙසේ වෙතත් විය හැකි විගණන සාක්ෂි වල සියලුම මූලාශ්‍රයන් හඳුනාගැනීම සවිස්තරාකාර සෙවුමක් විගණක ඉටු කිරීම අවශ්‍ය නොවේ.

අ83. විගණකගේ අවදානමේ තක්සේරුව ඉහළ නම් විගණකට වඩාත් ඒත්තු ගන්වන සුළු විගණන සාක්ෂි ලබාගැනීමට ශ්‍රීලවිප්‍ර 330 න් අවශ්‍ය කෙරේ.[45] එබැවින් ගිණුම්කරණ ඇස්තමේන්තුවකට සම්බන්ධ ආවේණික අවදානම්, ආවේණික අවදානමේ ප්‍රේක්ෂාවලියේ ඉහළ අන්තයේ ලෙස තක්ස්රු කර ඇතිවිට, විගණන සාක්ෂිවල ස්වභාවය හෝ ප්‍රමාණය ගැන සැළකිල්ලක් දැක්වීම වඩාත් වැදගත් විය හැකිය.

පරිමාණගත කිරීම

අ84. විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටිවල ස්වභාවය කාලනිර්ණය සහ ප්‍රමාණයේ බලපෑම් වලට ලක්වීම් සඳහා උදාහරණ ලෙසඃ

- අවශ්‍යකරණ විගණන සාක්ෂිවලට ඒත්තු ගන්වන සුළුභාවයේ බලපෑම් කරන ප්‍රමාණයක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවක් විගණනයට විගණක තෝරාගත් පිවිසුම් මගට බලපෑම් කරයි. උදාහරණ ලෙස සරලව උපචිත කල ප්‍රසාද දීමනාවක් කාලපරිච්ඡේදය අවසන් වූ වහාම සේවකයනට ගෙවා ඇති අවස්ථාවක, ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරුකළ අවදානම්වලට සම්බන්ධිත පැවැත්ම හෝ අගය කිරීමේ සැඳහුම් පහළ විය හැකිය. මෙම තත්ත්වයේදී, වෙනත් පරීක්ෂා කිරීමේ පිවිසුම් මාර්ග තුළින් වනවාට වඩා විගණකගේ වාර්තාවේ දිනය තෙක් සිදුවන සිද්ධින් අගය කිරීම මගින් යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි විගණකට ලබාගැනීම වඩා ප්‍රායෝගික විය හැකිය.
- ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් සඳහා හේතු.

*අදාළ පාලන වල මෙහෙයුම් සඵලදායකත්වය මත විශ්වාසය තැබීමට විගණක අපේක්ෂා කරනවිට* (යොමුව ඃ 19 ඡේදය)

අ85. සැලකිය යුතු අන්දමේ අවදානම් සඳහා ඇතුළුව ආවේණික අවදානම, ආවේණික අවදානමේ ප්‍රේක්ෂාවලිය මත ඉතා ඉහළලෙස තක්සේරු කර ඇති විටක අදාළ පාලන වල මෙහෙයුම් සඵලදායකත්වය පරීක්ෂා කිරීම යෝග්‍ය විය හැකිය. මෙය අවස්ථාවක් විය හැක්කේ ගිණුම්කරණ ඇස්තමේන්තු ඉතා ඉහළ මට්ටමේ සංකීර්ණතාවය මගින් බලපෑමට ලක්ව ඇති හෝ යටත්ව ඇත්නම්ය. ගිණුම්කරණ ඇස්තමේන්තු ඉහළ ප්‍රමාණයක පුද්ගලගත භාවයක් මගින් බලපෑමට ලක්ව ඇති විටෙක සහ එමනිසා කළමනාකාරිත්වය මගින් සැලකිය යුතු අන්දමේ විනිශ්චයක් කිරීම අවශ්‍ය කෙරේ. පාලන සැලසුම් කිරීමේදී සඵලදායකත්වය තුළවන ආවේණික සීමා කිරීම්, පාලනයන්හි මෙහෙයුම් සඵලදායකත්වය මත පරීක්ෂා කරනවාට වඩා, සත්තාවි ක්‍රියාපටිපාටි මත වැඩි අවධානයක් තැබීමට විගණක යොමු විය හැකිය.

[44] ශ්‍රීලවිප්‍ර 500 අ1 ඡේදය
[45] ශ්‍රීලවිප්‍ර 330, 7(ආ) සහ අ19 ඡේද

අ86. ගිණුම්කරණ ඇස්තමේන්තුවල පාලනවලට සම්බන්ධිත මෙහෙයුම් සඵලදායකත්වය පරීක්ෂා කිරීමේ ස්වභාවය කාලනිර්ණය සහ ප්‍රමාණය නිර්ණය කිරීමේදී විගණක පහත සඳහන් සාධක වැනිදේ සැළකිල්ලට ගත හැකිය.

- ගනුදෙනුවල ස්වභාවය, සංඛ්‍යාතය සහ පරිමාව;
- තක්සේරුකළ ආවේණික අවදානමට සහ පාලනයේ ප්‍රබලතාවයට ප්‍රතිචාර දැක්වීමට පාලන යෝග්‍ය පරිදි සැලසුම් කර ඇත්ද යන්න ඇතුළුව පාලන සැලසුම් කිරීමේදී වන සඵලදායකත්වය.
- ගනුදෙනුවලට සහායවීමට තොරතුරු පද්ධතියේ අසංකලිෂ්ඨ කිරීම ඇතුළුව, අස්තිත්තවය තුළ පිහිටුවා ඇති සමස්ථ අරමුණු සහ ක්‍රියාවලිවලට විශේෂ පාලනයන්හි වැදගත්කම;
- අභ්‍යන්තර පාලනයේ හඳුනාගත් ඌනතාවයක් යන පාලන අධීක්ෂණය කිරීම.
- උදාහරණ ලෙස සහායක දත්ත මත පාලන සමඟ සන්සන්දනය විනිශ්චයක් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධිත පාලන ඇමතීමට අපේක්ෂා කරන පාලනයන්හි අවදානමේ ස්වභාවය;
- පාලන ක්‍රියාවන් තුළ සම්බන්ධ වන අයගේ නිපුණත්වය;
- පාලන ක්‍රියාවන් හි ඉටු කිරීමේ සංඛ්‍යාතය; සහ
- පාලන ක්‍රියාවන් ඉටු කිරීමේ සාක්ෂි.

සත්තාවි ක්‍රියාපටිපාටි වලින් පමණක් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාදිය නොහැකිය.

අ87. සමහර කර්මාන්තවල මූල්‍ය සේවා කර්මාන්තයක් වැනි තැන්වල ව්‍යාපාරික කටයුතු කිරීමට කළමනාකාරිත්වය පුළුල් ලෙස තොරතුරු තාක්ෂණය භාවිත කෙරේ. එබැවින් නියත ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත අවදානම් බොහෝදුරට තිබිය හැකි අතර ඒ සඳහා සත්තාවි පටිපාටිවලට පමණක් යෝග්‍ය විගණන සාක්ෂි ලබාදිය නොහැකිය.

අ88. සැදහුම් මට්ටමේදී කුමන අවදානම සඳහා සත්තාවි පටිපාටි මගින් පමණක් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාදීමට නොහැකි තත්ත්වයන් පැවතීමට ඇතුළත්;

- පොදු සහ උපයෝගී ලෙජර් වලින් බාහිරව ලබාගත් තොරතුරු මුල පිරීමට, වාර්තා කිරීමට, සකස් කිරීම හෝ වාර්තා කිරීම සම්බන්ධිත අවදානම් සැහැල්ලු කිරීමට පාලන අවශ්‍යවන විට,
- එකක් හෝ ඊට වැඩි සැදහුම්වලට සහාය වන තොරතුරු ඉලෙක්ට්‍රොනිකව මුල පිරීම, වාර්තා කිරීම, සැකසුම් කිරීම හෝ වාර්තාකරණය. මෙය අවස්ථාවක් විය හැක්කේ, විශාල පරිමාවක ගනුදෙනු හෝ දත්ත හෝ තොරතුරුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සහතික කිරීම පුළුල් ලෙස තොරතුරු තාක්ෂණය භාවිත කිරීම අවශ්‍යවන භාවිත කළ සංකීර්ණ ආදර්ශයක් ඇති විටය. සංකීර්ණ අපේක්ෂිත ණයගැති ප්‍රතිපාදනයක් මූල්‍ය ආයතනයකට හෝ උපයෝගීතා අස්තිත්ත්වයක් සඳහා අවශ්‍ය විය හැකිය. උදාහරණයක් ලෙස උපයෝගිතා අස්තිත්ත්වයක් සම්බන්ධයෙන්, අපේක්ෂිත ණයහානි ප්‍රතිපාදනය සංවර්ධනය කිරීමේ භාවිත කළ දත්ත, ඉහළ පරිමාවක ගනුදෙනු වලින් ප්‍රතිඵලයක්වන බොහෝ කුඩා ශේෂ වලින් සමන්විත විය හැකිය. මෙවැනි තත්ත්වයන්හිදී, අපේක්ෂිත ණයහානි ප්‍රතිපාදනය සංවර්ධනය කිරීමේදී භාවිත කළ ආදර්ශය වටා ඇති පාලන පරීක්ෂා කිරීමකින් තොරව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගත නොහැකි බව විගණක නිගමනය කළ හැකිය.

එවැනි අවස්ථාවන්හිදී විගණන සාක්ෂිවල ප්‍රමාණවත් බව සහ යෝග්‍යතාවය රඳා පැවතිය හැක්කේ තොරතුරුවල නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය මත පාලනයන්හි සඵලදායකත්වය මතය.

අ89. මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ කොටසක් ලෙස, එක්තරා අස්තිත්ත්ව සඳහා (බැංකු හෝ රක්ෂණකරු වැනි) එලෙසම නීතියෙන් හෝ රෙගුලාසි මගින්, අභ්‍යන්තර පාලනය මත සහතික වීමේ නිගමනයක් ලබාදීමට සම්බන්ධිත අතිරේක ක්‍රියාපටිපාටි භාරගැනීමට විගණකට අවශ්‍ය විය හැකිය. මේ හා සමාන වෙනත් තත්ත්වයන්හිදී, පසුව සිදුවූ වෙනස්වීම් විගණනයේ අදාළත්වයට බලපා හැකිද යන්න නිර්ණය කිරීමට යටත්ව එවැනි ක්‍රියාපටිපාටි ඉටුකරමින් විගණන සාක්ෂි ලෙස තොරතුරු ලබාගැනීමට විගණකට හැකිවිය හැකිය.

*සැලකිය යුතු අන්දමේ අවදානම්* (යොමුවඃ 20 වන ඡේදය)

අ90. සැලකිය යුතු අන්දමේ අවදානමකට ප්‍රතිචාර ලෙස විගණකගේ තවදුරටත් වන විගණන පටිපාටි සමන්විත වන්නේ සත්තාවි පටිපාටිවලින් පමණක් වනවිට එම ක්‍රියාපටිපාටිවලට විස්තරාත්මක පරීක්ෂා ඇතුළත්

කිරීම ශ්‍රීලවිප්‍ර 330[46] න් අවශ්‍ය කෙරේ. එවැනි විස්තරාත්මක පරීක්ෂාවන්ට සැලසුම් කළ යුත්තේ සහ ඉටු කළ යුත්තේ මෙම ශ්‍රීලවිප්‍රයේ 18 වන ඡේදයේ විස්තර කර ඇති සෑම පිවිසුම් මගක් යටතේ සහ පවත්නා තත්ත්වයන් තුළ විගණකගේ වෘත්තීය විනිශ්චය පදනම මතය. ගිණුම්කරණ ඇස්තමේන්තුවකට සම්බන්ධිත සැලකිය යුතු අන්දමේ අවදානම් සඳහා විස්තරාත්මක පරීක්ෂා සඳහා උදාහරණවලට ඇතුළත්;

- පරීක්ෂා කිරීම, උදාහරණ ලෙස කොන්දේසි හෝ උපකල්පනවල තහවුරුවන ගිවිසුම් පරීක්ෂා කිරීම,
- නැවත ගණනය කිරීම, උදාහරණ ලෙස, ආදර්ශයක ගණිතමය නිරවද්‍යතාවය, සත්‍යාපනය.
- තුන්වන පාර්ශවයක් ප්‍රකාශයට පත් කළ තොරතුරු වැනි ලේඛණගත කිරීමට සහාය වන භාවිත කළ උපකල්පන එකඟ වීම.

*විගණකගේ වාර්තාවේ දිනය තෙක් දක්වා සිදුවන සිදුවීම් වලින් විගණන සාක්ෂි ලබාගැනීම* (යොමුවඃ 21 ඡේදය)

අ91. සමහර තත්ත්වයන්හිදී විගණකගේ වාර්තාවේ දිනය තෙක් දක්වා සිදුවන සිද්ධින් ගෙන් විගණන සාක්ෂි ලබා ගැනීම මෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් ඇමතීමට, ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාදිය හැකිය. උදාහරණ ලෙස අසන්තතික නිෂ්පාදනයක් සම්පූර්ණ තොගය කාලපරිච්ඡේදය අවසන් වූ වහාම විකිණීමට සම්බන්ධ ඇස්තමේන්තු ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි, කාලපරිච්ඡේදය අවසානයේ දී එහි ශුද්ධ උපලබ්ධි අගයෙන් ලබාදේ. වෙනත් අවස්ථාවන්හිදී 18 වන ඡේදය තුළවන වෙනත් පිවිසුම් මගක් සමඟ සම්බන්ධය තුළ මෙම පරීක්ෂා කිරීමේ පිවිසුම් මග භාවිත කිරීම අවශ්‍ය විය හැකි ය.

අ92. සමහර ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා විගණකගේ වාර්තාවේ දිනය තෙක් සිදුවන සිද්ධින්ගෙන් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සඳහා ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාදීම පිළිබඳ අපේක්ෂාවක් තැබිය නොහැක. උදාහරණ ලෙස සමහර ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධිතව තත්ත්වයන් හෝ සිද්ධීන් වර්ධනය වන්නේ දීර්ගකරන ලද කාලපරිච්ඡේදයක් පුරාවට පමණි. එලෙසම සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තුවල මැනීමේ අරමුණු නිසා, කාලපරිච්ඡේදයට පසුව වන තොරතුරු ශේෂ පත්‍රදිනට පැවති සිද්ධීන් හෝ තත්ත්වයන් පිළිබිඹු නොවිය හැකිය. එබැවින් සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තුවක් මැනීම සඳහා අදාළ නොවිය හැකි ය.

අ93. නිශ්චය කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන් මෙම පරීක්ෂා කිරීමේ පිවිසුම් මග භාර ගැනීමට විගණක තීරණය නොකරන ලද වුවත්, ශ්‍රීලවිප්‍ර 560 සමඟ විගණකට අනුකූල වීමට සිදුවේ. මූල්‍ය ප්‍රකාශවල යෝග්‍ය පරිදි පිළිබිඹුවන සහ[47] මූල්‍ය ප්‍රකාශ හඳුනාගත්[48] හෙළිදරව් කිරීම් තුළ හෝ ගැලපුම් අවශ්‍යතා හෝ විගණකගේ වාර්තාවේ දිනය සහ මූල්‍ය ප්‍රකාශ වල දිනය අතර සිදුවන සියලුම සිදුවීම්වල ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට සැලසුම් කළ විගණන පටිපාටි ඉටු කිරීමට ශ්‍රීලවිප්‍ර 560 න් විගණකට අවශ්‍ය කෙරේ. සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු හැර බොහෝ ගිණුම්කරණ ඇස්තමේන්තු මනිනුයේ අනාගත තත්ත්වයන්හි ගනුදෙනු හෝ සිද්ධීන්හි ප්‍රතිඵලය මත පදනම්ව නිසා ශ්‍රීලවිප්‍ර 560 යටත් විගණකගේ වැඩ විශේෂයෙන් අදාළ වේ.

*කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තු කළේ කෙසේද යන්න පරීක්ෂා කිරීම* (යොමුව ඃ 22 වන ඡේදය)

අ94. කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කළේ කෙසේද යන්න පරීක්ෂා කිරීමේදී පහත සඳහන් උදාහරණ වල දෑ වන විට යෝග්‍ය පිවිසුම් මගක් විය හැකි යඃ

- පූර්ව කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශවල සිදුකළ මේ හා සමාන ගිණුම්කරණ ඇස්තමේන්තුවල විගණකගේ සමාලෝචනය කළමනාකාරිත්වයේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ ක්‍රියාවලිය යෝග්‍ය ලෙස හඟවනවිට.
- තනිතනිව වැදගත් නොවන එක හා සමාන ස්වභාවයේ විශාල සංගහනයක අයිතම මත ගිණුම්කරණ ඇස්තමේන්තු පදනම් වනවිට.
- ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කළමනාකාරිත්වය සිදුකිරීමට අපේක්ෂා කරන්නේ කෙසේදැයි අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව නියම කරන විට. උදාහරණ ලෙස මේ සඳහා අවස්ථාව විය හැක්කේ අපේක්ෂිත ණය හානිප්‍රතිපාදන සඳහා ය.
- ගිණුම්කරණ ඇස්තමේන්තුව ලබාගන්නේ නිරතුරුව දත්ත සකස් කිරීමෙන්.

---

46 ශ්‍රීලවිප්‍ර 330, 21 වන ඡේදය
47 ශ්‍රීලවිප්‍ර 560, 6 වන ඡේදය
48 ශ්‍රීලවිප්‍ර 560, 8 වන ඡේදය

වෙනත් පරීක්ෂා කිරීමේ පිවිසුම් මගවල් කිසිවක් ඉටු කිරීමට ප්‍රායෝගික නොවනවිට, හෝ එකක් හෝ වෙනත් පරීක්ෂා කිරීමේ පිවිසුම් මාර්ග සමඟ සංයෝජනයක් මත පිවිසුම් මගක් යෝග්‍ය විය හැකි වනවිට කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තු කළේ කෙසේද යන්නත් පරීක්ෂා කිරීමට එලෙසම යෝග්‍ය පිවිසුම් මගක් විය හැකි ය.

පූර්ව කාලපරිච්ඡේද වලින් ක්‍රම උපකල්පන සහ දත්තවල සැලකිය යුතු අන්දමේ වෙනස්වීම් (යොමුවඃ 23(අ), 24(අ), 25(අ) ඡේද)

අ95. පූර්ව කාලපරිච්ඡේදවලින් ක්‍රමයක් තුළ සැලකිය අන්දමේ උපකල්පනයන් හෝ දත්තවල වෙනසක් වනවිට ඒවා නව තත්ත්වයන් හෝ නව තොරතුරු සමඟ පදනම් නොවනවිට හෝ සැලකිය යුතු අන්දමේ උපකල්පන එකිනෙක අතර සහ භාවිත කළ එම වෙනත් ගිණුම්කරණ ඇස්තමේන්තු සමඟ හෝ අස්තිත්ත්වයක් වෙනත් ක්ෂේත්‍රවල ව්‍යාපාරික කටයුතුවල භාවිත කළ සම්බන්ධිත උපකල්පන සමඟ අසංගත වේ නම්, මෙම තත්ත්වය පිළිබඳව කළමනාකාරිත්වය සමග තවදුරටත් සාකච්ඡා කිරීම විගණකට අවශ්‍ය විය හැකි අතර, එසේ කිරීමේදී භාවිත කළ උපකල්පන වල යෝග්‍යතාවය පිළිබඳ කළමනාකාරිත්වයට අභියෝග කළ හැකි ය.

කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීවීම් සඳහා හැඟවීම් (යොමුව ඃ 23(ආ), 24(ආ), 25(ආ) ඡේද)

අ96. කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂග්‍රාහීවීම් හැඟවීම් විගණක හඳුනාගත්විට, පවත්නා තත්ත්වයන් තුළ යෝග්‍ය සහ සහාය දිය හැකි එම ක්‍රම, උපකල්පන සහ භාවිත කළ දත්තවල ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන ඇත්ද යන්න යළි සලකා බැලීමට අවශ්‍ය විය හැකි අතර කළමනාකාරිත්වය සමඟ තවදුරටත් වන සාකච්ඡාවක් විගණකට කිරීම අවශ්‍ය විය හැකිය. විශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සඳහා කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී බව පෙන්වන හැඟවීමකට උදාහරණයක් විය හැකිවන්නේ, වෙනස් උපකල්පන ගණනාවක් සඳහා යෝග්‍ය පරාසයක් කළමනාකාරිත්වය සංවර්ධනය කළවිට සහ එම සෑම අවස්ථාවකදීම භාවිත කළ උපකල්පනවලින් පරාසයේ අවසානයේ සිට ප්‍රතිඵලය වශයෙන් හටගන්නේ වඩාත්ම වාසිදායක මැනීමේ ප්‍රතිඵලය ය.

ක්‍රම

ක්‍රමය තෝරා ගැනීම (යොමුව ඃ 23 (අ) ඡේදය)

අ97. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ තෝරාගත් ක්‍රමයේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් විගණක සඳහා අදාළ සැළකිල්ලට ගැනීම් සහ අදාළ වන්නේනම්, පූර්ව කාල පරිච්ඡේදයෙන් වෙනස්වීම්වලින් යෝග්‍යතාවයන්ට ඇතුළත් විය හැක්කේ;

- තෝරාගත් ක්‍රමය කළමනාකාරිත්වයේ තාර්කිකය සඳහා යෝග්‍ය ද;
- ගිණුම්කරණ ඇස්තමේන්තුවේ ස්වභාවය, අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය ාමුවේ අවශ්‍යතාවයන් වෙනත් ලබාගත හැකි අගය කිරීමේ සංකල්පයක් ශිල්ප ක්‍රම, නියාමන අවශ්‍යතාවයන් සහ ව්‍යාපාරය, කර්මාන්තය සහ අස්තිත්ත්වය මෙහෙයුම්කරණ පරිසරයේ පවතින තත්ත්වයන් තුළ ක්‍රමය යෝග්‍ය වේද;
- වෙනස්ක්‍රම සැලකිය යුතු අන්දමේ වෙනස් පරාසයක ඇස්තමේන්තු ප්‍රතිඵලයක් වූ බව කළමනාකාරිත්වය නිර්ණය කර ඇති විට මෙම වෙනස්වීම් සඳහා හේතු කළමනාකාරිත්වය විසින් කෙසේ විමර්ශනය කළේද; සහ
- වෙනස පදනම් වූයේ නව තත්ත්වයන් හෝ නව තොරතුරු මත ද, මෙය සිද්ධිය නොවනවිට වෙනස අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ සාධාරණ හෝ අනුකූල නොවේ. අත්තනෝමතික වෙනස් කිරීම් කාලය පුරාවටම, මූල්‍ය ප්‍රකාශ අසංගත වීම ප්‍රතිඵලයක් විය හැකිය. සහ මූල්‍ය ප්‍රකාශ අවප්‍රකාශ වීම හටගැන්වීමට හෝ වියහැකි කළමනාකාරිත්ව පක්ෂග්‍රාහීවීමේ බවට හැඟවීමක් විය හැකිය (අ133-අ136 ඡේද එලෙසම බලන්න).

අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මැනීමේ ක්‍රමය නියම නොකරනවිට හෝ බහුවිධ ක්‍රමවලට ඉඩ දෙනවිට මෙම කරුණු වැදගත් වේ.

සංකීර්ණ ආදර්ශකරණය (යොමුව ඃ 23(ඇ) ඡේදය)

අ98. පහත දෑ වනවිට ආදර්ශයක් සහ සම්බන්ධිත ක්‍රමය බොහෝදුරට සංකීර්ණ විය හැකි ය.

- ආදර්ශය සැලසුම් කිරීම, සහ යෝග්‍ය දත්ත සහ උපකල්පන තෝරා ගැනීම සහ භාවිතය විශේෂඥ කුසලතා හෝ දැනුම අවශ්‍ය වීම ඇතුළුව ක්‍රමය අවබෝධ කරගැනීම සහ ව්‍යවහාර කිරීම;

- දත්ත ලබාගත හැකි බවට හෝ නිරීක්ෂණය කළ හැකි බවට හෝ පිවිසීම මත සීමා කිරීම් ඇති නිසා ආදර්ශය භාවිත කිරීමට අවශ්‍යකරන දත්ත ලබාගැනීමට ඇති අපහසුතාවය;
- දත්තවල අවංකභාවය (එනම්, නිරවද්‍යතාවය, සංගතභාවය හෝ සම්පූර්ණත්වය) පවත්වාගෙන යාමට සහ අගය කිරීමේ බහුවිධ උපලක්ෂණ නිසා උපකල්පන භාවිත කිරීමේ ඒවා අතර බහුවිධ සම්බන්ධතාවයන් හෝ ගණනය කිරීම්වල බහුවිධ පුනඃකරණය පවත්වාගෙන යාම අසීරු වේ.

අ99. කළමනාකාරිත්වය සංකීර්ණ ආදර්ශයක් භාවිතකරණවිට විගණක සැලකිලිමත් වියයුතු කරුණුවලට ඇතුළත් විය හැකි. උදාහරණවලටඃ

- භාවිත කිරීමට පෙර ආදර්ශය වලංගුකරණය කිරීම, ආදර්ශයට වෙනස්කම් කර ඇත්නම්, එය අපේක්ෂා කළ භාවිතයට සුදුසු බව සහතික කිරීම සඳහා වාරානුකූලව සමාලෝචනය කිරීම, අස්තිත්ත්වයේ වලංගුකරණ ක්‍රියාවලියට අයත් විය හැක්කේ;
  - ආදර්ශයේ න්‍යායාත්මක ප්‍රබලතාවය;
  - ආදර්ශයේ ගණිතමය අවංකභාවය;
  - ආදර්ශයේ දත්ත සහ උපකල්පනවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය; සහ
  - ආදර්ශයේ නිමවුම තථ්‍ය ගනුදෙනුවලට සන්සන්දනය කිරීම.
- යෝග්‍ය වෙනස් කිරීම් පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන්හි පැවැත්ම.
- ආදර්ශය භාවිත කිරීමේ දී යෝග්‍ය කුසලතාවය සහ දැනුම කළමනාකාරිත්වය භාවිත කිරීම.

මෙම සැළකිල්ලට ගැනීම් සංකීර්ණ ආදර්ශකරණයන් අවශ්‍ය නොවන ක්‍රමයක් සඳහා ද එලෙසම ප්‍රයෝජනවත් විය හැකි ය.

අ100. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් ඉටුවීමට ආදර්ශයේ නිමවුමට කළමනාකාරිත්වය ගැළපුම් කළ හැකිය. සමහර කර්මාන්තවල මෙම ගැළපුම් උඩතැරි ලෙස හැඳින්වේ. සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු අවස්ථාවක් තුළ දී ආදර්ශයේ නිමැවුමට කරන ගැළපුම් කිසිවක් වේ නම් වෙළඳපොළ තුළ සහභාගිවන්නන් මේ හා සමාන තත්ත්වයන්හි දී භාවිත කළ හැකි උපකල්පන පිළිබිඹු වන්නේදැයි සැළකිල්ලට ගැනීම අදාළ විය හැකි ය.

සැළකිය යුතු අන්දමේ උපකල්පනයන්හි අවංකභාවය සහ ක්‍රමය ව්‍යවහාර කිරීමේ දී භාවිත කළ දත්ත පවත්වාගෙන යාම (යොමුව ඃ 23(ඉ) ඡේදය)

අ101. ක්‍රමයට දත්ත යෙදුමේ දී සහ සැළකිය යුතු අන්දමේ උපකල්පනයන්හි අවංකභාවය පවත්වාගෙන යාම හඳුන්වන්නේ තොරතුරු සකස් කිරීමේ සියලු පියවරවල් පුරාවටම දත්තවල සහ උපකල්පන නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය පවත්වාගෙන යාම ලෙසය. එවැනි අවංකභාවයක් පවත්වාගෙන යාමට අපොහොසත්වීම, දත්ත සහ උපකල්පන සදොස් වීම ප්‍රතිඵලයන්වීම සහ අවප්‍රකාශයන් හටගැන්විය හැකිය. මේ සම්බන්ධයෙන් විගණක සඳහා අදාළ සැළකිල්ලට ගැනීම්වලට ඇතුළත් විය හැක්කේ, කළමනාකාරිත්වය විසින් අදහස්කළ සියලු වෙනස් කිරීම්වලට දත්ත සහ උපකල්පන යටත්වේ ද සහ යෙදවුම, ආචයනය, සමුද්ධරණය කිරීම, සම්ප්‍රේෂණය හෝ සැකසුම වැනි කාර්යයන් තුළදී ඕනෑම අදහස් කර නොතිබුණ වෙනස් කිරීම්වලට යටත් නොවන බව ය.

සැලකිය යුතු අන්දමේ උපකල්පන (යොමුව ඃ 24 වන ඡේදය)

අ102. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ සැලකිය යුතු අන්දමේ උපකල්පනයන්හි යෝග්‍යතාවය සම්බන්ධයෙන් විගණක සඳහා අදාළ සැළකිල්ලට ගැනීම් සහ අදාළ වන්නේ නම් පූර්ව කාල පරිච්ඡේද වලින් වන වෙනස් කිරීම්වල යෝග්‍යතාවයට ඇතුළත්විය හැක්කේ,

- උපකල්පනය තෝරා ගැනීම සඳහා කළමනාකාරිත්වයේ තාර්කිකය;
- පවත්නා තත්ත්වයන් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තුවල ස්වභාවය අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන්, අස්තිත්ත්වය මෙහෙයුම් සිදුකරන ව්‍යාපාරයේ කර්මාන්තයේ සහ පරිසරයේ උපකල්පන යෝග්‍ය ද සහ;
- පූර්ව කාලපරිච්ඡේද වලින් වෙනස්වීමක් උපකල්පනයන් තෝරා ගැනීමේදී එය පදනම් වූයේ නව තත්ත්වයන්ගේ නව තොරතුරු මත ද, එය එසේ නොවනවිට වෙනස් කිරීම සාධාරණ නොවිය හැකි හෝ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූල නොවිය හැකිය. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සිදුකරන අත්තනෝමතික වෙනස් කිරීම් මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශ

හට ගැන්වීමට හෝ කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂග්‍රාහී බවට ඇඟවීමක් විය හැකිය. (අ133 - අ136 ඡේද බලන්න)

අ103. පවත්නා තත්ත්වයන් තුළ රඳාපවතමින් පිවිසුම් මාර්ග ගණනාවක් මගින් එය සාර්ථක කරගත හැකි ගිණුම්කරණ ඇස්තමේන්තුවල විකල්ප උපකල්පන හෝ ප්‍රතිඵල කළමනාකාරිත්වය අගය කළ හැකිය. තනි වියහැකි ප්‍රවේශ මගක් වන්නේ සංවේදීතා විශ්ලේෂණය වේ. මෙය සම්බන්ධ විය හැක්කේ ගිණුම්කරණ ඇස්තමේන්තුවක මූල්‍ය වටිනාකම වෙනස් උපකල්පන සමග වෙනස්වන්නේ කෙසේදැයි නිර්ණය කිරීමටය. සාධාරණ අගයට මනිනු ලබන ගිණුම්කරණ ඇස්තමේන්තුවල පවා වූ වෙනස්වීම් තිබිය හැක්කේ වෙනස් වෙළඳපොළ සහභාගීවන්නන් වෙනස් උපකල්පන භාවිත කරන නිසාය. සංවේදීතා විශ්ලේෂණයක් ප්‍රතිඵල සිදුවීම් ගණනාවක් සංවර්ධනයට මගපෙන්විය හැකි අතර සමහර අවස්ථාවලදී කළමනාකාරිත්වය "සර්ව අසුභවාදී" "සර්ව සුභවාදී" සිදුවීම් පෙළක් ලෙස ඇතුළුව, ප්‍රතිඵලවල පරාසයක් ලෙස නිරූපණය කළ හැකි ය.

අ104. විගණනය ඉටු කිරීම පුරාවටම ලබාගත් දැනුම අස්තිත්ත්වයේ ව්‍යාපාරික කටයුතුවල වෙනත් ක්ෂේත්‍රවල භාවිත කළ උපකල්පනවල අවබෝධයක් ලබාගැනීමට හෝ විගණකගේ දැන ගැනීමට ලක් වේ. එවැනි කරුණුවලට ඇතුළත් විය හැක්කේ, උදාහරණ ලෙස ව්‍යාපාරික විවරණිකාවක, ක්‍රමෝපාය ලේඛණයක උපකල්පන සහ අනාගත මුදල් ප්‍රවාහ වේ. එසේම කාර්යභාරයේ නියුතු හවුල්කරු අස්තිත්ත්වය සඳහා වෙනත් කාර්යභාර ඉටුකර ඇත්නම්, එම වෙනත් කාර්යභාරයන්ගෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශයේ හඳුනාගත් අවදානමට අදාළදැයි ලබාගත් තොරතුරු කාර්යභාරයේ නියුතු හවුල්කරු සැළකිල්ලට ගතයුතු යයි ශ්‍රීලවිප්‍ර 315[49] (සංශෝධිත) මගින් අවශ්‍ය කෙරේ. මෙම තොරතුරු එසේම සැලකිය යුතු අන්දමේ අවදානම් එකිනෙක අතර සහ භාවිත කළ වෙනත් ගිණුම්කරණ ඇස්තමේන්තු තුළ සංගතදැයි යන්න ඇමතීමේ දී සැළකිල්ලට ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

අ105. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන්ගේ සම්බන්ධය තුළ සැලකිය යුතු අන්දමේ උපකල්පනවල යෝග්‍යතාවය රඳා පැවතිය හැක්කේ. නියත ක්‍රියාමාර්ග ඉටු කිරීමේ කළමනාකාරිත්වයේ අභිප්‍රාය සහ හැකියාව මතය. කළමනාකාරිත්වය බොහෝවිට නිශ්චිත වත්කම් හෝ වගකීම් වලට අදාළ සැලසුම් සහ අභිප්‍රායන් ලේඛනගත කරන අතර අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවෙන් කළමනාකාරිත්වය එසේ කිරීම අවශ්‍ය විය හැකිය. කළමනාකාරිත්වයේ අභිප්‍රාය සහ හැකියාව පිළිබඳ එහි ස්වභාවයේ සහ ප්‍රමාණයේ විගණන සාක්ෂි ලබාගැනීම වෘත්තීය විනිශ්චයට අදාළ කරුණකි. අදාළ වනවිට විගණකගේ ක්‍රියාපටිපාටිවලට පහත දෑ ඇතුළත් විය හැකි යː

- එහි සඳහන් අභිප්‍රායන් ඉටු කිරීමේ කළමනාකාරිත්වයේ ඉතිහාසයට සමාලෝචනය අදාළ වනවිට විධිමත් ලෙස අනුමත අයවැය ලේඛණ, වාර්තා හෝ අනුමැතිය දීම ඇතුළුව ලිඛිත සැලසුම් සහ වෙනත් ලේඛණගත කිරීම් පරීක්ෂා කිරීම.
- විශේෂ ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා එහි හේතු පිළිබඳ කළමනාකාරිත්වයේ විමසීම.
- මූල්‍ය ප්‍රකාශ දිනෙන් පසුව සහ විගණකගේ වාර්තාවේ දිනය තෙක් සිදුවන සිදුවීම් සමාලෝචනය.
- කළමනාකාරිත්වයේ ක්‍රියාවන්හි ශක්‍යතාවයට බලපෑ හැකි එහි පවතින බැඳීම් සහ නෛතික නියාමන හෝ ගිවිසුම්ගත සීමාකිරීම් හි හැඟවීම් ඇතුළුව අස්තිත්ත්වයේ ආර්ථික තත්ත්වයන් තුළ විශේෂ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේ අස්තිත්ත්වයේ හැකියාව අගය කිරීම.
- අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ යමක් වේ නම්, අදාළ ලේඛණගත කිරීමේ අවශ්‍යතාවයන් කළමනාකාරිත්වය ඉටු කර ඇත්දැයි සැළකිල්ලට ගැනීම.

නියත මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවක කෙසේ වෙතත් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී කළමනාකාරිත්වයේ අභිප්‍රායන් හෝ සැලසුම් සැළකිල්ලට ගැනීමට ඉඩ නොදේ. මෙය බොහෝවිට අවස්ථාවක් විය හැක්කේ සාධාරන අගය ගිණුම්කරන ඇස්තමේන්තුවලදීය. එයට හේතු වන්නේ ඔවුන්ගේ මැනීමේ අරමුණුවලට අවශ්‍ය වන සැලකිය යුතු උපකල්පන පිළිබිඹු වන්නේ වෙළඳපොළ සහභාගිවන්නන් භාවිත කරන ඒවායිනි.

දත්ත (යොමුව ː 25 (අ) ඡේදය)

අ106. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ ප්‍රයෝජනය සඳහා තෝරාගත් දත්තවල යෝග්‍යතාවය සම්බන්ධයෙන් සහ විගණකගේ සැළකිල්ල සඳහා අදාළ වන සහ අදාළ වන්නේ නම් පූර්ව කාල පරිච්ඡේදයෙන් සිදුවූ වෙනස්වීම්වල යෝග්‍යතාවයට ඇතුළත් විය හැක්කේː

- දත්ත තෝරා ගැනීම සඳහා කළමනාකාරිත්වයේ තාර්කිකය.

49 ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) 8 වන ඡේදය.

- පවත්නා තත්ත්වයන් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තුවල ස්වභාවය අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් අස්තිත්ත්වයේ මෙහෙයුම් සහ කෙරෙන ව්‍යාපාරයේ කර්මාන්තයේ සහ පරිසරයේ දත්ත සමඟ යෝග්‍ය ද; සහ
- පූර්ව කාලපරිච්ඡේද වලින් වන වෙනස් වීමක් මූලාශ්‍රයක් තුළ තෝරාගත් දත්ත අයිතම හෝ තෝරාගත් දත්ත පදනම්ව වන්නේ නව තත්ත්වයන් හෝ නව තොරතුරු මතද, එය එසේ නොවනවිට සාධාරන ලෙස විය නොහැකි හෝ අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව සමඟ අනුකූල නොවේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවක අත්තනෝමතික වෙනස් කිරීම් කාල සීමාව පුරා මූල්‍ය ප්‍රකාශ අසංගතවිය හැකිවීම ප්‍රතිඵලයක් විය හැකි අතර මූල්‍ය ප්‍රකාශ හෝ විය හැකි කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී වීමකට හැඟවීම් ලෙස හට ගැන්විය හැකිය. (යොමුව : අ133 - අ136 ඡේද බලන්න).

දත්තවල අදාළත්වය සහ විශ්වාසදායකත්වය (යොමුව : 25(ඇ) ඡේදය)

අ107. අස්තිත්ත්වය විසින් ඉදිරිපත් කරන තොරතුරු භාවිත කරන විට පවතින තත්ත්වයන් අවශ්‍යවන පරිදි තොරතුරු වල නිවැරදිභාවය සහ සම්පූර්ණතාවය පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීමට සහ විගණකගේ අරමුණු සඳහා[50] තොරතුරු ප්‍රමාණවත් ලෙස නිරවද්‍ය සහ විස්තරාත්මක දැයි අගය කිරීම ඇතුළුව, විගණකගේ අරමුණු සඳහා තොරතුරු ප්‍රමාණවත් ලෙස විශ්වාසදායක දැයි විගණකට අගය කිරීම ශ්‍රීලවිප්‍ර 500 න් අවශ්‍ය කෙරේ.

සංකීර්ණ නෛතික හෝ ගිවිසුම්ගත තොරතුරු (යොමුව : 25 (ඈ) ඡේදය)

අ108. ගිණුම්කරණ ඇස්තමේන්තු සංකීර්ණ නෛතික හෝ ගිවිසුම්ගත කොන්දේසි මත පදනම් වනවිට විගණක සැළකිල්ලට ගත යුතු ක්‍රියාපටිපාටිවලට ඇතුළත් විය හැක්කේ:

- ගිවිසුම අවබෝධ කරගැනීමට හෝ අර්ථ දැක්වීමට විශේෂඥ කුසලතාවයන් හෝ දැනුම අවශ්‍ය වේදැයි සැළකිල්ලට ගැනීම:
- නෛතික හෝ ගිවිසුම්ගත කොන්දේසි සම්බන්ධයෙන් අස්තිත්වයේ නීති උපදේශකගෙන් විමසීම් කිරීම්
- පාදකවන දෑ ගිවිසුමට පරීක්ෂා කිරීම:
  - ගනුදෙනු හෝ එකගවීම් සඳහා පාදක වන ව්‍යාපාරික අරමුණ අගය කිරීම
  - ගිවිසුමේ කොන්දේසි කළමනාකාරිත්වයේ පැහැදිලි කිරීම් සමඟ සංගත දැයි සැළකිල්ලට ගැනීම

ඇස්තමේන්තු කිරීමේ අනියතතා පිළිබඳව කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරාගැනීම සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්

ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අවබෝධ කරගැනීම සහ ඇමතීමට කළමනාකාරිත්වයේ පියවර (යොමුව : 26 (අ) ඡේදය)

අ109. කළමනාකාරිත්වය ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය, අවබෝධ කර ගැනීමට සහ ඇමතීමට යෝග්‍ය පියවර ගෙන ඇත්ද යන්න සම්බන්ධයෙන් අදාළ සැළකිල්ලට ගැනීම් වලට ඇතුළත් විය හැක්කේ කළමනාකාරිත්වයේ:

(අ) මැනීමේ ප්‍රතිඵල තුළ සහ එහි ප්‍රතිඵලයක් වන වියහැකි මැනීමේ ප්‍රතිඵලයන්හි පරාසයේ සාධාරණ ලෙස වියහැකි ආවේණික විචල්‍යතාවයේ ප්‍රමාණය තක්සේරු කිරීමෙන් සහ මූලාශ්‍ර හඳුනා ගැනීම මගින් ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අවබෝධ කර ගැනීම.

(ආ) ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානමට බලපාන, සංකීර්ණතාවය, හෝ පුද්ගලගතභාවය මැනීමේ ක්‍රියාවලිය තුළ කුමන ප්‍රමාණයකටදැයි හඳුනාගැනීම සහ අවප්‍රකාශයකට වියහැකි ප්‍රතිඵලය පහත දෑ ව්‍යවහාර කිරීම මගින් ඇමතීම:

(i) ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී යෝග්‍ය කුසලතාවය සහ දැනුම; සහ

(ii) කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී බවට නැඹුරු වීම හඳුනා ගැනීම සහ ඇමතීම මගින් ඇතුළු වෘත්තීය විනිශ්චය; සහ

(ඇ) යෝග්‍ය පරිදි කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව සහ එය විස්තර කෙරෙන ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය සහ සම්බන්ධ හෙළිදරව් කිරීම් මගින් ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය ඇමතීම.

50. ශ්‍රීලවිප්‍ර 500, 9 වන ඡේදය.

කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ සම්බන්ධිත හෙළිදරව් කිරීම් (යොමුව ඃ 26 (ආ) ඡේදය)

අ110. කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම සම්බන්ධයෙන් අදාළ විය හැකි කරුණු සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳ සම්බන්ධිත හෙළිදරව් කිරීම සංවර්ධනය කිරීමේදී ඇතුළත් වන්නේඃ

- ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීම සඳහා විකල්ප ක්‍රම සහ විකල්ප මූලාශ්‍රවල දත්ත ලබාගත හැකිවිට ඇතුළුව ක්‍රම සහ භාවිත කළ දත්ත යෝග්‍ය පරිදි තෝරාගෙන ඇත්තේද.
- භාවිත කළ අගය කිරීමේ උපලක්ෂණ යෝග්‍ය ද සහ සම්පූර්ණ ද.
- භාවිත කළ උපකල්පන තෝරාගෙන ඇත්තේ සාධාරණ ලෙස විය හැකි වටිනාකම් සහ එය අදාළ විශ්වාසදායක යෝග්‍ය දත්ත මගින් සහාය වී ඇත්ද.
- භාවිත කළ දත්ත යෝග්‍ය අදාළ සහ විශ්වාසදායක සහ දත්තවල අවංකභාවය පවත්වාගෙන යන ලද්දේ ද.
- ක්‍රමය සමඟ අනුකූලව ගණනය කිරීමේ ව්‍යහාර කර ඇති අතර ගණිතමය වශයෙන් නිවැරදි ද.
- කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව යෝග්‍ය ලෙස තෝරාගෙන ඇත්තේ සාධාරණව වියහැකි මැනීමේ ප්‍රතිඵල වලින්ද.
- සාධාරණ ලෙස වියහැකි මැනීමේ ප්‍රතිඵල වල විචල්‍යතාවය ඇතුළුව, සම්බන්ධිත හෙළිදරව් කිරීමේ යෝග්‍ය පරිදි වටිනාකම් ඇස්තමේන්තු ලෙස විස්තර කරයි සහ ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියේ ස්වභාවය සහ සීමා කිරීම් පැහැදිලි කරයි ද.

අ111. කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් විගණකගේ සැළකිල්ලට ගැනීමට අදාළ දෑට ඇතුළත් විය හැක්කේ;

- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් කළමනාකාරිත්වය අනුගමනය කළේ වුවද අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව නියම කරනවිට විකල්ප ප්‍රතිඵල සහ උපකල්පන සැළකිල්ලට ගැනීමෙන් සහ එය භාවිත කළ යුතු හෝ නිශ්චිත මැනීමේ ක්‍රමයන් නියම කරයි.
- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් සැළකිල්ලට ගැනීමෙන් පසුව කළමනාකාරිත්වය විනිශ්චයක් භාවිත කළේ ද නැද්ද සාධාරණ ලෙස විය හැකි මැනීමේ ප්‍රතිඵල වලින් වටිනාකමක් තෝරා ගන්නේ කෙසේදැයි අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව නිශ්චය නොකර ඇති විට.

අ112. ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳ කළමනාකාරිත්වයේ හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් විගණකගේ සැළකිල්ලට ගැනීම් වලට, පහත සඳහන් හෙළිදරව් කිරීම් අවශ්‍ය විය හැකි අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් ඇතුළත් වේ.

- සාධාරණ ලෙස විය හැකි මැනීමේ ප්‍රතිඵල වල විචල්‍යතාවය ඇතුළත්ව එය කිරීමට ක්‍රියාවලිය සඳහා ස්වභාවය සහ සීමා කිරීම් පැහැදිලි කිරීමෙන් සහ ඇස්තමේන්තුවක් ලෙස එය විස්තරකරන වටිනාකම. එසේම ආකෘතිමය රාමුව හෙළිදරව් කිරීමේ අරමුණක් ඉටු කිරීමට අතිරේක හෙළිදරව් කිරීමක් අවශ්‍ය විය හැකිය.[51]
- ගිණුම්කරණ ඇස්තමේන්තුවල සම්බන්ධිත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී සහ ගිණුම්කරණ ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේදී ව්‍යවහාර කළ නිශ්චිත මූලධර්ම, පදනම්, සම්මුති, රීති සහ පරිචයන් වැනි කරුණු පවත්නා තත්ත්වයන් සහ අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් කෙරේ.
- සැලකිය යුතු අන්දමේ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳව (උදාහරණ ලෙස මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත් වඩාත් සැලකිය යුතු අන්දමේ බලපෑම් ඇති වටිනාකම්) එමෙන්ම සැලකිය යුතු දෑ ඉදිරි දැක්මේ උපකල්පන හෝ වෙනත් ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයන් හි මූලාශ්‍ර.

නියත තත්ත්වයන්හිදී, සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගැනීමට හැකිවීම පිණිස අවශ්‍යකරන මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමු මගින් පැහැදිලිව අවශ්‍ය කෙරෙන දෑට වැඩි හෝ අනුකූලතා ආකෘතිමය රාමුවක් සඳහාවන මූල්‍ය ප්‍රකාශවල නොමග නොයවන සුළු නොවීමට අතිරේක හෙළිදරව් කිරීම් කළ යුතුය.

---

51 ශ්‍රීලවිප්‍ර 13, *සාධාරණ අගය මැනීම*, 92 වන ඡේදය.

අ113. 35 වන ඡේදය සමග අනුකූලව අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳ කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව සාධාරණ වුවත්, හෝ අවප්‍රකාශ වුවත් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට යටත්වන ප්‍රමාණය විශාල වනවිට තක්සේරු කරනු ලබන ප්‍රමාණාත්මක අවප්‍රකාශයේ අවදානම ඉහළ විය හැකිය. එබැවින් නිර්ණය කිරීමට වඩාත් ඒත්තුගන්වන සුළු විගණන සාක්ෂි අවශ්‍ය වේ.

අ114. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සමග ආශ්‍රිතව ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ විගණකගේ සැළකිල්ලට ගැනීම සහ එහි සම්බන්ධිත හෙළිදරව් කිරීම, විගණකගේ සැලකිය යුතු අවධානය යොමුවිය යුතු කරුණක් නම්, එවිට මෙය ප්‍රධාන විගණන කරුණක් ස්ථාපිත විය හැකිය.[52]

ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක් අවබෝධ කරගැනීමට සහ ඇමතීමට කළමනාකාරිත්වයට යෝග්‍ය පියවර නොගැනීම (යොමුව : 27 වන ඡේදය)

අ115. ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අවබෝධ කරගැනීමට හෝ ඇමතීමට කළමනාකාරිත්වය පියවර නොගෙන ඇතිබව විගණක නිර්ණය කළවිට, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අවබෝධ කර ගැනීමට විගණක කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටිය හැකි ඉටු කළ යුතු අතිරේක ක්‍රියාපටිපාටිවලට ඇතුළත්විය හැක්කේ උදාහරණ ලෙස, විකල්ප උපකල්පන සැළකිල්ලට ගැනිම හෝ සංවේදීතා විශ්ලේෂණයක් ඉටු කිරීම වේ.

අ116. කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවක් හෝ පරාසයක් සංවර්ධනය කිරීම ප්‍රායෝගිකදැයි සැළකිල්ලට ගැනීමේදී විගණක සැළකිල්ලට ගතයුතු කරුණු වන්නේ ස්වාධීනත්වයේ අවශ්‍යතාවයන් පිළිබඳව එකඟතාවයකට නොඑළඹී විගණකට එසේ කළ හැකිද යන්නය, මෙයට ඇතුළත් විය හැක්කේ, කළමනාකාරිත්වයේ වගකීම් භාර ගැනීම මත තහනම් කිරීම් අමතන අදාළ ආචාරධර්ම අවශ්‍යතාවයන්ය.

අ117. කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සැළකිල්ලට ගැනීමෙන් පසු විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය සංවර්ධනය කිරීම ප්‍රායෝගික නොවන්නේ යයි විගණක නිර්ණය කරනවිට 34 වන ඡේදය සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ මත විගණනයේ හෝ විගණකගේ මතය සඳහා හඟවන දෑ විගණක අගය කිරීම අවශ්‍ය වේ.

*විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවක් සංවර්ධනය කිරීම හෝ විගණකගේ පරාසය භාවිත කිරීම* (යොමුව : 28-29 ඡේද)

අ118. කළමනාකාරිත්වයේ කරුණ හැඟවීම් ඇස්තමේන්තුව අගය කිරීමට විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය සංවර්ධනය කිරීම සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳ සම්බන්ධිත හෙළිදරව් කිරීම් පහත දෑ වනවිට යෝග්‍ය පිවිසුම් මගක් විය හැකිය. උදාහරණ ලෙසඃ

- පූර්ව කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශවල සිදුකළ මේ හා සමාන ගිණුම්කරණ ඇස්තමේන්තු වල විගණකගේ සමාලෝචනය, කළමනාකාරිත්වයේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ ක්‍රියාමාර්ගය සඵලදායක නොවන බව අපේක්ෂා කිරීම ඉඟි කෙරෙන බව.
- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා අස්තිත්ත්වයේ පාලන අස්තිත්ත්වය තුළ සහ කළමනාකාරිත්වයේ ක්‍රියාමාර්ග හරහා නිසි අයුරින් සැලසුම් නොකෙරේ හෝ මනාලෙස ක්‍රියාත්මක නොවීම.
- කළමනාකාරිත්වයට එසේ කිරීම යෝග්‍ය වනවිට, විගණකගේ වාර්තාවේ දිනයේ සහ කාලපරිච්ඡේදය අවසන අතර සිද්ධීන් හෝ ගනුදෙනු නිසි අයුරින් ගිණුම්වලට ගෙන නොතිබීම සහ එවැනි සිද්ධීන් හෝ ගනුදෙනු කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්මේන්තුව සමග පරස්පර වන බව පෙනීම.
- විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය සංවර්ධනය කිරීමේදී භාවිත කළ හැකි අදාළ දත්ත යෝග්‍ය විකල්ප උපකල්පන හෝ මූලාශ්‍ර තිබීම.
- ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය අවබෝධ කර ගැනීමට හෝ ඇමතිමට යෝග්‍ය පියවර කළමනාකාරිත්වය ගෙන නැත. (27 වන ඡේදය බලන්න).

අ119. කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවක් හෝ පරාසයක් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් එලෙසම බලපෑම් කළ හැකිය. එය විකල්ප ප්‍රතිඵල හෝ උපකල්පන සැළකිල්ලට ගැනීමෙන් පසු භාවිත කළ හැකි කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව නියම කළ හැකි හෝ නිශ්චිත මැනීමේ ක්‍රමයක් නියම කළ හැකිය. (උදාහරණ ලෙස, වට්ටම් කළ සම්භාව්‍යතා - භරිත අපේක්ෂිත අගය හෝ වඩාත් වියහැකි ප්‍රතිඵලය)

[52] ශ්‍රීලවිප්‍ර 701, *ස්වාධීන විගණකගේ වාර්තාව තුළ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය*

අ120. පරාසයක් වෙනුවට, කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවක් සංවර්ධනය කළ යුතු ද යන විගණකගේ තීරණය රඳා පවත්නේ පවත්නා තත්ත්වයන් තුළ ඇස්තමේන්තුවේ ස්වභාවය හෝ විගණකගේ විනිශ්චය මත රඳා පවතමිනි. උදාහරණ ලෙස ඇස්තමේන්තුවක ස්වභාවය කොපමණද යන්න සාධාරණ ලෙස විය හැකි ප්‍රතිඵල වන විචල්‍යතාවය අඩුවිය හැකි බවට අපේක්ෂාවක් ඇත. මෙවැනි තත්ත්වයන් තුළදී විශේෂයෙන් ම ඉහළ මට්ටමේ නිරවද්‍යතාවයක් සහිතව එය සංවර්ධනය කළ හැකිවන විට, කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවක් සංවර්ධනය කිරීම සඵලදායක පිවිසුම් මගකි.

අ121. විගණක කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය ක්‍රම ගණනාවකින් සංවර්ධනය කළ හැකිය. උදාහරණ වශයෙන් පහත ක්‍රම මගින්ඃ

- කළමනාකාරිත්වය විසින් භාවිත කළ ආදර්ශයට වඩා වෙනස් ආදර්ශයක් භාවිත කිරීම මගිනි. උදාහරණ ලෙස විශේෂ අංශයක් තුළ හෝ කර්මාන්තයක වාණිජමය වශයෙන් ලබාගත හැකි හෝ හිමිකම් ඇති හෝ විගණක සංවර්ධනය කළ ආදර්ශයක්.
- කළමනාකාරිත්වය විසින් භාවිත කරන ආදර්ශය එහෙත් කළමනාකාරිත්වය විසින් භාවිත කළ දත්ත මූලාශ්‍රවලට හෝ විකල්ප උපකල්පන සංවර්ධනය කිරීමෙන්.
- විගණකගේ ස්වකීය ආදර්ශය භාවිත කරමින් එහෙත් කළමනාකාරිත්වය විසින් භාවිත කරන උපකල්පන වලට විකල්ප සංවර්ධනය කිරීම මගින්.
- ආදර්ශයක් සංවර්ධනය කිරීම හෝ ක්‍රියාවේ යෙදවීමට හෝ අදාළ උපකල්පන ලබාදීමට විශේෂඥ නිපුණතාවය ඇති පුද්ගලයෙක් බඳවා ගැනීම හෝ සේවයේ නියුතු කිරීම.
- සන්සන්දනය කළ හැකි වත්කම් හෝ වගකීම් සඳහා ගනුදෙනු හෝ සිද්ධීන් හෝ අදාළවන අවස්ථාවලදී වෙළඳපළවල වෙනත් සන්සන්දනය කිරීමේ තත්ත්වයන් සැළකිල්ලට ගැනීම.

අ122. විගණක එලෙසම කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය ගිණුම්කරණ ඇස්තමේන්තුවේ කොටසක් සඳහා පමණක් සංවර්ධනය කළ හැකිය. (උදාහරණ ලෙස; විශේෂ උපකල්පනයකට හෝ ගිණුම්කරණ ඇස්තමේන්තුවේ නියත කොටසකට පමණක් ප්‍රමාණාත්මක අවප්‍රකාශයේ අවදානම් හටගන්වන විට).

අ123. කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය සංවර්ධනය කිරීමට විගණකගේ ස්වකීය, ක්‍රම උපකල්පන හෝ දත්ත භාවිත කරනවිට, කළමනාකාරිත්වයේ, ක්‍රම උපකල්පන හෝ දත්තයන්හි යෝග්‍යතාවය පිළිබඳ විගණක සාක්ෂි ලබාගත හැකිය. උදාහරණ ලෙස කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවේ සාධාරණත්වය ඇගයීමට පරාසයක් සංවර්ධනය කිරීමේදී විගණක විගණකගේ ස්වකීය දත්ත භාවිත කරන්නේ නම්, ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී සැලකිය යුතු අන්දමේ උපකල්පන තෝරා ගැනීමේ කළමනාකාරිත්වයේ විනිශ්චයන් විය හැකි කළමනාකාරිත්ව පක්ෂග්‍රාහී වීමකට හැඟවීමක් දීම හට ගැන්වීමට හේතු වන්නේද යන්න පිළිබඳ විගණක එලෙසම මතයක් ඇති කර ගැනීම සංවර්ධනය කළ යුතුයඃ

අ124. 29(අ) ඡේදය තුළ විගණකට එම පරාසයේ ඇතුළත් විය යුත්තේ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂිවලට සහාය වන වටිනාකම් පමණක් යන අවශ්‍යතාවයේ නිර්ණය කිරීමට එම පරාසය තුළ වියහැකි සෑම ප්‍රතිඵලයක් තනිතනිව සහාය වන විගණන සාක්ෂියක් විගණක ලබාගැනීම අපේක්ෂා කරන බව මෙයින් අදහස් නොවේ. ඒ වෙනුවට පරාසයේ දෙකෙළවරේම වන කරුණු පවත්නා තත්ත්වයන් තුළ සාධාරණ යයි නිර්ණය කිරීමට සාක්ෂි විගණක ලබාගත හැකිය. ඒ අනුව එම කරුණු දෙක අතර වටිනාකම් පිහිටුවීමට සහාය වීමද සාධාරණ වේ.

අ125. මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස, විශේෂයෙන්ම ප්‍රමාණාත්මකභාවය රඳා පවත්නේ මෙහෙයුම් ප්‍රතිඵල මත වනවිට (උදාහරණ ලෙස බදු පෙර ආදායම) විගණකගේ පරාසයේ ප්‍රමාණය වියහැක්කේ ප්‍රමාණාත්මකභාවයේ ගුණිතයන්ගෙන්ය සහ මෙය වත්කම් හෝ වෙනත් ශේෂ පත්‍ර මිනුම්වල සම්බන්ධයෙන් සාපේක්ෂව කුඩා වේ. මෙම තත්ත්වය බොහෝවිට පැනනැගිය හැක්කේ, සමහර තත්ත්වයන්හිදී, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සමග ආශ්‍රිතවනවිට එය එමගින්ම ප්‍රමාණාත්මකභාවය ගුණිතයක් වේ. රක්ෂණ. හෝ බැංකු වැනි ඉහළ මට්ටමේ අනියතතාව වඩාත් දර්ශීය වන බැවින් නියත වර්ගවල ගිණුම්කරණ ඇස්තමේන්තුවල හෝ නියත කර්මාන්තවල වඩා සුලබවන අතර ඒ සම්බන්ධයෙන් අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ විශේෂ අවශ්‍යතාවයන් තිබිය හැකිය. මෙම ශ්‍රීලවිප්‍රයේ අවශ්‍යතාවයන් සමග අනුකූලව ඉටු කළ ක්‍රියාපටිපාටි සහ ලබාගත් විගණන සාක්ෂි පදනම මත ප්‍රමාණාත්මකභාවයේ ගුණකයක් වන පරාසය පවත්නා තත්ත්වයන් තුළ යෝග්‍ය බව විගණකගේ විනිශ්චය අනුව විගණක නිගමනය කළ හැකිය. මෙය අවස්ථාව වනවිට ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳ හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය විගණකගේ ඇගයීම විශාල ලෙස වැදගත්වන

අතර විශේෂයෙන්ම ඉහළ මට්ටමක ඇස්තමේන්තු කිරීමේ අවදානමක් සහ වියහැකි ප්‍රතිඵලයේ එම හෙළිදරව් කිරීම් යෝගය පරිදි පරාසය දන්වයි. මෙම තත්ත්වයන්ට අදාළ වියහැකි අතිරේක සැළකිල්ලට ගැනීම් අ139-අ144 ඡේදවල ඇතුළත්ය.

*විගණක සාක්ෂිවලට සම්බන්ධිත වෙනත් සැළකිල්ලට ගැනීම්* (යොමුව ඃ 30 වන ඡේදය).

අ126. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් සම්බන්ධයෙන් විගණන සාක්ෂි ලෙස භාවිත කළ යුතු තොරතුරු, අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ විය හැකි කළමනාකාරිත්වයේ විශේෂඥයාගේ වැඩ ප්‍රයෝජනයට ගනිමින් හෝ වෙනත් බාහිර තොරතුරු මූලාශ්‍රයක් ලබාදුන්නා විය හැකිය. තොරතුරු මත පිළියෙළ කළා විය හැකිය.

බාහිර තොරතුරු මූලාශ්‍ර

අ127. ශ්‍රීලවිප්‍ර 500[53] තුළ විස්තර කර ඇති පරිදි බාහිර තොරතුරු මූලාශ්‍රයකින් වන තොරතුරුවල විශ්වාසදායකත්වයට එහි මූලාශ්‍රය එහි ස්වභාවය සහ එය ලබාගත්තේ කුමන තත්ත්වයන් යටතේද යන්න මගින් බලපෑම් කළ හැකිය. ඒ නිසාවෙන්, ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී භාවිත කළ තොරතුරුවල විශ්වාසදායකත්වය සැළකිල්ලට ගැනීමට විගණකගේ තවදුරටත් වන විගණන පාටිපාටිවල ස්වභාවය සහ ප්‍රමාණය මෙම සාධකවල ස්වභාවය අනුව වෙනස් විය හැකිය. උදාහරණ ලෙසඃ

- වෙළඳපොළ හෝ කර්මාන්තයේ දත්ත, මිල ගණන් හෝ මිල ගණන් හා සම්බන්ධිත දත්ත, එවැනි තොරතුරු පිළිබඳ වෙසෙසියාවක් ඇති කරගත් තනි බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් විට, ඒ සමග සන්සන්දනය කිරීමට විකල්ප ස්වාධීන මූලාශ්‍රයකින් විගණක මිළ ගණන් සොයා බැලිය හැකිය.
- වෙළඳපොළ හෝ කර්මාන්ත දත්ත හෝ මිල ගණන් සම්බන්ධිත දත්ත, බහු ආංගික ස්වාධීන තොරතුරු මූලාශ්‍රවලින් ලබාගත්විට, එම මූලාශ්‍ර හරහා පොදු එකඟතාවයකට යොමුකරන තනි මූලාශ්‍රයකින් වන දත්තයන්හි විශ්වාසදායකත්වය පිළිබඳ සාක්ෂි විගණකට අඩුවෙන් ලබාගැනීම අවශ්‍ය විය හැකිය.
- බහු ආංගික තොරතුරු මූලාශ්‍රවලින් තොරතුරු ලබාගත්විට ප්‍රතිවිරුද්ධ වෙළඳපොළ අදහස්වලට යොමුකරන අසමානාත්මක අදහස් සඳහා හේතු අවබෝධ කර ගැනීම විගණක සොයා බැලිය යුතුය. මෙම අසමානත්වයට ප්‍රතිඵලයක් විය හැක්කේ වෙනස් ක්‍රම, උපකල්පන සහ දත්ත භාවිත කිරීම නිසාය. උදාහරණ ලෙස එක මූලාශ්‍රයක් ප්‍රවර්තන මිල ගණන් භාවිත කළ හැකි අතර වෙනත් මූලාශ්‍රයන් අනාගත මිල ගණන් භාවිත කළ හැකිය. අසමානකම් ඇස්තමේන්තු කිරීමේ අනියතතාවලට සම්බන්ධ වනවිට; අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර ඇති ඇස්තමේන්තු කිරීමේ අනියතතා ලෙස විස්තර කර ඇති විස්තරය සාධාරණ ද යන්න පිළිබඳව 26(ආ) ඡේදය මගින් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගැනීම අවශ්‍ය කෙරේ. එවැනි අවස්ථාවලදී ක්‍රම, උපකල්පන සහ ව්‍යවහාර කළ දත්ත පිළිබඳ තොරතුරු සැළකිල්ලට ගැනීමේදී වෘත්තීය විනිශ්චය ද එසේම වැදගත් වේ.
- ඔවුන්ගේම ස්වකීය ආදර්ශය භාවිත කරමින් එම මූලාශ්‍රය බාහිර තොරතුරු මූලාශ්‍රයක් මගින් සංවර්ධනය කළ තොරතුරු ලබාගත් විට ශ්‍රීලවිප්‍ර 500 අ34 ඉ ඡේදය අදාළ මගපෙන්වීම් පෙන්වයි.

අ128. සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරුවල අදාළත්වය සහ විශ්වාසදායකත්වය පිළිබඳ අතිරේක සැළකිල්ලට ගතයුතු දෑවලට ඇතුළත්විය හැක්කේඃ

(අ) සාධාරණ අගයන් පදනම් වූයේ වෙළඳ හෝ සමාන සාධන පත්‍ර මත හෝ සක්‍රිය වෙළඳපොළක මිල ගණන් අනුවද;

(ආ) සාධාරණ අගයන් සන්සන්දනය කළ හැකි වත්කම් හෝ වගකීම්වල ගණුදෙනු මත පදනම් වනවිට, එම ගණුදෙනු හඳුනා ගන්නේ සහ සන්සන්දනය කළ හැකි බව සැළකිල්ලට ගන්නේ කෙසේද,

(ඇ) එක්කෝ වත්කම් හෝ වගකීම් හෝ සන්සන්දනය කළ හැකි වත්කම් හෝ වගකීම්වලට ගණුදෙනු නොමැතිවිට සංවර්ධනය කර අදාළ වත්කම් වෙළඳපොළ සහභාගීවන්නන් වත්කම් හෝ වගකීම් මිල කිරීමට භාවිත කරන උපකල්පනය නියෝජනය කරන යෙදවුම් ඇතුළුව තොරතුරු සංවර්ධනය කළේ කෙසේද; සහ

(ඈ) තැරැව්කරු මිල කියුම් මත පදනම්ව සාධාරණ අගය මැනීම පදනම් වනවිට, තැරැව්කරු මිල ප්‍රකාශ කළේද;

[53] ශ්‍රීලවිප්‍ර 500, අ31 ඡේදය

(i) එකම වර්ගයේ මූල්‍ය සාධන පත්‍රවල ගණුදෙනුකරන වෙළඳපොළ ඇතිකරන්නෙක් ගෙන්ද;

(ii) එය බැඳුන හෝ නොබැඳුන වඩා බර තැබීමක් බැඳුන අර්පන පදනම මත තැබූ මිල ගණන් ද; සහ

(iii) අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය කරන විට, මූල්‍ය වාර්තාකරන දින ලෙස වෙළඳපොළ තත්ත්වයන් පිළිබිඹු වන්නේ ද.

අ129. විගණන සාක්ෂි ලෙස බාහිර තොරතුරු මූලාශ්‍රයකින් වන තොරතුරු භාවිත කළවිට විගණක සඳහා අදාළ සැළකිල්ලට ගැනීම විය හැක්කේ, තොරතුරු ලබාගත හැකිද හෝ බාහිර තොරතුරු මූලාශ්‍රයේ භාවිත කළ ක්‍රම උපකල්පන සහ වෙනත් තොරතුරු අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් ලෙස විස්තරයක් මත ද යන්න වේ. සමහර ආකාරයකට මෙය සීමිත වියහැකි අතර, ආනුෂංගික වශයෙන් ඉටුකළ යුතු ක්‍රියාපටිපාටිවල ස්වභාවය කාලනිර්ණය සහ ප්‍රමාණය විගණකගේ සැළකිල්ලට ගැනීමට බලපෑම් කළ හැකිය. උදාහරණ ලෙස සේවා මිල කිරීමේදී එක් එක් සුරැකුම්පත්වල ඒවායේ ක්‍රම සහ උපකල්පන පිළිබඳ තොරතුරු ලබා දෙනවා වෙනුවට ලබාදෙන්නේ වත්කම් පන්තිය මගිනි. තැරැව්කරුවන් එක් එක් සුරැකුම්පත් සඳහා අපේක්ෂා කරන මිල ගණන් ලබාදෙන විට ඒවායේ යෙදවුම් සහ උපකල්පන පිළිබඳ බොහෝවිට ලබාදෙන්නේ සීමිත තොරතුරු පමණක්ය. බාහිර තොරතුරු මූලාශ්‍ර මගින් සහායවන තොරතුරුවල විස්තර ලබාදීමේදී තබන සීමා කිරීම් සම්බන්ධයෙන් මග පෙන්වීම් ශ්‍රීලවිප්‍ර 500 අ34ඊ ඡේදයේ ලබාදෙයි.

කළමනාකාරිත්වයේ විශේෂඥයා

අ130. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධ උපකල්පන කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් විසින් සිදුකළ විට හෝ හඳුනා ගත්විට ඒවා ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමට කළමනාකාරිත්වය විසින් යොදාගත්විට එම උපකල්පන කළමනාකාරිත්වයේ උපකල්පන බවට පත් වේ. ඒ අනුව එම උපකල්පනවලට මෙම ශ්‍රීලවිප්‍රයේ අදාළ අවශ්‍යතාවයේ විගණක ව්‍යවහාර කරයි.

අ131. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත ක්‍රම හෝ දත්ත මූලාශ්‍ර භාවිත කිරීම හෝ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කිරීම සඳහා සම්බන්ධිත හෙළිදරව් කිරීම් හෝ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව සම්බන්ධිත සංවර්ධනය කිරීම සොයා ගැනීම් ලබාදීම හෝ නිගමන ලබාදීම සඳහා කළමනාකාරිත්වය විශේෂඥයාගේ වැඩ සම්බන්ධ කරගන්නා විට, මෙම ශ්‍රීලවිප්‍රයේ 21-29 ඡේදවල අවශ්‍යතාවයන්, විගණකට ශ්‍රීලවිප්‍ර 500 8(ඇ) ඡේදය ව්‍යවහාර කිරීමේදි උපකාරී විය හැකිය.

සේවා ආයතන

අ132. සේවා ආයතනයක් ලබාදෙන සේවාවන්හි හා අභ්‍යන්තර පාලන මෙන්ම, තක්සේරු කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශවලට විගණකගේ ප්‍රතිචාර ඇතුළුව විගණකගේ අවබෝධය පිළිබඳව ශ්‍රීලවිප්‍ර 402[54] කටයුතු කෙරේ. අස්තිත්ත්වයක් ගිණුම්කරණ ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා සේවා ආයතනයක සේවාව අස්තිත්ත්වය භාවිත කරනවිට ශ්‍රීලවිප්‍ර 402 හි අවශ්‍යතාවයන් සහ මගපෙන්වීම් එබැවින් මෙම ශ්‍රීලවිප්‍රයේ අවශ්‍යතාවයන්ට ව්‍යවහාර කිරීමේදී විගණකට උපකාරී විය හැකිය.

**කළමනාකාරිත්වයේ විය හැකි පක්ෂග්‍රාහීවීම් සඳහා හැඟවීම්** (යොමුව : 32 වන ඡේදය)

අ133. කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී වීම් ගිණුමක මට්ටමෙන් අනාවරණය කර ගැනීම අපහසුවිය හැකිය සහ ඒවා විගණකට පමණක් හඳුනාගත හැක්කේ ගිණුම්කරණ ඇස්තමේන්තු සමූහයක් සම්භාරයක් ලෙස සියලුම ගිණුම්කරණ ඇස්තමේන්තු හෝ ගිණුම්කරණ කාලපරිච්ඡේද ගණනාවක් පුරාවටම නිරීක්ෂණය කිරීම් සැළකිල්ලට ගන්නා විටය. උදාහරණ ලෙස මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් කර ඇති ගිණුම්කරණ ඇස්තමේන්තු තනි තනිව සැළකිල්ලට ගැනීම සාධාරණ වන්නේ නම්, එහෙත් කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවේ සංගතව කළමනාකාරිත්වයට වඩා වාසිදායක බවක් ගෙන දෙන මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙන සාධාරණ ප්‍රතිඵලය විගණකගේ පරස්පර එක අන්තයක් දෙසට කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව නිරතුරුවම නැඹුරු වනවිට එවැනි තත්ත්වයක් කළමනාකාරිත්වය විය හැකි පක්ෂග්‍රාහීවීම් ඉඟි කළ හැකිය.

අ134. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් පිළිබඳව කළමනාකාරිත්වයේ සිදුවිය හැකි පක්ෂග්‍රාහීවීම් පිළිබඳ හැඟවීම උදාහරණවලට ඇතුළත්:

- පවත්නා තත්ත්වයන්හි වෙනසක් ඇතිවිට කළමනාකාරිත්වය පුද්ගලගත තක්සේරුවක් කළවිට, ගිණුම්කරණ ඇස්තමේන්තුවක් තුළ හෝ එය සිදුකළ ක්‍රමය වෙනස්වීම්.

[54] ශ්‍රීලවිප්‍ර 402, සේවා ආයතනයක් භාවිත කරන අස්තිත්ත්වයට සම්බන්ධිත විගණන සැළකිල්ලට ගැනීම

- කළමනාකාරිත්වයේ අරමුණුවලට වාසිදායක ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන ආකාරයට කරුණ හැඟවීම් ඇස්තමේන්තුවේ සැළකිය යුතු උපකල්පන හෝ දත්ත තෝරා ගැනීම හෝ සංවර්ධනය කිරීම.
- සර්ව සුබවාදී හෝ සර්ව අසුබවාදී රටාවක් ඇඟවිය හැකි කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම.

එවැනි සූචක හඳුනාගත්විට එක්කෝ සැදහුම් මට්ටමේදී හෝ මූල්‍ය ප්‍රකාශ මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් තිබිය හැකිය. තනි තනි ගිණුම්කරණ ඇස්තමේන්තුවක සාධාරණත්වය මත නිගමන ලබාගැනීමේ අරමුණු සඳහා කළමනාකාරිත්වයේ විය හැකි පක්ෂග්‍රාහීවීම් මගින්ම අවප්‍රකාශ ස්ථාපනය නොවේ. කෙසේ වෙතත් සමහර අවස්ථාවලදී විගණන සාක්ෂි අවප්‍රකාශයක් වෙනුවට කළමනාකාරිත්වය පක්ෂග්‍රාහී බවක් ඇඟවීම දෙසට සරලව දිගු කරයි.

අ135. කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂග්‍රාහීවීම්වල හැඟවීම් විගණකගේ අවදානම් තක්සේරු සහ සම්බන්ධිත ප්‍රතිචාර යෝග්‍ය ලෙසම පවතිනවාද යන්න පිළිබඳව විගණකගේ නිගමනවලට බලපෑ හැකිය. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වයේ විනිශ්චයන්ගේ යෝග්‍යතාව තවදුරටත් වන ප්‍රශ්න කිරීමේ අවශ්‍යතාවය ඇතුළුව, විගණනයේ වෙනත් අංග සඳහා හැඟවෙන දෑ සැළකිල්ලට ගැනීමේදී විගණකට එලෙසම අවශ්‍ය විය හැකිය. කළමනාකාරිත්වයේ විය හැකි පක්ෂග්‍රාහීවීම්වලට තවදුරටත් වන සූචක, ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත)[55] හි සාකච්ඡා කළ පරිදි මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත්කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොර දැයි යන විගණකගේ නිගමනයට බලපෑ හැකිය.

අ136. වංචාව නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් නියෝජනය කළ හැකි සිදුවිය හැකි පක්ෂග්‍රාහීවීමක් ඉඟි කෙරේ. මූල්‍ය ප්‍රකාශයක ඇතුළත් කර ඇති ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වයේ විනිශ්චයක් සහ තීරණ විගණක අගය කළ යුතුය යන්න ශ්‍රීලවිප්‍ර 240[56] ව්‍යවහාර කිරීම තුළ ඊට අමතරව අවශ්‍ය කෙරේ. වංචනික මූල්‍ය වාර්තාකරණය බොහෝවිට සම්පූර්ණ කරගන්නේ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට හිතාමතා කළ අවප්‍රකාශ මගිනි. එයට ඇතුළත් විය හැක්කේ හිතාමතා ගිණුම්කරණ ඇස්තමේන්තු අඩුවෙන් හෝ වැඩියෙන් සටහන් කිරීම මගින් වියහැකි කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහිවීම් හි හැඟවීම් එසේම වංචා අවදානම් සාධක විය හැකිය. විශේෂයෙන්ම වංචා අවදානම් තක්සේරුව සහ සම්බන්ධිත ප්‍රතිචාර තවදුරටත් යෝග්‍යව පවතීද යන්න, විගණකගේ අවදානම් තක්සේරුව විගණකට යලි තක්සේරු කළ යුතුද යන්නට හේතු විය හැකිය.

**ඉටුකළ සමස්ථ විගණන ක්‍රියාපටිපාටි මත පදනම්ව සමස්ථ අගයකිරීම** (යොමුව : 33 ඡේදය)

අ137. විගණක සැලසුම් කළ විගණන ක්‍රියාපටිපාටි ඉටුකරන නිසා ලබාගත් විගණන සාක්ෂි වෙනත් සැලසුම් කළ විගණන පටිපාටිවල ප්‍රමාණයට කාල නිර්ණය හෝ ස්වභාවය විගණකට වෙනස් කිරීමට හේතු විය හැකිය.[57] ගිණුම්කරණ ඇස්තමේන්ත්වලට සම්බන්ධ අවදානම් තක්සේරුව පදනම් කළ එම තොරතුරුවලින් සැළකිය යුතු අන්දමින් වෙනස් විගණන සාක්ෂි ලබාගැනීමට ක්‍රියාපටිපාටි ඉටුකිරීම මගින් විගණකගේ අවධානයට තොරතුරු ලැබිය හැකිය. උදාහරණ ලෙස ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම සඳහා එකම හේතුව ලෙස, ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී සම්බන්ධිත වූ පුද්ගලගතභාවය විගණක හඳුනා ගත හැකිය. කෙසේ වෙතත්, ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම්වලට ප්‍රතිචාර දැක්වීමට ක්‍රියාපටිපාටි ඉටු කිරීමේදී ගිණුම්කරණ ඇස්තමේන්තු මුලින් අදහස් කළාට වඩා වැඩිපුර ලෙස සංකීර්ණ බව විගණක සොයාගත හැකිය. එය ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම තක්සේරු කිරීම ප්‍රශ්න කිරීමට හේතුවිය හැකි (උදාහරණ ලෙස සංකීර්ණතාවයේ බලපෑම නිසා ආවේණික අවදානමේ ප්‍රේක්ෂාවලියේ ඉහළ අන්තය මත ආවේණික අවදානම යළි තක්සේරු කිරීම අවශ්‍ය විය හැකිය) සහ එබැවින් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට තවදුරටත් වන අතිරේක විගණන ක්‍රියාපටිපාටි විගණකට ඉටු කිරීමට සිදු වේ.[58]

අ138. හඳුනා නොගත් ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිතව, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ හඳුනා ගැනීමේ නිර්නායක ඇත්ත වශයෙන්ම ඉටු වූවාද යන්න විගණකගේ ඇගයීමේ විශේෂ අවධානය විය හැකිය. ගිණුම්කරණ ඇස්තමේන්තු හඳුනා නොගෙන ඇති අවස්ථාවක සහ මෙම සැළකිල්ල යෝග්‍ය බව විගණක නිගමනය කළවිට සමහර මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු මගින් සැළකිල්ලට ගතයුතු තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශවලට සටහන් ලෙස හෙළිදරව් කිරීම අවශ්‍ය කෙරේ.

55 ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත) 11 වන ඡේදය
56 ශ්‍රීලවිප්‍ර 240 - 33(ආ) ඡේදය.
57 ශ්‍රීලවිප්‍ර 330, - අ60 ඡේදය
58 ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) 31 වන ඡේදය එසේම බලන්න.

ගිණුම්කරණ ඇස්තමේන්තු සාධාරණද හෝ අවප්‍රකාශ වී ඇත්ද යන්න නිර්ණය කිරීම (යොමුව : 9, 35 ඡේද)

අ139. ඉටුකළ විගණන පටිපාටි මත පදනම්ව සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් සාධාරණ ද හෝ අවප්‍රකාශ වී ඇත්ද යන්න නිර්ණය කිරීමේදී:

- විගණන සාක්ෂි පරාසයකට සහාය වන, පරාසයේ ප්‍රමාණය පුළුල් වියහැකි සහ සමහර තත්ත්වයන්හිදී වන මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත්කළ ප්‍රමාණාත්මකභාවය සඳහා ගුණිතයක් විය හැකිවන විට (අ125 ඡේදය එලෙසම බලන්න). පවතින තත්ත්වයන් තුළ පුළුල් පරාසයක් යෝග්‍ය විය හැකි වූවත් පරාසය තුළ වටිනාකම්වල සාධාරණත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගත්තේ ද යන්න යළි සලකා බැලීම සඳහා විගණකට වැදගත් විය හැකි බව එය ඉඟි කළ හැකිය.
- කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවෙන් වෙනස් වන කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවක් විගණන සාක්ෂිවලට සහාය විය හැකිය. එවැනි තත්ත්වයන්හිදී විගණකයේ කරුණ හැඟවීම් ඇස්තමේන්තුව සහ කළමනාකාරිත්වයේ කරුණ හැඟවීම් ඇස්තමේන්තුව අතර වෙනස අවප්‍රකාශයක් ස්ථාපනය වේ.
- කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුවේ ඇතුළත් විය හැකි පරාසයක් විගණන සාක්ෂිවලට සහාය විය හැකිය. එවැනි තත්ත්වයන්හිදී අවප්‍රකාශය වනුයේ කළමනාකාරිත්වයේ කරුණ හැඟවීම් ඇස්තමේන්තුව සහ විගණකගේ පරාසයේ ආසන්න කරුණ හැඟවීම් අතර වෙනසය.

අ140. කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම් සහ මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් කළයුතු සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට විගණකට ඇගයීම්වල සහායවීමට මග පෙන්වීම් අ110-අ114 ඡේදවල ලබාදෙයි.

අ141. විගණකගේ තවදුරටත් වන විගණන පටිපාටිවලට විගණකගේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය සංවර්ධනය කළේ හෝ කළමනාකාරිත්වය ගිණුම්කරණ ඇස්තමේන්තු කළේ කෙසේද යන්න පරීක්ෂා කිරීම ඇතුළත් වනවිට 26(ආ) සහ 29(ආ) ඡේද සමග අනුකූලව ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය විස්තර කරන හෙළිදරව් කිරීම පිළිබඳව සහ 31 වන ඡේදය සමග අනුකූලව වෙනත් හෙළිදරව් කිරීම ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට විගණකට අවශ්‍ය කෙරේ. විගණක එවිට සැළකිල්ලට ගන්නේ, සමස්ථ අගය කිරීමේ කොටසක් ලෙස හෙළිදරව් කිරීම් පිළිබඳ ලබාගත් විගණන සාක්ෂි 35 වන ඡේදය සමග අනුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ සාධාරණ ද හෝ අවප්‍රකාශ වී ඇත්ද යන්නය.

අ142. ගුණාත්මක හෙළිදරව් කිරීම්[59] සම්බන්ධයෙන් සහ හෙළිදරව් කිරීම් තුළ වන අවප්‍රකාශ අඟවන වංචාවක්[60] විය හැකි වනවිට මගපෙන්වීම් ශ්‍රීලවිප්‍ර 450 එසේම ලබාදෙයි.

අ143. සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කළවිට, මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීම[61] එලෙසම අත්කර ගන්නේද යන විගණකගේ ඇගයීමට ඇතුළත් වන්නේ මූල්‍ය ප්‍රකාශවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ සම්බන්ධිත සටහන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගන්නා ආකාරයට ගනුදෙනු සහ සිද්ධීන් නියෝජනය වන්නේද යන වගය. උදාහරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු ඉහළ ප්‍රමාණයක ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයන් යටත් වනවිට, සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගැනීමට අතිරේක හෙළිදරව් කිරීම අවශ්‍ය කරන බව විගණක නිර්ණය කළ හැකිය. එවැනි අතිරේක හෙළිදරව් කිරීම් කළමනාකාරිත්වය ඇතුළත් නොකළහොත්, මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වී ඇතැයි විගණක නිගමනය කළ හැකිය.

අ144. උදාහරණ වශයෙන් ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයට සම්බන්ධය ඇතුළුව මූල්‍ය ප්‍රකාශ තුළ කළමනාකාරිත්වයේ හෙළිදරව් කිරීමේ ප්‍රමාණවත් නොවන හෝ නොමග යවනසුළුබව විගණක විශ්වාස කරනවිට විගණකගේ මතය සඳහා හඟවන දෑ මත මගපෙන්වීම් ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත)[62] ලබාදෙයි.

---

59 ශ්‍රීලවිප්‍ර 450, අ17 ඡේදය.

60 ශ්‍රීලවිප්‍ර 450, අ22 ඡේදය.

61 ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත) 14 ඡේදය

62 ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) 22-23 ඡේද.

**ලිඛිත නියෝජන වීම්** (යොමුව ඃ 37 වන ඡේදය)

අ145. නිශ්චිත ගිණුම්කරණ ඇස්තමේන්තු පිළිබඳ ලිඛිත නියෝජන ඇතුළත් විය හැකි නියෝජන වන්නේඃ

- කළමනාකාරිත්වය දැනුවත් සියලු අදාළ තොරතුරු සැළකිල්ලට ගත් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී සිදුකළ සැලකිය යුතු අන්දමේ විනිශ්චයන්.
- කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී භාවිත කළ ක්‍රම, උපකල්පන සහ භාවිත කළ දත්ත තෝරා ගැනීම හෝ ව්‍යවහාරකරණය පිළිබඳ සංගතභාවය සහ යෝග්‍යතාවය.
- අස්තිත්ත්වය වෙනුවෙන් අදාළ වනවිට, ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සහ හෙළිදරව් කිරීම්වලට නිශ්චිත ක්‍රියාමාර්ගයක් ගැනීමට කළමනාකාරිත්වයේ අභිප්‍රාය සහ හැකියාව උපකල්පනවලින් යෝග්‍ය පරිදි පිළිබිඹු වන්නේද.
- ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය විස්තර කරමින් හෙළිදරව් කිරීම් ඇතුළත් ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත එම හෙළිදරව් කිරීම්, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ සම්පූර්ණ සහ සාධාරණ ද.
- ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ යෝග්‍ය විශේෂඥ කුසලතා හෝ වෙසෙසියාව ව්‍යවහාර කර ඇත්ද.
- මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කර ඇති ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට පසුව සිදුවන සිදුවීම් වලින් ගැළපීම් අවශ්‍ය නොකෙරේ.
- මූල්‍ය ප්‍රකාශවල ගිණුම්කරණ ඇස්තමේන්තු හඳුනාගෙන නොමැති හෝ හෙළිදරව් කර නොමැතිවිට, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ හඳුනා ගැනීම් හෝ හෙළිදරව් කිරීම් නිර්ණායක ඉටු නොකිරීම පිළිබඳව කළමනාකාරිත්වයේ තීරණයේ යෝග්‍යතාවය.

**පාලනය පිළිබඳ වගකිවයුතු අය, කළමනාකාරිත්වය හෝ වෙනත් අදාළ පාර්ශව සමග සන්නිවේදනය** (යොමුව ඃ 38 වන ඡේදය)

අ146. ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) ව්‍යවහාර කිරීමේදී විගණක අස්තිත්ත්වයේ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට සම්බන්ධ ගිණුම්කරන පරිචයන්හි සැලකිය යුතු ගුණාත්මක අංග පිළිබඳ විගණකගේ අදහස් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කෙරේ.[63] පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග විගණක සන්නිවේදනය කිරීමට සැළකිල්ලට ගන්නා ගිණුම්කරණ ඇස්තමේන්තුවලට විශේෂිත වූ කරුණු 2 වන පරිශිෂ්ඨයේ ඇතුළත් වේ.

අ147. විගණනය තුළදී හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු ඌණතාවයන් පාලනය පිළිබඳ වගකිව යුතු අයට ලිඛිතව සන්නිවේදනය කිරීමට ශ්‍රීලවිප්‍ර 265 මගින් විගණකට අවශ්‍ය කෙරේ.[64] එවැනි සැලකිය යුතු අන්දමේ ඌණතාවයන්ට ඇතුළත් විය හැක්කේ පහත පාලන මත සම්බන්ධිත දේ වේඃ

(අ) වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ ව්‍යවහාර කිරීම සහ ක්‍රම උපකල්පන සහ දත්ත තෝරා ගැනීම සහ ව්‍යවහාර කිරීම;

(ආ) අවදානම් කළමනාකරණය සහ සම්බන්ධිත පද්ධති;

(ඇ) බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ඇතුළුව දත්ත ලබාගන්නා විට දත්තවල අවංකභාවය; සහ

(ඈ) බාහිර සැපයුම්කරුවෙකුගෙන් ලබාගත් ආදර්ශ ඇතුළුව, ආදර්ශ භාවිතය සංවර්ධනය කිරීම සහ වලංගුකරණය අවශ්‍ය විය හැකි යම් ගැලපීම්.

අ148. පාලනය පිළිබඳව වගකිව යුතු අය සමග සන්නිවේදනය කරනවාට අමතරව, විගණකට නියාමකයන් හෝ විචක්ෂණයෙන් යුත් අධීක්ෂකවරු සමග ඍජුව සන්නිවේදනය කිරීම අවසර දිය හැකි හෝ අවශ්‍ය විය හැකිය. එවැනි සන්නිවේදනයක් විගණනය පුරාවට හෝ එක්තරා අවස්ථාවක විගණනය සැලසුම් කිරීමේදී හෝ විගණකගේ වාර්තාව අවසන් කිරීමේ වැනි අවස්ථාවලදී ප්‍රයෝජනවත් විය හැකිය. උදාහරණ ලෙස සමහර අධිකරණ බල ප්‍රදේශ තුළ මූල්‍ය ආයතන නියාමකයින් මූල්‍ය සාධන පත්‍ර මත පාලන මෙහෙයුම් සහ යෙදුම් මෙහෙයුම් අක්‍රිය වෙළඳපොළවල මූල්‍ය සාධන පත්‍ර අගය කිරීමේදී වන අභියෝග, අපේක්ෂිත ණයහානි සහ රක්ෂණ සංචිත පිළිබඳ තොරතුරු විගණක සමග හුවමාරු කර ගැනීමට සහයෝගයෙන් කටයුතු කිරීමට සොයා බලන අතර වෙනත් නියාමකයන් අස්තිත්ත්වයේ පිරිවැය ඇස්තමේන්තු ඇතුළුව

[63] ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) 16(අ) ඡේදය
[64] ශ්‍රීලවිප්‍ර 265, 9 වන ඡේදය

අස්තිත්ත්වය වැදගත් අංගවල මෙහෙයුම් මත විගණකගේ අදහස් අවබෝධ කර ගැනීමට සොයා බලයි. මෙම සන්නිවේදන ප්‍රමාණවත් අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීමට තක්සේරු කිරීම සහ ප්‍රතිචාර දැක්වීමට විගණකට උපකාරී විය හැකිය.

**ලේඛණගත කිරීම** (යොමුව : 39 ඡේදය)

අ149. අස්තිත්ත්වයේ අවදානම් තක්සේරුව සහ තක්සේරු කළ අවදානමට ප්‍රතිචාර විගණකගේ අවබෝධ කර ගැනීම මත අවශ්‍යතාවයන් සහ මග පෙන්වීම් ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත)[65] සහ ශ්‍රීලවිප්‍ර 330[66] ලබාදෙයි. මෙම මගපෙන්වීම් පදනම් වී ඇත්තේ ශ්‍රීලවිප්‍ර 230[67] අවශ්‍යතාවයන් සහ මගපෙන්වීම් යටතේය. ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය කිරීම සම්බන්ධයෙන් අස්තිත්ත්වය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත එහි පරිසරයේ විගණකගේ අවබෝධය ප්‍රධාන මූලිකාංග පිළිබඳ විගණන ලේඛණගත කිරීමට විගණක පිළියෙළ කිරීම අවශ්‍ය කෙරේ. මෙයට අමතරව ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් පිළිබඳ විගණකගේ විනිශ්චයන් සහ විගණකගේ ප්‍රතිචාර බොහෝ දුරට සහායවන පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය ලේඛණගත කිරීම් මගින් තවදුරටත් සහාය විය හැකිය.

අ150. ශ්‍රීලවිප්‍ර 330 සමග අනුකූලව සැදහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම සමග විගණකගේ තවදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි යා කිරීම ලේඛණගත කිරීමේදී, සැදහුම් මට්මේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානමට දී ඇති හේතු විගණක සැළකිල්ලට ගැනීම මෙම ශ්‍රීලවිප්‍රයෙන් අවශ්‍ය කරේ. එම හේතු එකක් හෝ ඊට වැඩි ගණනක් ආවේණික අවදානම් සාධකවලට හෝ පාලන අවදානමේ විගණකගේ තක්සේරුවට සම්බන්ධ විය හැකිය. කෙසේ වෙතත්, සෑම ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීමේදී සෑම ආවේණික අවදානම් සාධකයක්ම සැළකිල්ලට ගන්නේ කෙසේද යන්න විගණක ලේඛණගත කිරීම අවශ්‍ය නොවේ.

අ151. විගණක එසේම ලේඛණගත කිරීමට සැලකිය හැකි දෑඃ

- සංකීර්ණ ආදර්ශකරණයක් සම්බන්ධිත ක්‍රමයක් කළමනාකාරිත්වය යෙදවීමේ කළමනාකාරිත්වයේ විනිශ්චය සංගතව යෙදවූයේ ද සහ අදාළවන විට, ආදර්ශයේ සැලසුම් කිරීම අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ මැනීමේ අරමුණු ඉටුවනවාද.
- ක්‍රම සැලකිය යුතු අන්දමේ උපකල්පන හෝ දත්ත තෝරා ගැනීමේදී හා යෙදවීමේදී සංකීර්ණතාවය මගින් ඉහළ මට්ටමක බලපාන විට, ලබාගත් විගණන සාක්ෂි අගය කිරීමට හෝ එම අවදානම්වලට ප්‍රතිචාර ලෙස ක්‍රියාපටිපාටි සැලසුම් කිරීමට හෝ ඉටු කිරීම අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි ඉටු කිරීමට විශේෂඥ නිපුණතාවය හෝ දැනුම අවශ්‍යදැයි නිර්ණය කිරීමේ විගණකගේ විනිශ්චය මෙවැනි තත්ත්වයන්හිදී අවශ්‍යකරන කුසලතාවය හෝ දැනුම කෙසේ යොදවන්නේ ද යන්න එලෙසම ලේඛණගත කිරීම් තුළ ඇතුළත් කළ යුතුය.

අ152. විගණකගේ වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිත කිරීම කුමන ආකාරයකින් ලේඛණ ගත කළ යුතුද යන්නට තනි ක්‍රමයක් තිබිය නොහැකි බව ශ්‍රීලවිප්‍ර 230, අ7 ඡේදය අවධානයට ලක් කළ වුවත්, විගණන ලේඛණගත කිරීම කෙසේ වුවත් විගණකගේ වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිත කිරීමේ සාක්ෂි ලබා දෙයි. උදාහරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධයෙන් විගණන සාක්ෂි ලබාගත්විට එයට කළමනාකාරිත්වයේ සැදහුම් තහවුරු කෙරෙන පරස්පර වන යන දෙකේම සාක්ෂි ඇතුළත් වනවිට, ලබාගත් විගණන සාක්ෂිවල ප්‍රමාණවත්භාවය සහ යෝග්‍යතාවය පිළිබඳ නිගමනයක් සකස් කිරීමේදී භාවිත කළ වෘත්තීය විනිශ්චය ඇතුළුව සාක්ෂි විගණක කෙසේ අගය කළේද යන්න ලේඛණගත කිරීම් වල ඇතුළත් විය හැකිය. විගණක විසින් වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිත කිරීම සඳහා සාක්ෂි ලබාදිය හැකි ලේඛණගත කිරීම් සඳහා මෙම ශ්‍රීලවිප්‍රයේ වෙනත් අවශ්‍යතාවයන් සඳහා උදාහරණවලට ඇතුළත් වන්නේඃ

- ගිණුම්කරණ ඇස්තමේන්තුවල විගණකගේ ස්වකීය අපේක්ෂාවන් සංවර්ධනය කිරීම් අවබෝධය විගණක ව්‍යවහාර කළේ කෙසේද එම හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කිරීමට කළමනාකාරිත්වය විසින් පිළියෙළ කළ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශවල එම අපේක්ෂාවන් සමග සන්සන්දනය කළේ කෙසේද සම්බන්ධයෙන් 13(ඈ) ඡේදය;

---

65 ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත), 32 සහ අ152-අ155 ඡේද
66 ශ්‍රීලවිප්‍ර 330, 28 සහ අ63 ඡේද
67 ශ්‍රීලවිප්‍ර 230, 8(ඈ) ඡේදය

- තහවුරු කළ හැකි හෝ පරස්පර වියහැකි විගණන සාක්ෂි බැහැර කරන දෙසට වන පක්ෂග්‍රාහී නොවන දෙසට විගණන සාක්ෂි ලබාගැනීමේ ආකාරයට ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබාගැනීමට සැලසුම් කර ඉටු කළයුතු තවදුරටත් වන විගණන පටිපාටි අවශ්‍යකරන 18 වන ඡේදය.
- වියහැකි කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී වීම් අඟවන දෑ අමතන 23 (ආ), 24(ආ), 25(ආ) සහ 32 වන ඡේද; සහ
- තහවුරු කෙරෙන හෝ පරස්පර වන වූවත්, සියලු අදාළ විගණන සාක්ෂි විගණකගේ සැළකිල්ලක් දැක්වීම අමතන 34 වන ඡේදය.

## 1 වන පරිශිෂ්ඨය

(යොමුව 2, 4, 12(ඇ), අ8, අ66)

### ආවේණික අවදානම් සාධක

### හැඳින්වීම

1. සැඳහුම් මට්ටමේදී ගිණුම්කරණ ඇස්තමේන්තුවකට සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට ප්‍රමාණාත්මක අවප්‍රකාශයක්, හඳුනා ගැනීමේදී, තක්සේරු කිරීමේ සහ ප්‍රතිචාර දැක්වීමේදී, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ කුමන ප්‍රමාණයකට ගිණුම්කරණ ඇස්තමේන්තුවක් යටත්ද සහ ක්‍රම තෝරා ගැනීම සහ යෙදවීම, ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී භාවිත කළ උපකල්පන හා දත්ත සහ කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුල් කිරීම සඳහා වන හෙළිදරව් කිරීම් සංකීර්ණභාවය පුද්ගලගතභාවය හෝ වෙනත් ආවේණික අවදානම් සාධක මගින් කොපමණ ප්‍රමාණයකට බලපාන්නේද යන්න විගණක සැළකිල්ලට ගැනිම මෙම ශ්‍රීලවිප්‍රය මගින් විගණකට අවශ්‍ය කෙරේ.
2. පාලන සැළකිල්ලට ගැනීමට පෙර, ගිණුම්කරණ ඇස්තමේන්තුවකට සම්බන්ධිත ආවේණික අවදානම යනු ගිණුම්කරණ ඇස්තමේන්තුවක් පිළිබඳ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක සැඳහුමකට නැඹුරු වීමයි. ආවේණික අවදානම් තුළින් ප්‍රතිඵලයක්වන ආවේණික අවදානම යෝග්‍ය ආකාරයට සිදුකරන ගිණුම් ඇස්තමේන්තුවලට අභියෝගයක් හට ගැන්විය හැකිය. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේ සම්බන්ධය තුළ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කිරීම සඳහා සම්බන්ධිත හෙළිදරව් කිරීම් සහ කළමනාකාරිත්වයේ කරුණ හැඟවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයේ ආවේණික අවදානම් සාධකවල ස්වභාවය පුද්ගලගතභාවය සහ සංකීර්ණභාවය සහ ඒවායේ අන්තර් සම්බන්ධතාවය පිළිබඳ අමතර පැහැදිලි කිරීම් මෙම පරිශිෂ්ඨය ලබාදෙයි.

### මැනීමේ පදනම්

3. මූල්‍ය ප්‍රකාශ අයිතම තත්ත්වයන් සහ කරුණක් මැනීමේ පදනම සහ ස්වභාවය අදාළ අගය කිරීමේ උපලක්ෂණ හටගන්වයි. අයිතමයක පිරිවැය හෝ මිල ඍජුව නිරීක්ෂණය කළ නොහැකි විට යෝග්‍ය ක්‍රමයක් ව්‍යවහාර කරමින් සහ යෝග්‍ය දත්ත සහ උපකල්පන භාවිත කරමින් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සිදුකිරීම අවශ්‍ය කෙරේ. ක්‍රමය අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් නිශ්චය කළහැකි හෝ මැනීමේ පදනම මත අයිතමයේ පිරිවැය හෝ මිල බලපෑමට අපේක්ෂා කළහැකි අදාළ අගය කිරීමේ උපකල්පණ පිළිබඳ දැනුම කෙසේ ලබාගත හැකිද යන්න පිළිබිඹුවීමට කළමනාකාරිත්වය විසින් තෝරා ගත හැකිය.

### ඇස්තමේන්තු කිරීමේ අනියතතා

4. මැණීම තුළදී නිරවද්‍යතාවයේ අඩුකමට නැඹුරුවීම බොහෝවිට ගිණුම්කරණ ආකෘතිමය රාමු තුළ මැනීමේ අනියතතාවය ලෙස හැඳින්වේ. ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය මෙම ශ්‍රීලවිප්‍රයේ නිර්වචනය කරන්නේ මැනීම තුළ නිරවද්‍යතාවය අඩු ආවේණික බවට නැඹුරු වීම ලෙසය. එය පැනනගින්නේ මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගත් හෝ හෙළිදරව් කළ අවශ්‍ය කරන මූල්‍ය ප්‍රකාශයක් සඳහා අවශ්‍යකරන මූල්‍ය වටිනාකම ඍජු නිරීක්ෂණ මගින් හෝ පිරිවැය හෝ මිල මගින් නිරවද්‍යතාවය සහිතව මැනීමට නොහැකි විටය. ඍජු නිරීක්ෂණ කළ නොහැකිවිට ඊළඟට වඩාත් නිරවද්‍ය විකල්ප මැනීමේ ක්‍රමෝපාය වන්නේ, අදාළ මැනීමේ උප ලක්ෂණ පිළිබඳ නිරීක්ෂණය කළ හැකි දත්ත භාවිත කරමින් අදාළ මැනීමේ පදනම මත අයිතමය සඳහා පිරිවැය හෝ මිල පිළිබඳ ලබාගත හැකි දැනුම පිළිබිඹු වන ක්‍රමයක් ව්‍යවහාර කිරීමය.
5. කෙසේ වෙතත් එවැනි දැනුමක් හෝ දත්ත ලබාගත හැකි බව මත ඇති සීමාකිරීම් හෝ මැනීමේ ක්‍රියාවලිය තුළට එවැනි යෙදවුම් සත්‍යාපනය කිරීම සීමා වේ සහ එබැවින් මැනීමේ ප්‍රතිඵල වන නිරවද්‍යතාවය සීමා වේ. ඒ ඇරත්, බොහෝ ගිණුම්කරණ ආකෘතිමය රාමු සැළකිල්ලට ගත යුතු තොරතුරු මත ප්‍රායෝගික සීමා

කිරීම් ඇතිබව පිළිගනී. එය ලබාගැනීමේ වන පිරිවැය ප්‍රතිලාභ අභිබවා යා හැකි වැනි අවස්ථාවන්. මෙම සීමා කිරීම් වලින් පැන නගින මැනීමේ නිරවද්‍යතාවයේ අඩුකම එය මැනීමේ ක්‍රියාවලියේ ඉවත් කිරීමට බැරිවීම නිසා එය ආවේණික වේ. ඒ අනුව එවැනි සීමා කිරීම් ඇස්තමේන්තු කිරීමේ අනියතතාවලට මූලාශ්‍ර වේ. මැණීමේ ක්‍රියාවලිය තුළදී සිදුවිය හැකි මැනීමේ අනියතතාවයේ වෙනත් මූලාශ්‍ර වනුයේ අවම වශයෙන් මූලධර්මයක් වශයෙන් යෝග්‍ය පරිදි ක්‍රමය ව්‍යවහාර කළහොත් ඉවත් කළහැකි සහ එබැවින් ඒවා ඇස්තමේන්තු කිරීමේ අනියතතා වෙනුවට විය හැකි අවප්‍රකාශ වේ.

6. පාදකවන වත්කම හෝ වගකීමෙහි ප්‍රතිඵල වන අවසාන ආර්ථික ප්‍රතිලාභ අනියතතා අනාගත ගලාඒම් සහ ගලායාම්වලට ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය සම්බන්ධ වනවිට මෙම ගැලීම්වල ප්‍රතිඵල නිරීක්ෂණය කළ හැකි වන්නේ, මූල්‍ය ප්‍රකාශ දිනයෙන් පසුව පමණක් වේ. මූල්‍ය ප්‍රකාශ අයිතමයක අදාළ මැනීමේ පදනමේ සහ ඒවා භාවිත කරන තත්ත්වය පදනම ද මෙම ප්‍රතිඵලය මූල්‍ය ප්‍රකාශ අවසන් කිරීමට පෙර ඍජුව නිරීක්ෂණය කළ හැකි හෝ ඍජුව නිරීක්ෂණය කළ හැක්කේ පසුව වන දිනකය. සමහර ගිණුම්කරණ ඇස්තමේන්තුවල ඇත්ත වශයෙන්ම ඍජුව නිරීක්ෂණය කළ හැකි ප්‍රතිඵලයක් ඇත්තේම නැත.

7. තනි අයිතමයක් සඳහා ඉහළ මට්ටමක නිරවද්‍යතාවයක් සහිතව සමහර අයිතමවල අනියත ප්‍රතිඵලය පුරෝකථනය කිරීම සාපේක්ෂව පහසුය. උදාහරණ ලෙස නිෂ්පාදන යන්ත්‍රයක සාමාන්‍ය ප්‍රයෝජ්‍ය ජීවිත කාලය පිළිබඳ ප්‍රමාණවත් කාර්මික තොරතුරු ලබාගත හැකිනම් එහි ප්‍රයෝජ්‍ය ජීවිත කාලය පහසුවෙන් පුරෝකථනය කළ හැකි වේ. අනාගත ප්‍රතිඵලය පුරෝකථන කිරීම අපහසු වනවිට එවැනි තනි පුද්ගලයෙකුගේ අපේක්ෂාකරන ජීවිත කාලය ආයු ගණක උපකල්පන පදනම මත සාධාරණ නිරවද්‍යතාවයකින් තවදුරටත් පුද්ගලයන් සමූහයක ප්‍රතිඵලය ඉහළ නිරවද්‍යතාවයක් සහිතව පුරෝකථනය කළ හැකිය. සමහර අවස්ථාවලදී මැනීමේ පදනම් සමහර විට මැනීමේ අරමුණු සඳහා අදාළ ගිණුම් ඒකක ලෙස කළඹක මට්ටම ලෙස ඇඟවේ. එය ආවේණික ඇස්තමේන්තු කිරීමේ අනියතතා අඩු කළ හැකිය.

**සංකීර්ණතාවය**

8. සංකීර්ණතාවය (එනම් පාලන සැළකිල්ලට ගැනීමට පෙර ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලිය තුළදී සංකීර්ණතාවය ආවේණික වේ) ආවේණික අවදානම හට ගන්වයි. පහත සඳහන් වනවිට ආවේණික සංකීර්ණතාවය පැනනැගිය හැකියඃ
   - බොහෝවිට රේඛීය නොවන සම්බන්ධතා ඒවා අතර ඇති බොහෝ මැනීමේ උපලක්ෂණ තිබෙනවිට.
   - එකක් හෝ ඊට වැඩි ගණනක උපලක්ෂණ සඳහා යෝග්‍ය වටිනාකම් නිර්ණය කිරීම බහුආංගික දත්ත කට්ටල අවශ්‍ය වීම.
   - ගිණුම්කරණ ඇස්තමේන්තුව කිරීම සඳහා බොහෝ උපකල්පන අවශ්‍ය වීම හෝ අවශ්‍යකරණ උපකල්පන අතර සහසම්බන්ධතාවයන් තිබෙන විට.
   - භාවිත කළ දත්ත හඳුනා ගැනීමට ග්‍රහණය කිරීමට, පිවිසීමට හෝ අවබෝධ කරගැනීම ආවේණිකව අපහසු වේ.

9. සංකීර්ණතාවය සම්බන්ධ විය හැක්කේ ක්‍රමය සහ ආගණනීය ක්‍රියාවලිය හෝ එය ව්‍යවහාර කිරීම භාවිත කළ ආදර්ශයේ සංකීර්ණතාවයටය. උදාහරණ ලෙස ආදර්ශය තුළ සංකීර්ණතාවයෙන් පිළිබිඹු විය හැක්කේ සම්භාව්‍යතා පදනම් අගය කිරීමේ සංකල්පය හෝ ශිල්ප ක්‍රම, විකල්ප මිල කිරීමේ සමීකරණ අනියත අනාගත ප්‍රතිඵල පුරෝකථනය කිරීමට විඩම්බන ශිල්පක්‍රම හෝ වෛකල්පිත චර්යාවන් ව්‍යවහාර කිරීම අවශ්‍ය වේ. ඒ හා සමානව ආගණනීය ක්‍රියාවලිය බහු ආංගික මූලාශ්‍ර හෝ බහු ආංගික දත්ත කට්ටල වලින් දත්ත උපකල්පන කිරීමට සහාය වීමට හෝ අසංකලිෂ්ඨ ගණිතමය හෝ සංඛ්‍යා ලේඛණාත්මක සංකල්ප ව්‍යවහාර කිරීමට අවශ්‍ය විය හැකිය.

10. සංකීර්ණතාවය විශාල වනවිට බොහෝදුරට කළමනාකාරිත්වයට විශේෂඥ කුසලතාවය හෝ දැනුම ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී ව්‍යවහාර කිරීමට අවශ්‍ය කළමනාකාරිත්වයේ විශේෂඥයෙකු සේවයේ යෙදවීම අවශ්‍ය කෙරේ. උදාහරණ ලෙස පහත දැට සම්බන්ධිතවඃ
   - මැණීමේ පදනම සම්බන්ධය තුළ භාවිත කළ හැකි අගය කිරීමේ සංකල්ප සහ ශිල්ප ක්‍රම සහ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අරමුණු සහ වෙනත් අවශ්‍යතාවයන් සහ එම සංකල්ප සහ ශිල්ප ක්‍රම ව්‍යවහාර කරන්නේ කෙසේද සඳහා;
   - ගිණුම්කරණ ඇස්තමේන්තු කරණු ලබන මූල්‍ය ප්‍රකාශවල අයිතමයන්හි මැනීමේ පදනම ස්වභාවය කරුණු සහ තත්ත්වයන්හි ස්වභාවය අදාළ වියහැකි පාදක වන අගය කිරීමේ උපලක්ෂණ; හෝ
   - අභ්‍යන්තර මූලාශ්‍රවලින් යෝග්‍ය මූලාශ්‍රවල දත්ත හඳුනා ගැනීම (පොදු හෝ උපයෝගී ලෙජර්වලින් බාහිර මූලාශ්‍ර හඳුනා ගනිමින්) හෝ බාහිර තොරතුරු මූලාශ්‍රවලින් දත්ත ලබා ගැනීමේදී විය හැකි

දුෂ්කරතා කෙසේ අමතන්නේ ද යන්න නිර්ණය කරමින් හෝ එම දත්තවල අදාළත්වය සහ විශ්වාසදායකත්වය අවබෝධ කර ගනිමින් හෝ ක්‍රම ව්‍යවහාර කිරීමේදී එවැනි මූලාශ්‍රවල අවංකභාවය පවත්වාගෙන යාම.

11. දත්තවලට සම්බන්ධිත සංකීර්ණතාවය පැනනැගිය හැක්කේ උදාහරණ ලෙස පහත තත්ත්වයන් තුළදීය:

(අ) දත්ත ලබාගැනීමට අපහසු හෝ එය සාමාන්‍යයෙන් ප්‍රවේශ්‍යතාවය නොමැති ගනුදෙනුවලට එය සම්බන්ධ වනවිට එවැනි දත්තවලට ප්‍රවේශ්‍යතාවය ඇතිවිට දී පවා උදාහරණ ලෙස, බාහිර තොරතුරු මූලාශ්‍රයකින්, බාහිර තොරතුරු මූලාශ්‍රය එය භාවිත කළ පාදකවන දත්ත මූලාශ්‍රය පිළිබඳ ප්‍රමාණවත් සහ ඉටුකළ යම් දත්ත සැකසීමක් පිළිබඳව තොරතුරු හෙළිදරව් කරන්නේ නම් මිස දත්තවල අදාළත්වය සහ විශ්වාසදායකත්වය සැළකිල්ලට ගැනීම අපහසු විය හැකිය.

(ආ) උපකල්පනයක් සඳහා සහායවීමක් සංවර්ධනය කිරීමේදී අදාළ වියහැකි අනාගත තත්ත්වයක් හෝ සිද්ධියක් පිළිබඳ බාහිර තොරතුරු මූලාශ්‍රයක අදහස් දත්තවලින් පිළිබිඹුවනවිට එම අදහස් සංවර්ධනය කිරීමේදී සැළකිල්ලට ගත් තොරතුරුවල සහ තාර්කිකත්වය පිළිබඳ විනිවිදභාවය නොමැතිව එය අවබෝධ කර ගැනීමට අපහසු වේ.

(ඇ) නියත වර්ගවල දත්ත ආවේණිකව තේරුම් ගැනීමට අපහසු වනවිට එයට හේතු වන්නේ ඒවා අවබෝධ කරගැනීමේදී තාක්ෂණිකව සංකීර්ණ ව්‍යාපාරික හෝ නෛතික සංකල්ප එනම් සංකීර්ණ මූල්‍ය සාධන පත්‍ර හෝ රක්ෂණ නිෂ්පාදන සම්බන්ධ වන ගනුදෙනු පිළිබඳ නෛතික ගිවිසුම්වල කොන්දේසි සමන්විතවන දත්ත නිසි ලෙස අවබෝධ කරගැනීමට අවශ්‍ය වේ.

**පුද්ගලගතභාවය**

12. පුද්ගලගතභාවය (එනම් පාලන සැළකිල්ලට ගැනීමට පෙර ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේ ක්‍රියාවලියේදී පුද්ගලගතභාවය ආවේණික වේ). අගය කිරීමේ උපලක්ෂණ පිළිබඳ සාධාරණ ලෙස ලබාගත හැකි දත්ත හෝ දැනුම තුළ ආවේණික අවදානම පිළිබිඹු වේ. එවැනි සීමා කිරීම් පවතින විට විනිශ්චයන් කිරීම සඳහා අවශ්‍ය කරන මූලික පදනමක් ලබාදීම මගින් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව පුද්ගලගතභාවයේ ප්‍රමාණය අඩුකළ හැකිය. එවැනි අවශ්‍යතාවයන් විය හැක්කේ උදාහරණ ලෙස මැනීමට හෙළිදරව් කිරීම ගිණුම් ඒකකය හෝ පිරිවැය සීමා කිරීම් ව්‍යවහාර කිරීමට සම්බන්ධ ඉතා පැහැදිලි හෝ ව්‍යංග අරමුණු කට්ටලයක්. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව එලෙසම එවැනි විනිශ්චයන්ගේ වැදගත්කම එම විනිශ්චයන් පිළිබඳ හෙළිදරව් කිරීම් මගින් එසේම මතුකර දක්විය හැකිය.

13. පහත සඳහන් කරුණු කිහිපයක් හෝ සියල්ල නිර්ණය කිරීමේදී සාමාන්‍යයෙන් අවශ්‍ය කරන කළමනාකාරිත්වයේ විනිශ්චය වන බොහෝවිට පුද්ගලගතභාවයන් වන්නේ සම්බන්ධ වන්නේ:

- ලබාගත හැකි දැනුමට සැළකිල්ලක් දක්වමින් ඇස්තමේන්තු ක්‍රමය තුළ භාවිත කිරීමට යෝග්‍ය අගය කිරීමේ ප්‍රවේශයන්හි සංකල්ප, ශිල්ප ක්‍රම සහ සාධක අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු අවශ්‍යතාවයන් යටතේ නිශ්චය නොකර ඇති ප්‍රමාණය;
- විවිධ විභව්‍ය දත්ත මූලාශ්‍ර ඇතිවිට භාවිත කිරීමට යෝග්‍ය මූලාශ්‍රයේ නිරීක්ෂණය කළ හැකි අගය කිරීමේ උපලක්ෂණ වල ප්‍රමාණය;
- ලබාගත හැකි හොඳම දත්තවලට සැළකිල්ලක් දැක්වීමෙන් උදාහරණ ලෙස වෙළඳපොළ අදහස් ඇතුළුව යෝග්‍ය උපකල්පන හෝ උපකල්පන පරාසයක් කිරීමට නිරීක්ෂණය කළ නොහැකි අගය කිරීමේ උපලක්ෂණවල ප්‍රමාණය;
- සාධාරණව වියහැකි ප්‍රතිඵල පරාසයකින් කළමනාකාරිත්වය කරුණ හැගවීමේ ඇස්තමේන්තුව කුමක්දැයි තෝරා ගැනීමට සහ එම පරාසයේ නියත කරුණු අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය කරුණු මූලික මැනීමේ අරමුණු සමග සංගත වනු ඇතැයි සාපේක්ෂ වීමේ හැකියාව.
- කළමනාකාරිත්වයේ කරුණ හැගවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශ තුළ කළයුතු සම්බන්ධිත හෙළිදරව් කිරීම්.

14. අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් පිළිබඳ උපකල්පන කිරීමට විනිශ්චය භාවිත කිරීම සම්බන්ධ වේ. එම සිද්ධීන් හෝ තත්ත්වයන් කොපමණ ප්‍රමාණයකට අනියතද යන්න ඒවායේ අපහසුතාවය මත වෙනස් වේ. අනියත අනාගත සිද්ධි හෝ තත්ත්වයන්හි නිරවද්‍යාව පුරෝකථනය කිරීමේ හැකියාව රඳා පවතින්නේ අනියත තත්ත්වයන් සිද්ධීන් හෝ සම්බන්ධිත ප්‍රතිඵලවල දැනුම ඇතුළුව දැනටමත් එම සිද්ධීන් හෝ තත්ත්වයන්ගේ නිර්ණය කළ හැක්කේ කුමන ප්‍රමාණයකට ද යන්න මතය. ඉහත පැහැදිලි කළලෙස නිරවද්‍යතාවයේ අඩකට ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය දායක වේ.

15. අනාගත ප්‍රතිඵල සම්බන්ධයෙන් උපකල්පන කළ යුත්තේ ප්‍රතිඵල අනියත වන අංග සඳහා පමණක්ය. උදාහරණ ලෙස ශේෂ පත්‍ර දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දින විකුණූ බඩු සඳහා ලැබිය යුතු වටිනාකම සඳහා වියහැකි හානිකරණයක් මැනීමට වටිනාකම ඉතා පැහැදිලි ලෙස ස්ථාපනය කර තිබිය හැකි අතර සම්බන්ධිත ගනුදෙනු ලේඛණවල සෘජුව නිරීක්ෂණය කළ හැකිය. මෙහිදී හානිකරණය නිසා යම් හානියක් වේනම් අනියත විය හැක්කේ වටිනාකමයි. මෙම සිද්ධිය සම්බන්ධයෙන් උපකල්පන අවශ්‍ය විය හැක්කේ හානිය විය හැකි බව සහ එවැනි හානියක වටිනාකම සහ කාල නිර්ණය පිළිබඳවය.

16. කෙසේ වෙතත් වෙනත් සිද්ධීන් තුළ වත්කමකට සම්බන්ධිත හිමිකම්තුළ අන්තර්ගත කර ඇති මුදල් ප්‍රවාහවල වටිනාකම් අනියත විය හැකිය. එවැනි සිද්ධීන් හි උපකල්පන සිදු කළ යුත්තේ පාදක වන හිමිකම්වලට මුදල් ප්‍රවාහ වල වටිනාකම් සහ හානිකරණය නිසා විය හැකි හානි වටිනාකම් යන දෙක සඳහාය.

17. කළමනාකාරිත්වයට ප්‍රවර්තන උපනති සමග අනාගත සංවර්ධනයන් පිළිබඳ අපේක්ෂාවන් හා සමග එක්ව අතිත තත්ත්වයන් හා සිද්ධීන් පිළිබඳ තොරතුරු කළමනාකාරිත්වය සැළකිල්ලට ගැනීම අවශ්‍ය විය හැකිය. අතීත තත්ත්වයන් සහ සිද්ධීන් ඓතිහාසික තොරතුරු ලබාදේ. එය ඓතිහාසික රටාවන් නැවත නැවත සිදුවන දෑ මතුකර දක්විය හැකි අතර අනාගත ප්‍රතිඵල අගය කිරීමේදී එය බහිර්නිවේෂණය කළ හැකිය. එවැනි ඓතිහාසික තොරතුරු කාලසීමාවන් පුරා (චක්‍රීය හෝ උපනති) රටාවේ වෙනස්වන එවැනි හැසිරීම ද එලෙසම ඇඟවිය හැකිය. පාදකවන ඓතිහාසික රටාවන්හි හැසිරීම එක්තරා ප්‍රමාණයකට පුරෝකථනය කළ හැකි ආකාරයකට වෙනස් වෙමින් පවතින බව මෙය ඉඟිකළ හැකි අතර එහිද අනාගත ප්‍රතිඵල අගය කිරීමේදී එසේම බහිර්නිවේෂණය කළ හැකිය. ඓතිහාසික රටාවල්හි එවැනි හැසිරීමක් හෝ සම්බන්ධිත චක්‍ර හෝ උපනති වල වියහැකි වෙනස්වීම් අඟවන වෙනත් වර්ගවල තොරතුරු එලෙසම ලබාගත හැකිය. එවැනි තොරතුරු වල පුරෝකථ්‍ය වටිනාකම පිළිබඳ අසීරු විනිශ්චයන් අවශ්‍ය විය හැකිය.

18. ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී ගත් විනිශ්චයන්හි ප්‍රමාණය සහ ස්වභාවය (සම්බන්ධ වූ පුද්ගලගතභාවය ඇතුළුව) ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී උචිත කළමනාකාරිත්වයට අනුව ගතයුතු ක්‍රියා පිළිබඳ තීරණයක් ගැනීමේදී කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී වීම සඳහා අවස්ථාවක් ඇතිකරයි. එලෙසම ඉහළ මට්ටමේ සංකීර්ණතාවක් හෝ ඉහළ මට්ටමේ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයක් හෝ දෙකම ඇතිවිට අවදානමෙහි සහ කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහීවීම් සඳහා හෝ වංචාව සඳහා අවස්ථාව එසේම වැඩි විය හැකිය.

**පුද්ගලගතභාවයට සහ සංකීර්ණතාවයට ඇස්තමේන්තු කිරීමේ අනියතාවයේ සම්බන්ධතාවය**

19. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමට භාවිත කළ හැකි, වියහැකි ක්‍රම දත්ත මූලාශ්‍ර සහ උපකල්පනයන්හි ආවේණික විචලනය ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය හටගන්වයි. මෙය පුද්ගලගතභාවය හටගන්වන අතර සහ එබැවින් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් කිරීමේදී විනිශ්චය භාවිත කිරීම අවශ්‍යය. උපකල්පන සිදු කිරීමේදී සහ කළමනාකාරිත්වයේ කරුණ ඇස්තමේන්තුව සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් තෝරා ගැනීමේදී සහ මූල්‍ය ප්‍රකාශවල සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළත් කිරීමට යෝග්‍ය ක්‍රම සහ දත්ත මූලාශ්‍ර තෝරා ගැනීම තුළ එවැනි විනිශ්චයන් අවශ්‍ය වේ. මෙම විනිශ්චයන් කරන්නේ, හඳුනා ගැනීම, මැනීම ඉදිරිපත් කිරීම සහ අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුවේ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් සම්බන්ධය තුළය. කෙසේ වෙතත් මෙම විනිශ්චයන්ට සහාය වීමට දැනුමක් තොරතුරු ලබාගත හැකිබව සහ ප්‍රවේශය වීම මත සීමාවන් ඇති නිසා ඒවා ස්වභාවයෙන්ම පුද්ගලගත වේ.

20. එවැනි විනිශ්චයන් තුළ පුද්ගලගතභාවය ඒවා සිදු කිරීමේදී හිතාමතා නොකළ හෝ හිතාමතා කළ කළමනාකාරිත්වයේ පක්ෂග්‍රාහී වීම් සඳහා අවස්ථාවක් ඇති කරයි. මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් කිරීම සඳහා පිළියෙළ කරන තොරතුරු මධ්‍යස්ථ විය යුතු බව බොහෝ ගිණුම්කරණ ප්‍රමිතවලින් අවශ්‍ය කෙරේ. (එනම් පක්ෂග්‍රාහී නොවිය යුතුය) එම පක්ෂග්‍රාහී වීම අඩුතරමින් මූලික වශයෙන් ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියෙන් ඉවත් කළ හැකිය. පුද්ගලගතභාවය ඇමතීමට සිදුකළ විනිශ්චයන් තුළ වියහැකි පක්ෂග්‍රාහී බවේ මූලාශ්‍ර, ඇස්තමේන්තු කිරීමේ අනියතතාවලට වඩා වියහැකි අවප්‍රකාශවල මූලාශ්‍ර වේ.

21. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සිදුකිරීමට භාවිත කළහැකි ක්‍රම, දත්ත මූලාශ්‍ර සහ උපකල්පන තුළ වන ආවේණික විචලනය (19 වන ඡේදය බලන්න) එලෙසම වියහැකි මැනීමේ ප්‍රතිඵල තුළ විචලනයක් හටගැන්විය හැකිය. ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයකින් ප්‍රමාණයෙන් ඵලයක් වන සාධාරණ ලෙස විය හැකි මැනීමේ ප්‍රතිඵලවල පරාසයේ විශාලත්වය බොහෝවිට ගිණුම්කරණ ඇස්තමේන්තුවක සංවේදීතාවය ලෙස හඳුන්වයි. සාධාරණව වියහැකි මැනීමේ ප්‍රතිඵලවල (සංවේදීතා විශ්ලේෂණය ලෙස හඳුන්වන) පරාසය මත මැනීමේ ප්‍රතිඵල නිර්ණය කරනවාට අමතරව වියහැකි ක්‍රම දත්ත මූලාශ්‍ර සහ විකල්ප වල ආවේණික විචලනයේ බලපෑම විශ්ලේෂණය කිරීම ද ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියකට සම්බන්ධ වේ.

22. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සඳහා මූල්‍ය ප්‍රකාශයක් ඉදිරිත් කිරීමක් සංවර්ධනය කිරීම එනම් අදාළ මූල්‍ය ආකෘතිමය රාමුවෙන් අවශ්‍යකරන විට විශ්වාසදායක නියෝජනයක් අත්කර ගන්නා (එනම්, සම්පූර්ණ

මධ්‍යස්ථ සහ වැරදිවලින් තොර) සාධාරණ ලෙස වියහැකි මැනීමේ ප්‍රතිඵල වල පරාසයක් ඇතුළත යෝග්‍ය ලෙස තෝරා ගන්නා කළමනාකාරිත්වයේ කරුණ ඇගවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීමේ යෝග්‍ය විනිශ්චය සහ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය යෝග්‍ය පරිදි විස්තර කරන සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළත්වේ. මෙම කරුණ අමතන අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් තුළ ස්වභාවය මත රඳාපවතමින් මෙම විනිශ්චයන් මගින්ම අරමුණුගතභාවය සම්බන්ධ වේ. උදාහරණ ලෙස කළමනාකාරිත්වයේ කරුණ හැගවීමේ ඇස්තමේන්තුව තෝරා ගැනීම සඳහා (සම්භාව්‍යතා බැර තැබූ සාමාන්‍ය හෝ හොඳම ඇස්තමේන්තුව වැනි) අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවෙන් නිශ්චිත පදනමක් අවශ්‍ය කරවිය හැකිය. ඒ හා සමානව පවතින තත්ත්වයන් තුළ සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගැනීමට අවශ්‍ය නිශ්චය කරන ලද හෙළිදරව් කිරීම් හෝ නිශ්චය කරන ලද හෙළිදරව් කිරීමේ අරමුණු ඉටුවන හෙළිදරව් කිරීම් අවශ්‍ය විය හැකිය.

23. ඉහළ ප්‍රමාණයේ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයකට යටත් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් වුවත්, අඩු ප්‍රමාණයේ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවයකට යටත් වන එකකට වඩා අඩු නිරවද්‍යතාවයකින් මැනිය හැකිය. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය කරනවිට විශ්වාසදායකත්වයේ අයිතමයක නියෝජනය අත්කරගත හැකි වන්නේ නම් මූල්‍ය ප්‍රකාශ වල හඳුනා ගැනීමට මූල්‍ය ප්‍රකාශ පරිශීලකයන් සඳහා ගිණුම්කරණ ඇස්තමේන්තුව තවමත් ප්‍රමාණවත් අදාළත්වයක් තිබිය හැකිය. සමහර අවස්ථාවලදී ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය ඉතා විශාල බැවින් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවල හඳුනාගන්නා නිර්ණායකය ඉටු නොවීම නිසා සහ ගිණුම්කරණ ඇස්තමේන්තුව මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගත නොහැකිය. මෙවැනි තත්ත්වයන්හිදී පවා තවමත් අදාළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් තිබිය හැකිය. උදාහරණ ලෙස සාධාරණ ලෙස වියහැකි මැනීමේ ප්‍රතිඵල වලින් කරුණ හැගවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය හෙළිදරව් කිරීමට සහ අයිතමය හඳුනා ගැනීමේදී සීමා කිරීම් සහ හෙළිදරව් කිරීම. මෙවැනි තත්ත්වයන්හිදී අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමු ව්‍යවහාරවන අවශ්‍යතාවයන් විශාල හෝ අඩු ප්‍රමාණයෙන් නිශ්චය කළ විය හැකිය. ඒ අනුව මෙම තත්ත්වයන්හිදී අරමුණුගතභාවය සිදුකිරීමට සම්බන්ධ වන අතිරේක විනිශ්චයන් තිබිය හැකිය.

**2 වන පරිශිෂ්ඨය**

(යොමුව : අ146 ඡේදය)

### පාලනය පිළිබඳ වගකිවයුතු අය සමග සන්නිවේදනය

අස්තිත්වයේ ගිණුම්කරණ පරිචයන්ට සම්බන්ධිත ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල වැදගත් ගුණාත්මක අංගයන් පිළිබඳව විගණකගේ අදහස් සම්බන්ධයෙන් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කිරීමේදී විගණක සැලකිය යුතු කරුණුවලට ඇතුළත් වන්නේ:

(අ) ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් තුළ වෙනසක් සඳහා හෝ අවශ්‍යතාවයක් හට ගැන්වීමට වන තත්ත්වයන් ගනුදෙනු හෝ වෙනත් සිද්ධීන් ගනුදෙනු කළමනාකාරිත්වය හඳුනාගන්නේ කෙසේද?

(ආ) ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම්.

(ඇ) මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගිණුම්කරණ ඇස්තමේන්තුවක සාපේක්ෂ ප්‍රමාණාත්මකභාවය.

(ඈ) ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සමග ආශ්‍රිත අවදානම් සහ ස්වභාවය සහ ප්‍රමාණය සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ අවබෝධය (හෝ ඒ මත අඩුව).

(ඉ) කළමනාකාරිත්වය යෝග්‍ය විශේෂඥ කුසලතාවය හෝ දැනුම ව්‍යවහාර කර හෝ යෝග්‍ය ප්‍රවීණයන් සේවයේ නිරත කර ඇත්ද?

(ඊ) විගණකගේ කරුණ හැගවීමේ ඇස්තමේන්තුව හෝ පරාසය සහ කළමනාකාරිත්වයේ කරුණ හැගවීමේ ඇස්තමේන්තුව අතර වෙනස්කම් පිළිබඳව විගණකගේ අදහස්.

(උ) මූල්‍ය ප්‍රකාශවල ගිණුම්කරණ ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සම්බන්ධිත ගිණුම්කරන ප්‍රතිපත්ති තෝරා ගැනීමේ යෝග්‍යතාවය පිළිබඳ විගණකගේ අදහස්.

(ඌ) කළමනාකාරිත්වයේ වියහැකි පක්ෂග්‍රාහී වීම් පිළිබඳ හැගවීම්.

(එ) ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා ක්‍රම තුළ පූර්ව කාලපරිච්ඡේද වලින් වෙනස්වීම්වල යෝග්‍යතාවයක් හෝ වෙනස්වීම් සිදුකර තිබිනද?

(ඒ) ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා ක්‍රම තුළ පූර්ව කාලපරිච්ඡේදවලින් වෙනස්වීම් තිබුණ විට එසේ වූයේ කුමක් නිසාද සහ පූර්ව කාලපරිච්ඡේදවල ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිඵලය.

(ඔ) කළමනාකාරිත්වය විසින් ආදර්ශයක් භාවිත කිරීම ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ කළමනාකාරිත්වයේ ක්‍රම, අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ සහ වෙනත් අවශ්‍යතාවයක් ස්වභාවය තත්ත්වය මැනීමේ අරමුණු සම්බන්ධය තුළ යෝග්‍යද?

(ඕ) ගිණුම්කරණ ඇස්තමේන්තු තුළ භාවිත කල සැලකිය යුතු අන්දමේ උපකල්පන වල ප්‍රතිඵලය සහ ස්වභාවය සහ උපකල්පන සංවර්ධනය කිරීමේදී සම්බන්ධ වූ පුද්ගලගතභාවයේ ප්‍රමාණය.

(අඅ) සැලකිය යුතු අන්දමේ උපකල්පන සෑම එකක් සමග සහ භාවිත කළ වෙනත් ගිණුම්කරණ ඇස්තමේන්තු සමග හෝ අස්තිත්ත්වයේ ව්‍යාපාර කටයුතුවල වෙනත් ක්ෂේත්‍ර තුළ භාවිත කළ උපකල්පන සමග සංගත වේද.

(අආ) සැලකිය යුතු අන්දමේ උපකල්පනවලට යෝග්‍යත්වයට අදාළ හෝ අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ ව්‍යවහාරකරනය අදාළ වනවිට නිශ්චිත ක්‍රියාමාර්ගයක් ඉටුකිරීමට කළමනාකාරිත්වයට අභිප්‍රායක් ඇත්ද හෝ එසේ කිරීමට හැකියාව ඇත්ද?

(අඇ) විකල්ප උපකල්පන හෝ ප්‍රතිඵල කළමනාකාරිත්වය සැළකිල්ලට ගන්නේ කෙසේද සහ ඒවා ප්‍රතික්ෂේප කළේ කුමක් නිසාද හෝ ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේ දී ඇස්තමේන්තු කිරීමේ අනියතතා අන්වශයෙන් කළමනාකාරිත්වය ඇමතුවේ කෙසේද?

(අඈ) ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරීත්වය විසින් භාවිත කළ සැලකිය යුතු අන්දමේ දත්ත සහ උපකල්පන අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍ය වේද?

(අඉ) බාහිර තොරතුරු මූලාශ්‍රවලින් ලබාගත් තොරතුරු අදාළත්වය සහ විශ්වාසදායකත්වය.

(අඊ) කළමනාකාරිත්වය හෝ කළමනාකාරිත්වයේ විශේෂඥයෙක් විසින් ඉටුකළ අගය කිරීම් හෝ බාහිර තොරතුරු මූලාශ්‍රයකින් ලබාගත් දත්තවලට සම්බන්ධ ප්‍රමාණවත් හෝ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමේදී මුහුණදුන් සැලකිය යුතු අන්දමේ අපහසුතාවයන්.

(අඋ) අගය කිරීම් සම්බන්ධයෙන් විගණක හෝ කළමනාකාරිත්වය හෝ කළමනාකාරිත්වයේ විශේෂඥයා අතර විනිශ්චයක් තුළ සැලකිය යුතු අන්දමේ වෙනස්වීම්.

(අඌ) ගිණුම්කරණ ඇස්තමේන්තු සමග ආශ්‍රිත ඇස්තමේන්තු කිරීමේ අනියතතා ඇතුළුව මූල්‍ය ප්‍රකාශ තුළ හෙළිදරව් කිරීම අවශ්‍යකරන ප්‍රමාණාත්මක අවදානම් සහ නිරාවරණය වීම්හි අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශ මත වියහැකි බලපෑම්.

(අඑ) මූල්‍ය ප්‍රකාශ තුළ ඇස්තමේන්තු කිරීමේ අනියතතාවය පිළිබඳ හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය.

(අඒ) හඳුනා ගැනීම මැනීම, ඉදිරිපත් කිරීම සහ ගිණුම්කරණ ඇස්තමේන්තු හෙළිදරව් කිරීම්හි සම්බන්ධිත කළමනාකාරිත්වයේ තීරණ සහ මූල්‍ය ප්‍රකාශවල සම්බන්ධිත හෙළිදරව් කිරීම් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමග අනුකූල වේද.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.